වාර්ෂික කාර්ය සාධන වාර්තාව 2014

ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය

පටුන

පිටු අංකය

01.	හැඳින්වීම		03-04
02.	ජාතික භාෂා සහ සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවල ව්‍යුහය		05-08
03.	ජාතික භාෂා සහ සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය යටතේ ඇති අංශ හා ඒවායේ ප්‍රගතිය		09-71
	03.1	ජාතික භාෂා අංශය	10-21
	03.2	සමාජ ඒකාබද්ධතා සහ ජනවාර්ගික කටයුතු අංශය	22-30
	03.3	ආයතන(පාලන) අංශය	31
	03.4	සැලසුම් අංශය	31-32
	03.5	ගිණුම් අංශය	32
	03.6	අභ්‍යන්තර විගණන අංශය	33
04.	රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව සහ එහි ප්‍රගතිය		34-42
05.	රාජ්‍ය භාෂා කොමිසම සහ එහි ප්‍රගතිය		43-55
06.	ජාතික භාෂා අධ්‍යාපන හා පුහුණු ආයතනය සහ එහි ප්‍රගතිය		56-71
07.	ජාතික භාෂා ව්‍යාපෘතිය		72-74
08.	සමාජ ඒකාබද්ධතා සහ පරිවර්ථන පහසුකරණය ව්‍යාපෘතිය GIZ - FLICT		75-76
09.	ශ්‍රී ලංකාවේ නීතිය සවිමත් කිරිම සහ බලාත්මක කිරිම ,යුක්තිය හා සමාජ ඒකාබද්ධතා ප්‍රවේශය ව්‍යාපෘතිය		77-79
10.	මුදල් වෙන් කිරිම		80-92
11.	අත්තිකාරම් ගිණුම		93-94
12.	සමාලෝචනය		95-96

01. හැඳින්වීම

01. හැඳින්වීම

ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය අංක 1681/3 සහ 2010.11.22 දිනැති අති විශේෂ ගැසට් නිවේදනය මගින් ස්ථාපිත කරන ලදි. අමාත්‍යාංශ කටයුතු මෙහෙයවීමට වාසුදේව නානායක්කාර මැතිතුමා ගරු ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යවරයා ලෙසද ,පලනි තිගම්බරම් මැතිතුමා ගරු ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා නියෝජ්‍ය අමාත්‍යවරයා ලෙස ද එම්. එස්. වික්‍රමසිංහ මිය අමාත්‍යාංශ ලේකම් ලෙස පත් කරන ලදි.මෙම අමාත්‍යාංශය අංක40,බුත්ගමුවපාර, රාජගිරිය යන ස්ථානයේ පිහිටා ඇත.

දැක්ම

විවිධත්වයේ එකමුතුව ශක්තියක් වූ ද්විභාෂාවෙන් හෘදයාංගමව බැඳුණු සියළු ජන සංස්කෘතික අනන්‍ය තාවයන් සුරකින සමගි සම්පන්න ශ්‍රී ලාංකීය ජාතියක්

මෙහෙවර

සෑම ජන කොට්ඨාසයකගේම අයිතීන් තහවුරු වන්නාවූත්, එකිනෙකාට ගරු කරන්නාවූත් සමාජ ඒකාබද්ධතාව සහිත සංවර්ධිත ත්‍රෛභාෂා සමාජයක් නිර්මාණය කිරීම සඳහා ප්‍රතිපත්ති සම්පාදනය, මග පෙන්වීම සහ පහසුකම් සැලසීම සහ ඊට අදාළ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.

ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශයේ බලතල හා කාර්යයන්

- ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතාවය පිළිබද,සැලසුම්,වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම.
- අදාල අරමුණු සපුරා ගැනීම සඳහා ජාතික සැලසුම් බලධාරීන් සමග එකගත්වයට පැමිණි කාල සීමාව හා අයවැයගත සම්පත් ප්‍රමාණය තුළ ඉහත ප්‍රතිපත්ති ,වැඩසටහන් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම හා මෙහෙයවීම.
- ජාතික භාෂා ප්‍රතිපත්ති සම්පාදනය හා ක්‍රියාත්මක කිරීමට අදාල කටයුතු.
- සමාජ ඒකාබද්ධතාවය සහ ජනවාර්ගික කටයුතු.

උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසමේ නිර්දේශ හා ජාතික මානව හිමිකම් ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කරන අමාත්‍යාංශයක් ලෙස ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය හැඳින්විය හැක.

02.ජාතික භාෂා සහ සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවල ව්‍යුහය

ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය
දු/ක ඃ 011 2883926 - 28
විද්‍යුත් තැපැල
admin@lanintegmin.gov.lk
වෙබ් අඩවිය

සබරගමු පළාත් මධ්‍යස්ථානය කුරුවිට , රත්නපුර

දු/ක - 0452262777
ෆැක්ස් - 045 2264552

උතුරු පළාත් මධ්‍යස්ථානයතිරුනගර්, කිලිනොච්චිය

දු/ක - 021 2283660
ෆැක්ස් - 021 2283656

ජාතික භාෂා අංශය
දු/ක 0112883713
විද්‍යුත් තැපැල
addlsecnl@lanintegmin.gov.lk
ෆැක්ස් - 011 2883714

සමාජ ඒකාබද්ධතා ජනවාර්ගික කටයුතු අංශය
දු/ක 011 2865942
විද්‍යුත් තැපැල
Hazeem.mnlsi@gmail.com
ෆැක්ස් - 011 28**83785**

පාලන අංශය
දු/ක 011 2883782
විද්‍යුත් තැපැල
sasad@lanintegmin.gov.lk
ෆැක්ස් - 011 288**3784**

සැලසුම් අංශය
දු/ක 011 2886796
විද්‍යුත් තැපැල
planningdv@hotmail.com
planningmnlsi@yahoo.com
ෆැක්ස් - 011 28**86797**

ගිණුම් අංශය
දු/ක 011 2883935
විද්‍යුත් තැපැල
imprestnlsi@gmail.com
ෆැක්ස් - 011 288**3938**

අභ්‍යන්තර විගණක අංශය
දු/ක 011 2501949

ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය යටතේ පවතින ආයතන

රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව
දු/ක 011 2888934
විද්‍යුත් තැපැල
- comol@sltnet.lk
ෆැක්ස්- 0112888928

රාජ්‍ය භාෂා කොමිසම
දු/ක 011 2670829
විද්‍යුත් තැපැල
olc@sltnet.lk
ෆැක්ස් - 011 2670830

ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය
දු/ක 011 3092909
විද්‍යුත් තැපැල
nilet@sltnet.lk
ෆැක්ස් - 011 2665200

ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය යටතේ පවතින විදේශ ආධාර ව්‍යාපෘති



03. ජාතික භාෂා සහ සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය යටතේ ඇති අංශ හා ඒවායේ ප්‍රගතිය

03. 1 භාෂා අංශය

හැඳින්වීම

ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය 2010.11.22 දිනැති හා අංක 1681/03 දිනැති අති විශේෂ ගැසට් නිවේදනය මගින් ස්ථාපිත කරන ලද්දේ රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම උදෙසා ප්‍රතිපත්ති, වැඩසටහන් සම්පාදනය කිරීම හා ක්‍රමෝපායන් සම්පාදනය කිරීමේ මූලික අරමුණ පෙරදැරිව ය. ශ්‍රී ලංකාවේ රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට අදාල වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය හා අවැසි ප්‍රතිපත්තිමය තීරණ ගැනීමේ වාතාවරණය සකස් කිරීම උදෙසා සුබදායී පියවරක් ඉදිරියට තබමින් අමාත්‍යාංශය 2010 වර්ෂයේදී භාෂා අංශය ස්ථාපිත කරන ලදී.

භාෂා අංශයේ වැඩසටහන් සැලසුම් කිරීමේදී මූලිකව සලකා බලන ලද කරුණු අතර පහතින් දැක්වෙන දෑ ඉතා වැදගත් වේ.

- උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභා නිර්දේශ මගින් රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට අදාලව ඇති නිර්දේශ ක්‍රියාත්මක කිරීම.
- මානව හිමිකම් සුරැකීමේ ජාතික ප්‍රතිපත්තියට අදාල රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට අදාලව දක්වා ඇති නිර්දේශ ක්‍රියාත්මක කිරීම.
- ත්‍රෛභාෂා ශ්‍රී ලංකා දස අවුරුදු සැලැස්මට අදාල අමාත්‍යාංශ විෂය පථයට ගැනෙන නිර්දේශ ක්‍රියාත්මක කිරීම.
- රජයේ නිලධාරීන්ගේ භාෂා ප්‍රවීණතාවය ලබා ගැනීමට අදාලව ඉදිරිපත් කර ඇති නිලධාරී කමිටු වාර්තා නිර්දේශ ක්‍රියාත්මක කිරීම.

2014 වසරේ දී භාෂා අංශය ප්‍රධාන ඉලක්කයන් 04 ක් යටතේ සිය වැඩසටහන් මෙහෙයවා ඇත. එනම්,

1. ජාතික භාෂා සංවර්ධන වැඩසටහන
2. ත්‍රෛභාෂා ශ්‍රී ලංකා වැඩසටහන
3. ද්වි භාෂා ජනතා ක්‍රියාකාරීත්වය වැඩසටහන
4. ජාතික භාෂා ව්‍යාපෘතිය සමග එක්ව සිදු කරන ලද වැඩසටහන්

ක්‍රියාකාරි සැලැස්මට අනුව කාර්යසාධනය

භාෂා අංශයේ මූල්‍ය ප්‍රගතිය



අනු අංකය	විස්තරය	ඇස්මේන්තුගත වියදම (රුපි.)	සත්‍ය වියදම (රුපි.)	ප්‍රතිශතය
01	ජාතික භාෂා සංවර්ධන වැඩසටහන	5,000,000.00	3,511,943.00	70.23%
02	ත්‍රෛභාෂා ශ්‍රී ලංකා වැඩසටහන	20,000,000.00	13,764,361.00	68.82%
03	ද්වි භාෂා ජනතා ක්‍රියාකාරීත්වය වැඩසටහන	30,000,000.00	29,465,000.00	98.21%
	එකතුව	**55,000,000.00**	**46,741,304.00**	**84.98%**

1.ජාතික භාෂා සංවර්ධන වැඩසටහන

1.1 පොලිස් නිලධාරීන් රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිළිබඳ දැනුවත් කිරීමේ සංවාදාත්මක වැඩමුළු පැවැත්වීම

මහජනතාවට වඩාත් සුහදශීලි සේවයක් ලබා දීම උදෙසා රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ වැදගත්කම පිළිබඳව පොලිස් නිලධාරීන් දැනුවත් කිරීම 2014 වසරේ සිට ආරම්භ කරන ලදී.

ඒ අනුව මේ වන විට බස්නාහිර, මධ්‍යම, දකුණ සහ නැගෙනහිර පළාත් නියෝජනය කරන පොලිස් ස්ථාන වල ප්‍රධාන නිලධාරීන් උදෙසා මෙම වැඩ මුළු සංවිධානය කරන ලදී. ප්‍රධාන දේශනය මානව හිමිකම්කොමිෂන් සභාවේ කොමසාරිස්, ආචාර්ය ප්‍රතිභා මහනාමහේවා මහතාගේ සම්පත්දායකත්වයෙන් සිදු කරනලදි.

ඔහු විසින් ඒ ඒ පළාත්වල පොලිස් සේවාවවන්ට අදාළව සිද්ධි අධ්‍යයන සහ ප්‍රායෝගික ගැටළු මතු කරමින් දේශන කටයුතු පැවැත්වීම විශේෂත්වයකි. එමගින් අදාළ ප්‍රදේශ වල රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේදී ඇති වන ගැටළු හඳුනා ගනිමින් ඒ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට මෙම අමාත්‍යාංශය සමත් වී ඇත.

1.2 ද්වීභාෂා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල සහ අනෙකුත් ප්‍රදේශීය ලේකම් කාර්යාල වල රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් විමර්ශන වැඩමුළු පැවැත්වීම

රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ ගැටළු අවම කිරීම සහ එහි ඵලදායීතාවය වැඩි දියුණු කිරීම අරමුණු කරගෙන ආරම්භ කරන ලද වැඩසටහනක් ලෙස මෙය හැඳින්විය හැක. ඒ අනුව ද්වීභාෂා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල සහ අනෙකුත් ප්‍රදේශීය ලේකම් කාර්යාල වල රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් විමර්ශන වැඩමුළු 24 ක් පැවැත්වීමට සැලසුම් කරන ලදී. ගරු අමාත්‍ය වාසුදේව නානායක්කාර මැතිතුමාගේ සහ ලේකම්තුමිය විසින් සිදු කරන ලද මග පෙන්වීම යටතේ විමර්ශන වැඩමුළු අධීක්ෂණය කිරීම සඳහා අධික්ෂණ කමිටුවක් පත් කිරීම සිදු විය.

ඒ අනුව 2014.08.21 දින විමර්ශන අධීක්ෂණ කමිටුව වත්තල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් රාජ්‍ය ආයතන 11 ක් සහ 2014.09.19 දින මීගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශයේ පිහිටි රජයේ කාර්යාල 11 ක් ද විමර්ශනය කිරීම සිදු කරන ලදී. තව ද 2014.10.31 දින කළුතර ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශයේ රජයේ කාර්යාල 09 ක් සහ 2014.11.10,17,21,24 සහ 28 යන දිනවලදී කළුතර, කෑගල්ල දිස්ත්‍රික්ක සහ හම්බන්තොට දිස්ත්‍රික්ක වල පිහිටි රජයේ කාර්යාල 55 විමර්ශනය සිදු කිරීම කර ඇත. ඉන්පසු 2014.11.28 දින මාවනැල්ල ප්‍රාදේශීය බල ප්‍රදේශයේ රජයේ ආයතන 07 ක් සහ 2104.12.05 දින කෑගල්ල ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශයේ රජයේ ආයතන 11 ක් විමර්ශනය කිරීම සිදු විය. 2104.12.11 දින මාතලේ සහ උකුවෙල ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශ වලට අයත් පිළිවෙලින් රජයේ ආයතන 10 ක් සහ 06 ක් විමර්ශනය කිරීම

සිදු විය. විමර්ශන වැඩසටහන් වලට අදාල වාර්තා සකස් කර ඇත.

1.3 පළාත් පාලන නියෝජිතයින් රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් දැනුවත් කිරීම

රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් රජයේ සේවකයින්, සාමාන්‍ය ජනතාව පමණක් නොව මහජන නියෝජිතයින් ද දැනුවත් කිරීමේ අවශ්‍යතාව අවබෝධ කර ගත් මෙම අමාත්‍යාංශය ඒ සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් රාශියක් දියත් කර ඇත. ඒ අනුව 2013 වසරේ දී සබරගමු පළාත් පාලන නියෝජිතයින් ද 2014 වසරේ දී වයඹ සහ ඌව පළාත් සභාවන් ආවරණය කරමින් වැඩසටහන් පැවැත්වීමට මෙම අමාත්‍යාංශය සමත් වී ඇත. ඒ අනුව රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිළිබඳ රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීම ද 2014.10.10 දින බදුල්ල, පස්සර කළමණාකරණ පුහුණු ආයතනයේ දී ඌව පළාත් සභා රාජ්‍ය නිලධාරීන් සඳහා සාර්ථකව පවත්වන ලදී. ඌව පළාත් සභාවේ රජයේ ආයතන වල රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදවා ඇති නිලධාරීන් 125 ක් මෙම වැඩසටහන සඳහා සහභාගි විය

1.4 රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමසම්බන්ධයෙන් සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩල වල නිලධාරීන් දැනුවත් කිරීමේ සංවාදාත්මක වැඩමුළු පැවැත්වීම

රජයේ නිලධාරීන්ගේ රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය වැඩි දියුණු කිරීමට අදාළ නිර්දේශ ඇතුළත් නිලධාරි කමිටු වාර්තාව අනුව නිකුත් කරන ලද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 සහ කළමණාකරණ සේවා චක්‍රලේඛ 04/2014 අනුව සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩල වල නිලධාරීන් සඳහා රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් සිදු කිරීමේ මූලික පරමාර්ථය ලෙස රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට අදාළව සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩල වල නිලධාරීන් ගේ දැනුවත්භාවය වැඩි දියුණු කිරීම දැක්විය හැක.

ඒ යටතේ 2014.11.28 දින සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යාංශයේ යටතේ ඇති පාරිභෝගික සේවා අධිකාරිය සහ අනෙකුත් සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩල වල නිලධාරීන් 100 ක් දැනුවත් කිරීම සිදු කරන ලද අතර නිලධාරීන් 100 ක් පමණ මෙම අවස්ථාව සඳහා සහභාගි විය. තවද රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය හා අදාළ නෛතික ප්‍රතිපාදන පිළිබඳ දැනුවත් කිරීම ආචාර්ය ප්‍රතිභා මහානාමහේවා මහතා විසින් සිදු කරන ලදී. අමාත්‍යාංශයට අයත් රේඛීය ආයතන වල කාර්ය භාරය සහ රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ දී අදාල ආයතන වලට බලපාන ගැටලු සාකච්ඡා කිරීම සිදු කර ඇත.

1.5 දැයට කිරුළ සංවර්ධන වැඩසටහනට සමගාමීව සිදු කරන ක්‍රියාකාරකම්

රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිළිබඳ පාසල් සිසුන් ඇතුලු සාමාන්‍ය මහජනයාගේ අවබෝධය පුළුල් කිරීම මෙම වැඩසටහනේ පරමාර්ථය විය. ඒ අනුව 2014/2015 දැයට කිරුළ ජාතික සංවර්ධන ප්‍රදර්ශනයට සමගාමීව සිදු කළ වැඩසටහන් පහත වගුවේ දැක්වේ.

කාල සීමාව	පාසල් ගණන	සිසුන් ගණන
2014.01.06 සිට2014.02.10 දක්වා	03	860
2014.10.10 සිට 2014 11.19 දක්වා	07	1005

2014 දැයට කිරුළ ප්‍රදර්ශනයට සමගාමීව කෑගල්ල දිස්ත්‍රික් පාසල් පුස්තකාලවලට පොත් කට්ටල බෙදා දීම සිදු කර ඇත.

දැනුම මිණුම තරගයට අවශ්‍ය ප්‍රශ්නමාලා සකස් කිරීම සිදු කර ඇත.

කැගල්ල දිස්ත්‍රික්කයේ පාසල් 10 ක පුස්තකාල පොත් කට්ටල බෙදාදීමට අදාළ වියදම් ලබා දී ඇත. දැයට කිරුළ ප්‍රදර්ශනයේ දී දැනුම මිනුම තරගයට සහභාගි වූ ජයග්‍රාහී සිසුන් හට ශබ්ද කෝෂ ලබා දීම සිදු කරන ලදී. 2015 දැයට කිරුළ ප්‍රදර්ශනයට සමගාමීව සියළුම පාසල් වල පුස්තකාල සඳහා සිංහල, දමිළ සහ ඉංග්‍රීසි මාධ්‍ය පොත් කට්ටලය බැගින් ලබා දීමද සිදු කරන ලදී. තවද ත්‍රෛභාෂික ශබ්ද කෝෂ 750 ක් මිලදී ගැනීමට අදාල කටයුතු ද සිදු කරන ලදී.

1.6 අමාත්‍යාංශයීය පුවත් හසුන සම්පාදනය කිරීම

මෙම වැඩසටහනේ ප්‍රධාන පරමාර්ථය වූයේ අමාත්‍යාංශයේ කාර්යභාරය පිළිබඳවත් භාෂා ප්‍රතිපත්තිය හා සමාජ ඒකාබද්ධතා ප්‍රතිපත්තිය පිළිබඳවත් මහජනතාවගේ දැනුවත්භාවය වැඩි දියුණු කිරීමය. ඒ අනුව 2014 වසර තුළදී ප්‍රකාශන වාර 04 ක් නිකුත් කිරීමට නියමිතව තිබූ අතර මේ දක්වා ප්‍රකාශන 02 ක් නිකුත් කර අවසන් කර ඇත.

2. ත්‍රෛභාෂා ශ්‍රී ලංකා වැඩසටහන

2.1 ජනමාධ්‍ය ඔස්සේ ජාතික භාෂාවන් ප්‍රවර්ධනය කිරීම

ගුවන්විදුලි ශ්‍රාවකයින් අමාත්‍යාංශයේ කාර්යභරය පිළිබඳවත් භාෂා ප්‍රතිපත්තිය හා සමාජ ඒකාබද්ධතා ප්‍රතිපත්තිය පිළිබඳවත් දැනුවත් කිරීම මෙම වැඩසටහනේ මූලික අරමුණ වේ. ඒ අනුව සිංහල සහ දමිළ භාෂාවන්ගෙන් ප්‍රචාරය වන ගුවන්විදුලි වැඩසටහන ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ වෙළඳ සේවයේ සහ තෙන්ඩ්‍රල් එෆ් එම් ඔස්සේ ප්‍රචාරය වේ (සෑම ඉරිදා දිනකම පෙ. ව. 10.30 සිට 11.00 දක්වා ප්‍රචාරය වේ). මේ වන විට වැඩසටහන් 52 ක් ප්‍රචාරය කර ඇති අතර සෑම බදාදා දිනකම අමාත්‍යාංශයේ දී ප්‍රචාරය කරවීමට අදාල කටයුතු සිදු කරනු ලබයි.

2.1 දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල ද්වී භාෂා සේවා පහසුකරන කවුළු ඇති කිරීම

රාජ්‍ය ආයතන වලින් මහජනතාවට තමා කැමති භාෂාවෙන් සේවා ලබා ගැනීමේ කාර්යය වඩාත් පහසු කරනු පිණිස වසර 2012 සිට ද්වීභාෂා සහන කවුළු ස්ථාපිත කිරීම ආරම්භ කර ඇත. ඒ යටතේ මේ වන විට ස්ථාපිත කර ඇති ද්වී භාෂා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 72 හි පිහිටා ඇති ප්‍රාදේශීය ලේකම් කාර්යාල 72 හි ද්වී භාෂා සහන කවුළු ස්ථාපිත කිරීම මෙම අමාත්‍යාංශය මගින් සිදු කර ඇත.

මහජනයාට වඩාත් ඵලදායීසේවාවක් සලසනු වස් මෙම ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලට මෙම අමාත්‍යාංශයට අනුයුක්ත ක්ෂේත්‍ර නිලධාරීන් යොමු කර ඇත. වසර 2013 දී මෙම කාර්යයේ තවත් පියවරක් ඉදිරියට තබමින් දිස්ත්‍රික් ලේකම් කාර්යාල 19 ක් සහන කවුළු ස්ථාපිත කිරීමද මේ වන විට සාර්ථකව නිමා කර ඇත. 2014 වසරේ දී ද්වීභාෂා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 06 ක් සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාල 08 ක සහන කවුළු ස්ථාපිත කිරීමට සැලසුම් කරන ලදී. ඒ අනුව වවුනියාව, මොණරාගල, කළුතර, මන්නාරම, නුවරඑළිය, මහනුවර කඩවත්සතර, රත්නපුර,

ලාහුගල, මාතර, මුලතිව්, කෑගල්ල, කුරුණෑගල යන දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල සහන කවුළු වලට උපකරණ සඳහා ප්‍රතිපාදන ලබා දී ඇත. කිලිනොච්චිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහන කවුළුව සඳහා ප්‍රතිපාදන ලබා දීම සිදු කර ඇත.

2.3 රාජ්‍ය සේවය ද්වීභාෂාකරණය

රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට අදාළව රාජ්‍ය සේවය බලාත්මක කිරීම උදෙසා 2009.11.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2009 රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා වගකීම පැවරීම සිදුකර

ඇත. එමගින් සෑම රජයේ ආයතනයකම ප්‍රධාන රාජ්‍ය භාෂා ක්‍රියාත්මක කිරීමේ නිලධාරියා සහ රාජ්‍ය භාෂා ක්‍රියාත්මක කිරීමේ නිලධාරියා වෙත තම ආයතනයේ රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට අදාළව පූර්ණ වගකීම පැවරී ඇත. තවද 2010.09.01 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2010 මගින් රාජ්‍ය ආයතන වල ලිපි ගනුදෙනු කිරීමේදී අනුගමනය කළ යුතු විධිවිධාන හා දිරි දීමනා පිළිබඳ තොරතුරු දක්වා ඇත.



මෙමගින් මහජනතාවට තමා කැමති භාෂාවෙන් සේවා ලබා ගැනීමට රාජ්‍ය සේවයට අවැසි පරිපාලනමය සැකැස්ම සකස් කිරීම සිදු කර ඇත. 2014.01.21 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 රජයේ නිලධාරීන් විසින් අත්කර ගතයුතු රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය සහ ඊට අනුශාංගික කරුණු සඳහන් කර ඇති අතර එමගින් සිංහල සහ දමිළ භාෂා දැන ගැනීම සහ සේවා සැපයීමේ වැදගත්කම අවධාරණය කර ඇත.

තවද රාජ්‍ය නිලධාරීන් විසින් අත්පත් කරගත යුතු රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය පිළිබඳ කරුණු අධ්‍යයනය කර නිර්දේශ ඉදිරිපත් කිරීමට අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද නිලධාරී කමිටු වාර්තාව මගින් නිර්දේශ 28 ක් සඳහන් කර ඇත. මෙම සියලූ කරුණු එක්ව ගත් කල රාජ්‍ය සේවය ද්වීභාෂාකරණයට අදාළව මේ දක්වා රජය මගින් ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳ පැහැදිළි අවබෝධයක් ලබා ගත හැක.

රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සහ සමාජ ඒකාබද්ධතාවය පිළිබඳ අමාත්‍යාංශ සතු වගකීම සම්බන්ධ රැස්වීම 2014.09.01 දින අමාත්‍යාංශ ලේකම්වරුන්ගේ සහභාගීත්වයෙන් පැවැත්විණ. ප්‍රධාන ආරාධිතයා ලෙස ගරු අමාත්‍යතුමා සහභාගි විය. රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය, සමාජ ඒකාබද්ධතා ප්‍රතිපත්ති රාමුව, ජනවාර්ගික සුහදතාවය පිළිබඳ ඉදිරිපත් කිරීම් සිදු කරන ලදී. සාකච්ඡා වාරය ලේකම්තුමිය විසින් මෙහෙයවන ලද ලදී. අමාත්‍යාංශ ලේකම්වරුන් 40 ක් ඇතුළු ආරාධිතයින් 128 ක් සහභාගි වී ඇත. මේ සඳහා මූල්‍ය දායකත්වය FLICT ආයතනය විසින් දරණ ලදී.

3. ද්වීභාෂා ජනතා ක්‍රියාකාරීත්වය වැඩසටහන

3.1 භාෂා සංගම් ස්ථාපිත කිරීම

ද්වීභාෂාවෙන් හෘදයාංගමව බැඳුණු සමානාත්වය සපිරි එකම ශ්‍රී ලාංකේය ජාතියක් ගොඩනැංවීමේ මෙම අමාත්‍යාංශයේ දැක්ම පෙරදැරි කර ගනිමින් රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ අගය මහජනතව අතරට ගෙන යෑමේ වැඩසටහන් ලෙස භාෂා සංගම් ජාතික ව්‍යාපාරය සඳහන් කළ හැක. මෙම වැඩසටහන 2012 වසරේ සිට ආරම්භ කරන ලද අතර මේ දක්වා භාෂා සංගම් 2,428 දිවයින පුරා ස්ථාපිත කර ඇත. එයට සමගාමීව මහජනයා අතර සිංහල දමිළ භාෂා ඉගෙන ගැනීමේ හැකියාවන් වැඩිදියුණු කිරීම සහ ද්වී භාෂා ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් භාෂා පන්ති 206 ක් දිස්ත්‍රික්ක 25 ආවරණය වන අයුරින් මේ වන විට ස්ථාපිත කර ඇත. ඒ අනුව සාමාන්‍ය මහජනතාව තම ප්‍රදේශයන්හි රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය

ක්‍රියාත්මක කිරීමේ අගය සම්බන්ධයෙන් ලබා ගන්නා වූ වැටහීම සමාජ ඒකාබද්ධතාව ඇති කිරීමට මහත් පිටිවහලක් වනු ඇත.

භාෂා සංගම් ඔස්සේ සිදු කරන තවත් කාර්යයක් ලෙස දිවයිනේ විවිධ ප්‍රදේශ වල

ජාතික සමගිය, සහයෝගීතාවය සහ ඔවුනොවුන් අතර අවබෝධය ඇති කරලීමේ පරමාර්ථය ඇතුව විවිධ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම ද සිදු කරනු ලබති. එම ව්‍යාපෘති අතර සිංහල, දමිළ ජාතික උත්සව සංවිධානය කිරීම, තරුණ හුවමාරු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, භාෂා අවබෝධය තුළින් ස්වයං රැකියා සඳහා මං පාදාදීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම,

සිංහල ,දමිළ සුහදතාවය වැඩිදියුණු කිරීමේ සුහද කඳවුරු, භාෂා කඳවුරු පැවැත්වීම සඳහන් කළ හැක.

3.2 භාෂා සංගම් මූලප්‍රවාහය කිරීමේ යාන්ත්‍රණයක් සකස් කිරීම සහ භාෂා සංගම් එක්ව එය ක්‍රියාත්මක කිරීම

භාෂා සංගම් ක්‍රියාකාරීත්වයේ ඵලදායීතාවය වැඩිදියුණු කිරීම උදෙසා හඳුනා ගත් වැඩසටහනකි. ඒ අනුව 2014.04.21 ගරු අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් ප්‍රධාන රැස්වීම පවත්වන ලදී. අමාත්‍යාංශය,ජාතික භාෂා අධ්‍යාපන හා පුහුණු ආයතනය සහ මුදල් අමාත්‍යාංශය නියෝජනය කරමින් නිලධාරීන් සහභාගි විය. භාෂා සංගම් වල විකාශය, ගැටළු සහ ඉදිරි ක්‍රියාකාරකම් සාකච්ඡා කරන ලදී. භාෂා සංගම් මූලප්‍රවාහය කිරීමේ වැඩසටහන යටතේ භාෂා සංගම් ප්‍රාදේශීය සමුළු 2014.05.10 කුරුවිට, රත්නපුර, 2014.05.27, ඕපනායක, ගොඩකවෙල, 2014.05.30 බලංගොඩ යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල සාර්ථකව අවසන් කරන ලදී. 2014.07.11 තණමල්විල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී භාෂා සමුළුවක් ද පැවැත්විණ. තණමල්විල, බුත්තල, වැල්ලවාය යන ප්‍රදේශ වල භාෂා සංගම් නියෝජිතයින් සහභාගි විය. අදාල ප්‍රදේශයේ භාෂා සංගම් පිළිබඳ ගැටලු සාකච්ඡා කිරීම සිදු කරන ලදී. රත්නපුර දිස්ත්‍රික් භාෂා සංගම් පිළිබඳ ප්‍රගති සමාලෝචනය 2014.09.12 දින සිදු කරන ලදී. රත්නපුර සහ කැගල්ල දිස්ත්‍රික්ක වල භාෂා සංගම් පුහුණු ගුරුවරුන්, අමාත්‍යාංශ ක්ෂේත්‍ර නිලධාරීන් 35 ක් සහභාගි විය. 2014.10.14 දින ඇඹිලිපිටිය ප්‍රාදේශීය භාෂා සංගම් සමුළුව පවත්වන ලදී. සහභාගී වූ සාමාජිකයින් ගණන 70 කි. භාෂා සංගම් ගැටලූ හා ඉදිරි කටයුතු පිළිබඳ සාකච්ඡා කිරීම සිදු කරන ලදී. භාෂා සංගම් ප්‍රාදේශීය සමුළු වලින් ලබා ගත් සියලූම අදහස් සමාලෝචනය කර පළාත් මධ්‍යස්ථාන වල කළමණාකරණ සැලැස්ම සකස් කිරීමේදී උපයෝගී කර ගනු ඇත.

3.3 ජාතික භාෂාවන් සහ සමාජ ඒකාබද්ධතාවය ප්‍රවර්ධනය කිරීමට අදාල භාෂා සංගම් වලින් ඉදිරිපත් වන ව්‍යාපෘති වලට ප්‍රතිපාදන ලබා දීම

මෙම අමාත්‍යාංශයේ අරමුණු දීප ව්‍යාප්තව ක්‍රියාත්මක කිරීමට උපකාරී වන ව්‍යාපෘති බල ගැන්වීම මෙමගින් සිදු කෙරේ. සැලසුම් අවස්ථාවේ දී මේ සඳහා ව්‍යාපෘති 200 කට ආධාර ලබා දීමට එකගතාවය පළ කරන ලදී. ඒ අනුව රත්නපුර, ගම්පහ, බදුල්ල, නුවරඑළිය, පොළොන්නරුව සහ මහනුවර භාෂා සංගම් මගින් සංවිධානය කරන ලද තෛපොංගල් උත්සව සඳහා ප්‍රතිපාදන ලබා දීම ද කැළණිය භාෂා සංගම් එක්ව පැවැත්වූ දමිළ භාෂා එක් දින වැඩමුළුව සඳහා ප්‍රතිපාදන ලබා දීම සහ දිඹුලාගල වසන්ත උද්‍යානය පොළොන්නරුව මිගාර මාතා භාෂා සංගම් නියෝජිතයින් එක්ව සංවිධානය කර ඇත. භාෂා සංගම් සුහදත්ව කඳවුර සහ ක්‍රියාකාරි ශ්‍රමදානය රුවන්වැල්ල

මල්ලිකා භාෂා සංගමය මගින් සිදු කර ඇත. කුරුණෑගල, හොරොම්බාව භාෂා සංගම් එක්ව නැගම් යාම සහ සංස්කෘතික ප්‍රසංගය වැඩසටහන සාර්ථකව සිදු කර ඇත. රත්නපුර මීටිපොළ මහා විද්‍යාලයේ ප්‍රතිසංස්කරණ කඳවුර සහ බහු සංස්කෘතික කුසලතා එළිදැක්වීමේ ප්‍රසංගය ඇහැළියගොඩ මීටිපොල සරස්වතී භාෂා සංගම් නියෝජිතයින් එක්ව සංවිධානය කරන ලදී. තව ද පොළොන්නරුව දිස්ත්‍රික්කයේ තමන්කඩුව ප්‍රදේශයේ භාෂා සංගම් එක්ව පුලතිසි මිතුදම් චාරිකාව සංවිධානය කරන ලදී. මහනුවර, උඩපළාත රන්තරු සංස්කෘතික හුවමාරු වැඩසටහන එම ප්‍රදේශයේ ලියාපදිංචි සියළුම භාෂා සංගම් එක්ව සංවිධානය කරන ලදී. මීරිගම සියළුම භාෂා සංගම් සිංහල, දමිළ පිරිස් එක්ව බහු සංස්කෘතික අලුත් අවුරුදු උත්සවය පවත්වන ලදී. කැස්බෑව, සියළුම භාෂා සංගම් ජාතික සමගියේ සිංහල දමිළ බක්මහ උළෙල පැවැත්වීමට ප්‍රතිපාදන ලබා දී ඇත. දෙහිවල භාෂා සංගම් නියෝජිතයින් සංවිධානය කරන ලද සාම බක්මහ සැණකෙළිය දෙහිවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ප්‍රධානත්වයෙන් සාර්ථකව නිම කර ඇත. දෙවන කාර්තුවේ ව්‍යාපෘති 15 ක් සඳහා ප්‍රතිපාදන ලබා දී ඇත. ජූලි මාසයේ දී ව්‍යාපෘති 26 ක් සඳහා ප්‍රතිපාදන ලබා දී ඇත. රත්නපුර, බදුල්ල, සහ කොළඹ යන දිස්ත්‍රික්ක වලින් ලද ව්‍යාපෘති සඳහා ප්‍රතිපාදන නිදහස් කර ඇත. කුරුණෑගල භාෂා සංගම් එක්ව සංවිධානය කරන ලද සිංහල සහ දමිළ භාෂා දින තරග පැවැත්වීම සඳහා ලබා දී ඇත. මාතලේ, බදුල්ල, කුරුණෑගල, සීතාවක සහ කැලණිය ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශ වලින් ලද ව්‍යාපෘති සඳහා ප්‍රතිපාදන නිකුත් කරන ලදී.

3.4 ජාතික භාෂාවන් ප්‍රවර්ධනයට අදාළ ප්‍රකාශන පරිවර්තනය සහ මුද්‍රණය කිරීම

සාමාන්‍ය ජනතාවගේ හා රජයේ නිලධාරීන්ගේ ද්විභාෂා හැකියාවන් වර්ධනය කිරීම ප්‍රධාන කාර්යය කොටගෙන ආරම්භ කරන ලද වැඩසටහනකි. ඒ යටතේ මහාචාර්ය රජිව විජේසිංහ මහතා විසින් සිදු කරන ලද සිංහල, දමිළ සහ ඉංග්‍රීසි කාව්‍ය නිර්මාණ රස විඳීමේ වැඩසටහන් සඳහා ආධාර ලබා දීම සිදු කර ඇත. මෙම වැඩසටහන් මාලාව පේරාදෙණිය විශ්ව විද්‍යාලය, නැගෙනහිර විශ්ව විද්‍යාලය සහ සබරගමුව විශ්ව විද්‍යාලය යන ආයතන වලදී පවත්වා ඇත.සිංහල, දෙමළ ලේඛක එකමුතුව මගින් කෙටි කතා පොත් 10 බැගින් තෝරා එවා ඇත.

ගෙජ්ජි මාලය ළමා කෘතියේ දෙමළ පරිවර්තනය වන "කිට්ටියුම් කාලත්ත මණිමාලයුම්" කෘතියේ පිටපත් 1000 ක්ද "කෝලි අම්මාවුම් මයිර් කුක්ජුහලූම්" කෘතියේ සිංහල පරිවර්තනය වන "කිකිළි අම්මා සහ මොණර පැටවි කෘතියේ පිටපත් 1000 ක්ද මුද්‍රණය කර ඇත. සිංහල හා දමිළ මාධ්‍ය කෙටි කතා සංග්‍රහ දෙකක් පරිවර්තනය කර ඇති අතර ඉන් පිටපත් 1000 ක් බැගින් මුද්‍රණය කිරීම සඳහා සැලසිනේ ආයතනය වෙත භාර දී ඇත.

4. ජාතික භාෂා ව්‍යාපෘතිය සමගඑක්ව සිදු කළ වැඩසටහන්

4.1 රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට අදාළ වැඩසටහන් සැලසුම්කරණය, නායකත්වය සහ ආයතනික බල ගැන්වීම සම්බන්ධයෙන් ජාතික භාෂා අංශයට අවශ්‍ය තාක්ෂණික සහාය ලබාදීම

අමාත්‍යාංශ නිලධාරීන්ගේ කුසලතා වර්ධනය කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම යටතේ භාෂා අංශයේ නිලධාරීන්ගේ පරිගණක හැකියා වැඩි දියුණු කිරීමට අවශ්‍ය පාඨමාලා සඳහා යොමු කිරීම සිදු කර ඇත. ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන යටතේ ජාතික ඒකාබද්ධතා ප්‍රවර්ධන සහකාර, සම්බන්ධීකාරක සහ සහායක නිලධාරීන් දැනුවත් කිරීමේ සිංහල හා දමිළ මාධ්‍ය වැඩමුළු 02 ක් 2014.09.18 සහ 19 දින පැවැත්විය. නිලධාරීන් 73කට කැඳවීම් සිදු කල අතර සහභාගීත්වය 43 කි.

2014.10.27 දින කිලිනොච්චියේ ‘Friends Inn’ හිදී සහ 2014.10.29 දින මහනුවර ‘Hotel Suisse’ හිදී ජාතික ඒකාබද්ධතා ප්‍රවර්ධන සහකාර, සම්බන්ධීකාරක සහ සහායක නිලධාරීන් දැනුවත් කිරීමේ සිංහල හා දමිළ මාධ්‍ය වැඩමුළු කිලිනොච්චියේ දී සහ මහනුවර දී පවත්වන ලදී.

තව ද 2014.11.20 ජාතික භාෂා ව්‍යාපෘතිය සමග සිදු කරන ඉදිරි වැඩසටහන් පිළිබඳ වැඩමුළුව සිදු කරන ලදී. අමාත්‍යාංශය, රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව, රාජ්‍ය භාෂා කොමිෂන් සභාව, ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආතනය යන ආයතන සහ අමාත්‍යාංශයේ සියළුම අංශ නියෝජනය කරමින් නිලධාරීන් සහභාගි විය. වැඩමුළුවේ මූලාසනය ලේකම්තුමිය විසින් හොබවන ලද අතර ජාතික භාෂා ව්‍යාපෘතියේ තාක්ෂණික උපදේශකවරුන් සහ නියෝජිතයින් සහභාගි විය. 2015 වර්ෂයේ මාස 03ක් සඳහා ජාතික භාෂා ව්‍යාපෘතිය විසින් බලාපොරොත්තු වන තාක්ෂණික හා මූල්‍ය සහයෝගිතාවය අවැසි ක්‍රියාකාරකම් පිළිබඳ පැහැදිලි කිරීම් සිදු කරන ලදී

රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට අදාළව පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන පුහුණු වැඩමුළු 03ක් ලෙස සංවිධානය විණි. ඒ අනුව 2014.06.16 සිට 2014.06.20 දක්වා සිංහල මාධ්‍ය වැඩමුළුව ද , 2014.06.23 සිට 2014.06.27 දක්වා දමිළ මාධ්‍ය වැඩමුළුව සහ 2014.07.28 සිට 2014.08.01

දක්වා සිංහල මාධ්‍යවැඩමුළුව ද පැවැත්වීණ.

මෙම වැඩසටහන සඳහා මානව සම්පත් විශේෂඥ ධනංජය හෙට්ටිආරච්චි මහතා සහ සබීරා කපූර් මහත්මිය දායකත්වය සපයන ලදී. පුහුණු අත් පොත් සැකසීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම ආදිය මෙම අමාත්‍යාංශයේ මග පෙන්වීම යටතේ සිදු කරන ලදී. ඒ අනුව වැඩමුළු 03 ම ඉතා සාර්ථකව සිදු කරන ලදී සිංහල මාධ්‍ය යෙන් නිලධාරීන් 49 ක් සහ දමිළ මාධ්‍යයෙන් නිලධාරීන් 22 පුහුණුව ලදහ. එහිදි කථා පැවැත්වීම,ඉදිරිපත් කිරීම, වැඩසටහන් පැවත්වීම,සම්මන්ත්‍රණ පැවැත්වීමට අදාල න්‍යායාත්මක හා ප්‍රායෝගික පුහුණුව ලබාදුණි. මෙම නිලධාරීන් 2015 වසරේ සිට දීප ව්‍යාප්ත වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ දී යොදා ගැනෙනු ඇත.

අමාත්‍යාංශයේ ප්‍රතිපත්ති, පර්යේෂණ සහ අධීක්ෂණ අංශය සවිබල ගැන්වීමට අදාළ වැඩසටහන් යටතේ පර්යේෂණ ක්‍රමවේද පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව 2014.10.16 සිට ආරම්භ වේ. 2014.10.16 දින සිට 2014.11.05 දක්වා මාර්ග ආයතනයේ දී පවත්වන ලදී. අමාත්‍යාංශය සහ අනුබද්ධ ආයතන වල නිලධාරීන් 30 ක් පමණ සහභාගි විය. පර්යේෂණ ක්‍රමවේදය සහ පර්යේෂණ වාර්තා සකස් කිරීම පිළිබඳ න්‍යායාත්මක දැනුම සහ අවබෝධය ලබා දීම සිදු විය. 2014.11.10 දින අධීක්ෂණය සහ නියාමනය පිළිබඳ විද්වත් සාමාජික රැස්වීම පවත්වන ලදී. කැනඩා විශේෂ නියෝජිතවරයෙක් මේ සම්බන්ධයෙන් සහභාගි වීය. තව ද අමාත්‍යාංශයේ ප්‍රතිපත්ති, පර්යේෂණ සහ අධීක්ෂණ අංශයට අවශ්‍ය පරිගණක සහ මුද්‍රණ යන්ත්‍ර මිලදී ගැනීම සිදු කර ඇත.

4.2 රාජ්‍ය ආයතන වල භාෂා සැලසුම් සකස් කිරීමේ මාර්ගෝපදේශ අත්පොත සකස් කිරීමට සමගාමී වැඩසටහන්

රජයේ ආයතන වල භාෂා සැලසුම් සකස් කිරීම පිළිබඳ මාර්ගෝපදේශ අත්පොත

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2009 මගින් ආයතන ප්‍රධානීන් වෙත රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට අදාළව පවරා ඇති කාර්යයන් වඩාත් කාර්යක්ෂම කරනු පිණිස තම ආයතනයේ භාෂා සැලැසුම් සකස් කර ගැනීමට අදාළව වසර 2013 දි භාෂා මාර්ගෝපදේශ අත්පොත මෙම අමාත්‍යාංශය විසින් සම්පාදන කරන ලදී. ඒ සඳහා තාක්ෂණික සහ මූල්‍ය දායකත්වය කැනේඩියානු ආධාර යටතේ ක්‍රියාත්මක වන ජාතික භාෂා ව්‍යාපෘතිය මගින් සපයා ඇත. මාර්ගෝපදේශ අත්පොතේ පිටපත් 3,000 ක් මුද්‍රණය කිරීම සිදු කර ඇත.මෙම

මාර්ගෝපදේශ අත්පොත මගින් ඒ ඒ රජයේ ආයතන වල රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිළිබඳ අනුගමනය කළ යුතු ක්‍රියාදාමය මූලික පියවර 04 ක් මගින් පැහැදිළි කර ඇත. රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිණිස ක්‍රමවත් සැලැස්මක් රාජ්‍ය ආයතන සතු වීම තුලින් මහජනතාවට ද්වීභාෂා සම සේවා අවස්ථා ලබා දීමේ හැකියාවන් පුළුල් වන අතර මහජන මුදල් කාර්යක්ෂමව භාවිතා කිරීමේ අවස්ථා උදාවනු ඇත.

මේ වන විට මෙම අමාත්‍යාංශය විසින් රාජ්‍ය ආයතන වලට සිදු කරනු ලබන දැනුවත් කිරීමේ වැඩසටහන් වලදී භාෂා මාර්ගෝපදේශ අත්පොත බෙදා දීම සිදු කරන ඇති අතර 2014 වසරේදී පොලිස් නිලධාරීන් සඳහා සිදු කරන ලද දැනුවත් කිරීමේ වැඩසටහන් වලදී ද භාෂා අත්පොත් බෙදා දීම සිදු කර ඇත. 2015 වසරේ සිට මග සැලසුම යටතේ තෝරා ගත් ප්‍රධාන අමාත්‍යාංශ 06 ක් සහ අනුබද්ධ ආයතන වල භාෂා සැලසුම් පිළියෙළ කිරීමේ ක්‍රියාකාරකම සිදු කිරීමට මෙම අමාත්‍යාංශය සැලසුම් කර ඇත.

4.3 රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ඵලදායීව ක්‍රියාත්මක කිරීමට අදාලව මග සැලසුම (Road Map) සහ වගවීමේ ක්‍රියාදාමය (Accountability Framework)සකස් කිරීම

රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට අදාළ“මග සැලසුම”

රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ඵලදායීව ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ සියළුම රාජ්‍ය ආයතන වල පූර්ණ දායකත්වය ලබා ගැනීම අත්‍යාවශ්‍ය කරුණකි. මෙම සංකල්පය මූලික කරගෙන මෙම අමාත්‍යාංශය විසින් වසර 2012 දී මග සැලසුම වැඩසටහන ආරම්භ කරන ලදී. මෙමගින් රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට අදාලව සියලුම රජයේ ආයතන සක්‍රීයව සහභාගි කර ගැනීම සිදු කෙරේ. “මග සැලසුම” මගින් ඒ ඒ රාජ්‍ය ආයතන වල රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට පස් අවුරුදු කෙටි කාලීන සහ දීර්ඝ කාලීන උපාය මාර්ගික සැලැස්මක් සකස් කරනු ලබන අතර මෙම අමාත්‍යාංශය විසින් ඒ සඳහා තෝරාගෙන ඇති කාල රාමුව වසර 2016-2020 දක්වා වේ.

“මග සැලසුම” වැඩසටහනේ මූලික අදියර යටතේ මහජනතාවට වඩාත් සමීප සේවා සපයන පදනම මත ප්‍රධාන අමාත්‍යාංශ 16 ක් තෝරාගෙන ඇත. එම අමාත්‍යාංශ අතර රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය, අධ්‍යාපන අමාත්‍යාංශය, ජනමාධ්‍ය හා තොරතුරු අමාත්‍යාංශය, සෞඛ්‍ය අමාත්‍යාංශය, නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය, යෞවන කටයුතු සහ නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය යන අමාත්‍යාංශයන් ප්‍රමුඛත්වයෙහිලා ගැනේ.

මේ වන විට මෙම අමාත්‍යාංශය අනෙකුත් අනුබද්ධ ආයතන වන රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව, රාජ්‍ය භාෂා කොමිෂන් සභාව සහ ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය එක්ව “මග සැලසුම” පස් අවුරුදු ක්‍රියාකාරී සැලැස්ම සකස් කර අවසන් කර ඇත. මෙම ක්‍රියාකාරී සැලැස්ම අනුව මූලික වැඩසටහන් ආරම්භ කිරීම 2015 වසරේදී සිදු කරන අතර “මග සැලසුම” ක්‍රියාත්මක කිරීම 2016 වසරේ සිට ඉදිරියට සිදු කිරීමට බලාපොරොත්තුවේ.“

මගසැලසුම”වැඩසටහනට අදාලව තෝරා ගත් ප්‍රධාන අමාත්‍යාංශ 16 සහ අනුබද්ධ රාජ්‍ය ආයතන වල රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට අදාළව මූලික දත්ත එකතු කිරීමේ කටයුතු මේ වන විට ආරම්භ කර ඇති අතර ක්‍රමවත්ව සකස් කළ දත්ත පාදමක් මගින් එම තොරතුරු ගබඩා කර අවශ්‍ය කරුණු විශ්ලේෂණය කිරීමට නියමිතය.

4.4 ප්‍රාදේශීය සේවාවන් හි නව්‍ය ආදර්ශ ගොඩ නැංවීම

රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ඵලදායීව ක්‍රියාත්මක කිරීම වඩාත් අර්ථවත් කරනු පිණිස ඒ සම්බන්ධ ආදර්ශ ආයතන ගොඩනැංවීමේ වැඩසටහනක් ලෙස ප්‍රාදේශීය සේවාවන් හි නව්‍ය ආදර්ශ ඇති කිරීම සඳහන් කළ හැක. ඒ අනුව 2012 සිට 2013 වසර දක්වා දිවයිනේ විවිධ රාජ්‍ය ආයතන නියෝජනය කරමින් නව්‍ය ආදර්ශ 14 ක් මේ වන විට ස්ථාපිත කර ඇත.

- මහ නගර සභා කොළඹ, නුවරඑළිය, බදුල්ල, ගාල්ල
- නගර සභා -වව්නියා, ත්‍රිකුණාමලය
- ප්‍රාදේශීය සභා- කන්තලේ
- රෝහල්-ත්‍රිකුණාමලය,ගාල්ල, පේරාදෙණිය

- ප්‍රාදේශීය ලේකම් කාර්යාල - බණ්ඩාරවෙල
- පොලිස් ස්ථාන නුවරඑළිය, ත්‍රිකුණාමලය, වව්නියා

2014 වසරේ දී මෙම අමාත්‍යාංශය විසින් උක්ත නව්‍ය ආදර්ශ 08 නිරීක්ෂණ චාරිකා සිදු කරන ලද අතර රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට අදාළව එම ආයතන මුහුණ පාන ගැටළු සහ අමාත්‍යාංශය වෙතින් ලබා දිය හැකි සේවය සම්බන්ධයෙන් කරුණු සොයා බලා කටයුතු කිරීම සිදු කර ඇත. තව ද නව්‍ය ආදර්ශ ද්වී භාෂා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස වල පිහිටි රාජ්‍ය ආයතන වලට ව්‍යාප්ත කිරීමේ අරමුණින් මෙම වසරේ සිට ආසියා සංවර්ධන පදනමේ තාක්ෂණික දායකත්වය යටතේ වැඩසටහන් දියත් කිරීම මෙම අමාත්‍යාංශය විසින් ආරම්භ කර ඇත.

4.5 පළාත් මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම

ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ආයතන වල සේවාවන් පළාත් මට්ටමෙන් සැපයීම සඳහා දියත් කර ඇති කාර්යයක් ලෙස පළාත් මධ්‍යස්ථාන ස්ථාපිත කිරීමේ වැඩටහන දැක්විය හැක. මෙය උගත් පාඩම් හා ප්‍රතිසංධාන කමිටු(LLRC) නිර්දේශයකට අදාළව හා 2013.08.29 දින පවත්වන ලද අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළැඹි තීරණයක් අනුව ක්‍රියාත්මක කරනු ලැබේ. ඒ අනුව මෙම අමාත්‍යාංශය විසින් 2013 වසරේදී උතුරු පළාත් මධ්‍යස්ථානය කිලිනොච්චියේ දී සහ සබරගමු පළාත් මධ්‍යස්ථානය කුරුවිට දී ස්ථාපිත කරන ලදී.

2015 වසරේදී මධ්‍යම පළාත් මධ්‍යස්ථානය * මහනුවර දිස්ත්‍රික්කයේ ද නැගෙනහිර පළාත් මධ්‍යස්ථානය * මඩකළපුව දිස්ත්‍රික්කයේ ද දකුණු පළාත් මධ්‍යස්ථානය * මාතර දිස්ත්‍රික්කයේ ද ස්ථාපිත කෙරේ. වයඹ, ඌව සහ උතුරු මැද පළාත් මධ්‍යස්ථාන 2016 වසරේදී ස්ථාපිත කෙරෙනු ඇත

කිලිනොච්චි පළාත් මධ්‍යස්ථානය මූලිකව භාෂා සංගම් ගුරුවරුන් පුහුණු කිරීමේ වැඩසටහනක් 2014.12.13 සිට 17 දක්වා පැවැත්වීය.

පුහුණුව සඳහා පාසල් ගුරුවරුන්, රජයේ සේවයේ නියුතු නිලධාරීන්, පෞද්ගලික අංශ වල සේවයේ නියුතු වූ අය, භාෂා සංගම් නියෝජිතයින් සහ අනෙකුත් තෝරා ගත් අය 31 සහභාගි විය. පුහුණුව අවසානයේ මොවුන් උතුරු පළාතේ භාෂා සංගම් පන්ති වල භාෂා ඉගැන්වීම් කටයුතු වලට අනුයුක්ත කිරීමට නියමිතය.

5. මහජන සහභාගීත්ව අරමුදල

මහජන සහභාගීත්ව අරමුදල යටතේ ජාතික භාෂා ව්‍යාපෘතිය ප්‍රධාන කාර්යන් 02 ක් සඳහා මෙම අමාත්‍යාංශයට තාක්ෂණික ආධාර සපයන ලදී.

- 2013 වසරේ ස්ථාපිත භාෂා සංගම් මෙහෙයුම් සම්බන්ධීකරණ මධ්‍යස්ථාන 05 ක ව්‍යාපෘති සඳහා ආධාර සැපයීම
- 2014 වසරේ අළුතින් ස්ථාපිත කරන භාෂා සංගම් මෙහෙයුම්

සම්බන්ධීකරණ මධ්‍යස්ථාන 05 ව්‍යාපෘති සඳහා ආධාර සැපයීම

මෙහි පළමු කාර්යය යටතේ ඇහැලියගොඩ ස්ථාපිත භාෂා සංගම් මෙහෙයුම් සම්බන්ධීකරණ මධ්‍යස්ථානයෙන් ඉදිරිපත් කල ව්‍යාපෘතිය සඳහා ආධාර ලබා දීම සිදු කරන ලදී. තව ද රත්නපුර දිස්ත්‍රික්කයේ මෙහෙයුම් සම්බන්ධීකරණ කමිටු 05 ක් පිහිටුවා ඇත. (කුරුවිට,රත්නපුර,බලංගොඩ, ගොඩකවෙල, ඕපනායක). වවුනියාව භාෂා සංගම් මෙහෙයුම් මධ්‍යස්ථාන ක්‍රියාකාරී කමිටුව ස්ථාපිත කරන ලදී. 2014.11.03 දිනදී එය වවුනියා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දී සිදු කරන ලදී. කහටගස්දිගිලිය මෙහෙයුම් කමිටුව විසින් ඉදිරිපත් කල ව්‍යාපෘති යෝජනාව සඳහා ජාතික භාෂා ව්‍යාපෘතිය විසින් රු. 140,000 ක ප්‍රතිපාදන ලබා දී ඇත.

දෙවන කාර්යය යටතේ බදුල්ල දිස්ත්‍රික්කයේ ස්ථාපිත භාෂා සංගම් මෙහෙයුම් සම්බන්ධීකරණ මධ්‍යස්ථානයේ ව්‍යාපෘති වාර්තා අනුමත කර අතර ප්‍රතිපාදන ද නිදහස් කර ඇත. බදුල්ල මෙහෙයුම් මධ්‍යස්ථානය මගින් සංවිධානය කළ සිංහල*හින්දු අලුත් අවුරුදු බහු සංස්කෘතික විවිධත්වය රැගත් අවුරුදු උත්සවය සඳහා ජාතික භාෂා ව්‍යාපෘතියේ නිලධාරීන් සහභාගි විය. 2014.09.12 කුරුවිට භාෂා සංගම් මෙහෙයුම් සම්බන්ධීකරණ රැස්වීම පවත්වන ලදී. කුරුවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ භාෂා සංගම් වැඩසටහනට අදාල ගැටලු හා ඉදිරි කටයුතු පිළිබඳ සාකච්ඡා කරන ලදී. 2014.09.15 දින කිලිනොච්චි භාෂා සංගම් මෙහෙයුම් කමිටු ස්ථාපිත කිරීම සිදු කරන ලදී.

කහටගස්දිගිලිය භාෂා සංගම් මෙහෙයුම් මධ්‍යස්ථාන නියෝජිතයින්ගේ කුසලතා සංවර්ධන වැඩසටහන පැවැවීම පිළිබඳ මූලික සාකච්ඡාවක් 2014.02.18 දින පවත්වන ලදී.

2014.02.28 සිට 2014.03.02 දක්වා කහටගස්දිගිලිය භාෂා සංගම් මෙහෙයුම් මධ්‍යස්ථාන නියෝජිතයින්ගේ කුසලතා සංවර්ධන වැඩසටහන සිදු කරන ලදී. රාජ්‍ය නොවන ආයතන මගින් ක්‍රියාත්මක වන අන්තර් ක්‍රියාකාරී වැඩසටහන් (2014.09.13 සහ 14* තරුණ කඳවුර, යාපනය(SOND ආයතනය) 2014.09.16 සහ 17 තරුණ කඳවුර, කන්තලෙ-RECDO ආයතනය විසින් සිදු කරන ලදී. මේ සඳහා අමාත්‍යාංශයට අනුයුක්ත ක්ෂේත්‍ර නිලධාරීන් සම්බන්ධ වී ඇත. කරච්චි භාෂා සංගම් මෙහෙයුම් කමිටු මහා සභා වාර්තා ලබා ගැනීම සිදු කර ඇත.

03. 2 සමාජ ඒකාබද්ධතා අංශය

හැඳින්වීම

රටක ජීවත් වන සියල්ලෝම එම රටෙහි පුරවැසියන් ලෙස සලකා සැමට ජීවත් විය හැකි යහපත් සමාජයක් විවර කරදීම එම රටෙහි සංවර්ධනය උදෙසා ඉවහල්වේ. එම කාර්යය ඉටුකිරීමට නම් නිවැරදි මාර්ගයක් සකස් කළ යුතුය. එනම් නිවැරදි ප්‍රතිපත්තියක් තුළ කටයුතු කළ යුතුය. සමාජ ඒකාබද්ධතාවයට රට තුළ ප්‍රතිපත්තියක් නොතිබුණු අතර එය සකස් කිරීමට ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය පියවර තැබුවේය. සමාජ ඒකාබද්ධතාව ප්‍රවර්ධනය සඳහා පාර්ශ්වකරුවන් ලෙස සියලු පුරවැසියන් සතු වගකීම හා හැඟීම මත දැනුවත්භාවයෙන් හා ඒකාබද්ධතාවයෙන් පෝෂණය වූ ආචාරධර්ම, අධ්‍යාපනය සහ සවිබල ගැන්වීම යන ස්ථම්භ පාදක කර ගත් සමාජයක් බිහි කිරීම, සමාජ ඒකාබද්ධතා ප්‍රතිපත්තියෙහි මූලිකාංග ශක්තිමත් කිරීම මගින් සියලු දෙනා සමාජ අන්තර්ගතකරණය කිරීම මෙම ප්‍රතිපත්තියෙහි අරමුණයි. එහිදී සමාජ ඒකාබද්ධතා ක්‍රියාවලියට පහසුකම් සැලසීමේදී අන්තර් ඡේදක මාධ්‍යයන් ලෙස භාෂා සබඳතා හා සමාජයීය වගකීමෙන් බැඳී සිටින පොදු මාධ්‍යයක ඇති වැදගත්කම හඳුනා ගැනීම ද මෙහි අරමුණකි.

ක්‍රියාකාරී සැලැස්මට අනුව කාර්යසාධනය

සමාජ ඒකාබද්ධතා අංශයේ මූල්‍යප්‍රගතිය



අනු අංකය	විස්තරය	ඇස්මේන්තු ගත වියදම (රුපි.)	සත්‍ය වියදම (රුපි.)	ප්‍රතිශතය
01	සමාජ ඒකාබද්ධතාවය ජාතිකප්‍රතිපත්තිය අදාළපාර්ශ්වන්කරුවන් තුළින් ක්‍රියාවට නැංවීම	1,800,000.00	1,392,148.00	77.34%
02	ෂමාජය තුළ පහසුවෙන් පීඩාවට පත්විය හැකි කණ්ඩායම් හි දැනුම හැකියාවන් වර්ධනය සහ ආකල්ප වෙනස්වීම තුලින් සමාජගත වීම තහවුරු කිරීම	3,300,000.00	3,493,768.00	105.87%
03	ප්‍රජාව අතර,ඔවුන්ගේ අනන්‍යතාවයන්ආරක්ෂා කිරීමසහ අන්‍යොන්‍ය අවබෝධය සහවිශ්වාසය වර්ධනය කිරීම සඳහා එහි වැදගත්කම පිළිබද දැනුවත්භාවය ඇති කිරීම	6,900,000.00	6,859,187.00	99.40%
	එකතුව	**12,000,000.00**	**11,745,103.00**	**97.87%**

සමාජ ඒකාබද්ධතා අංශයේ ක්‍රියාකාරකම්

1.සමාජ ඒකාබද්ධතා සතිය

2014 වර්ෂයේ ද දීප ව්‍යාප්තව සමාජ ඒකාබද්ධතා සතිය ක්‍රියාත්මක කිරීම සඳහා 2014.07.10 වන දිනැති අංකඃ අමප/14/0883/520/006 මගින් අමාත්‍ය මණ්ඩල අනුමැතිය හිමි විය.

මේ අනුව "සමාජ ඒකාබද්ධතාව තුළින් ජාතික සමගිය" යන තේමාව යටතේ සමාජ සුබසාධන, අධ්‍යාපන, කලා හා සංස්කෘතික වැඩසටහන් ගණනාවකින් යුතු සමාජ ඒකාබද්ධතා සතිය 2014.07.14 සිට 2014.07.20 දක්වා දිවයින පුරා පැවැත්විය.

ප්‍රාදේශීය මට්ටමින් ප්‍රජා ජන සහභාගීත්ව වැඩසටහන් සමාජ ඒකාබද්ධතා සතියේ මූලික වැඩසටහන් අතරින් එකකි. ප්‍රජාවගේ ශ්‍රම දායකත්වය ලබා ගනිමින් පෙර පාසල්,ළමා උයන්, සනීපාරක්ෂක සේවා, වැඩිහිටි නිවාස, දිවා සුරැකුම් මධ්‍යස්ථාන, ප්‍රජාශාලා ප්‍රතිසංස්කරණය, පානීය ජලය ලබාදීමේ පහසුකම් සැලසීම, පාලම්, මාර්ග, පාසල් ගොඩනැගිලි ප්‍රතිසංස්කරණය වැනි අත්‍යාවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය සිදු කරන ලදී. 2014 වර්ෂයේ එක් දිස්ත්‍රික්කයක මෙවැනි වැඩසටහන් දෙක බැගින් වැඩසටහන් 46ක් සිදු කර ඇත.

ප්‍රජා ජන සහභාගීත්ව වැඩසටහන ප්‍රතිසංස්කරණය කරන ලද පෙර පාසල

දීප ව්‍යාප්තව පවත්වන 5 වසර ශිෂ්‍යත්ව වැඩසටහන සමාජ ඒකාබද්ධතා සතියේ තවත් ප්‍රධාන වැඩසටහන් අතරින් එකකි. මෙමගින් 5 වසර ශිෂ්‍යත්ව විභාගයට සූදානම් වන දරුවන්ගේ ඉලක්ක ප්‍රශ්න සහ පිළිතුරු සාකච්ඡා කිරීමට සහ පිළිතුරු ලිවීමේ පෙරහුරුවක් ලබා දීමට කටයුතු කරන ලදී. 2013 වර්ෂයේ දී ආරම්භ කරන ලද මෙම වැඩසටහන එක් දිස්ත්‍රික්කයකට වැඩසටහන් දෙක බැගින් ක්‍රියාත්මක විය. නමුත් විදුහල්පතිවරුන්ගෙන් පැවති ඉල්ලුම මත 2014 වර්ෂයේ දී මෙම වැඩසටහන් 55 ක් ක්‍රියාත්මක කිරීමට සිදු විය. සිංහල මාධ්‍යයෙන් සහ දමිළ මාධ්‍යයෙන් වැඩසටහන් පවත්වන ලදී. 2014 වර්ෂයේ සිසු සිසුවියන් 16,620ක් ද ප්‍රතිලාභ ලබා ඇත.

සමාජ ඒකාබද්ධතා සතියට සමගාමීව භාෂා සංගම් දායක කර ගනිමින් සමාජ ඒකාබද්ධතා වැඩසටහන් 2014 වර්ෂයේ 23ක් ක්‍රියාත්මක කරන ලදී. එමගින් ජාතීන් අතර සුහදතාව, භාෂා දැනුම, කුසලතාව හා ආකල්ප වර්ධනය කිරීමේ වැඩසටහන්මෙන්ම මොණරාගල සහ බුත්තල ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල දැන්වීම් පුවරු ත්‍රි භාෂාවෙන් සකස් කිරීම වැනි කාර්යයන් ඉටු කරන ලදී.

ගවේෂණ චාරිකාව, නාද යාත්‍රා සංගීත ප්‍රසංගය, අතිගරු ජනාධිපතිතුමාගේ සහභාගීත්වයෙන් පැවති සරුංගල් උත්සවය, සමාජ ඒකාබද්ධතාවය සඳහා කටයුතු කරන පාර්ශවකරුවන් කැඳවා සමුළුවක් පැවැත්වීම ඇතුළුව දිවයින පුරා වැඩසටහන් රාශියක් පැවැත්විණි. මෙම වැඩසටහන් තුළින් අධ්‍යාපනය, ආර්ථික යටිතල පහසුකම් දියුණු

කිරීම, ජාතීන් අතර අවබෝධය හා විශ්වාසය ගොඩනැගීම, සමාජ ඒකාබද්ධතාවය පිළිබඳ දැනුවත් වීම යන අංශ ඔස්සේ ආන්තීකරණය වූ ජන කොටස් සවිබල ගැන්වීම ඇතුළු ප්‍රතිලාභ රැසක් ජනතාවට ලබා දෙන ලදී.

බහු වාර්ගික, බහු ආගමික සහ විවිධ සමාජ ස්ථරවලින් යුක්ත රටක් ලෙස මෙරට සාමකාමීව, සමගි සම්පන්නව එකිනෙකාට ගරු කරමින් වේගවත් සංවර්ධනයක් කරා ගමන් ගන්නා රටක් බවට පත් කිරීමේ අරමුණින්, තව තවත් අංග එකතු කරමින් ඉදිරි වසරේදීත් සමාජ ඒකාබද්ධතා සතිය ක්‍රියාත්මක කිරීම අපේක්ෂා කරමි.

2.ජාතික සමගියේ මහා සමුළුව

රට තුළ පැවති අර්බුදකාරී තත්ත්වය අවසන්ව සංවර්ධනය කරා ගමන් කරන එකම ශ්‍රී ලාංකේය ජාතියක් ලෙස සාර්ථකත්වයට පියනගන්නේ නම් ජාතීන් අතර එකමුතුකම ඉතා වැදගත් වේ. මෙම තත්ත්වය අවබෝධ කර ගනිමින් විවිධ ජන කණ්ඩායම්, ආගම්, හා සංස්කෘතීන් අතර පිළිගැනීම තහවුරු කරමින් සමාජයේ සහජීවනයට හා යහපැවැත්මට බාධා නොවන ආකාරයෙන් ජාතික සමගිය උදෙසා සාකච්ඡාවක් ඇති කළ යුතු යැයි අවධාරණය කෙරිණ.

එහි ප්‍රතිඵලක් වශයෙන් "ජාතික සමගියේ මහා සමුළුව" යන මැයෙන් සංකල්පය මඟින් මෑත කාලයේ ජනවාර්ගික හා ආගමික කණ්ඩායම් අතර විටින් විට ඇති වූ ගැටුම් නිසා උද්ගත වූ ශෝචනීය තත්ත්වයන් ගැන ලද අත්දැකීම් නිසාම ඇති විය හැකි පළුදුවීම් මග හැර සමාජයේ පුළුල් ජන විඥානය තුළ එක්සත්කාමී අපේක්ෂාවන් ප්‍රබලව ඇති විය යුතු බව අවබෝධ කර ගැනිණ.

2014.03.04 වන දිනැති අංක අමප /13/1668/520/009 මගින් අමාත්‍ය මණ්ඩල අනුමැතිය අනුව "විවිධත්වය තුළඑක්සත්භාවය පිළිබඳ ජනතා ප්‍රතිඥාව" ලබාදීමට කටයුතු කරමින් 2014.04.07 දින " ජාතික සමඟිය උදෙසා"යන තේමාව කර ගනිමින් ජාතික මට්ටමේ වැඩසටහනක් වන ජාතික මහා සමුළුව පැවැත්වීමට කටයුතු කරන ලදී.

ශ්‍රී ලාංකේය සමාජයේ ජීවත් වන සියලු ජන වර්ග, ජන කණ්ඩායම්, ආගම් හා සංස්කෘතීන් අතර පිළිගැනීම තහවුරු කරමින් එකිනෙකා අතර අන්‍යෝන්‍ය අවබෝධය හා පිළිගැනීම ජාතික සමගියේ මහා සමුළුවේ මූලික පරමාර්ථය විය.මේ තුළින් සහජීවනය හා යහපැවැත්ම ඇති කිරීමෙන් සමානාත්මතා සමාජයක් ගොඩනැගීම අපේක්ෂාව විය.

අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලද ජාතික මහා සමුළුව,සමාජ ඒකාබද්ධතාවය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියෙන් පෙන්වා දී ඇති පරිදි ජාතීන් අතර ඒකීයත්වය ගොඩනැගීම, ශ්‍රී ලාංකීය අභිමානය සහ තමා ද සමාජයට අයත් වීමේ හැඟීම හා වගකීම, භෞතික පරිසරය ආරක්ෂා කිරීම, වර්ග හා ආගම් අතර සංස්කෘතීන් කෙරෙහි එකිනෙකා දක්වන ගෞරවය,ශ්‍රී ලාංකීය වටිනාකම සහ අනන්‍යතාවය පෝෂණය කිරීම සඳහා චර්යාත්මක වෙනස්කම් යන කරුණු කෙරෙහි අවධානය යොමු කරන ලදී. සිවිල් සමාජ වගකීම් දැරීමට උපකාර වන ආකාරය පිළිබඳව සාකච්ඡාවකට ලක් විය.ඒ අනුව ජනතාව අතර මනා සම්බන්ධතා ගොඩනගා ගැනීමට පහසුකම් සැලසෙන අතර ජාතික සමගිය පිළිබඳ පණිවුඩය දිවයිනේ සියළු ප්‍රදේශවලට රැගෙන යාමට අවස්ථාව උදා විය.

ජාතික මහා සමුළුවට සමගාමීව පාසල් සිසුන් අතර රචනා සහ චිත්‍ර තරගයක් පැවැත්විය. මෙම තරග පළාත් මට්ටමින් සහ සමස්තලංකා මට්ටමින් පැවැත්විය.එහි ජයග්‍රහණය කළ පාසල් සිසුන් සඳහා සහතිකපත් හා ත්‍යාග පිරිනමන ලදී.

3.නිතිමය ලේඛන ලබා දීමේ ජංගම සේවා

ජනවාර්ගික භේදයකින් තොරව සියළු ශ්‍රී ලාංකිකයන් අතරෙහි අන්‍යෝන්‍ය විශ්වාසය වර්ධනය කරමින් සමාජයේ අවාසි සහගත කණ්ඩායම්වලට සමාන ඉඩ ප්‍රස්ථා ලබා දීම තුලින් පුරවැසියකු ලෙස සමාජයේ ජිවත් වීමට අවශ්‍ය මූලික නෛතික ලේඛන ලබා දීමමෙම වැඩසටහනෙහි අරමුණ වේ.

එකම ස්ථානයකදී මෙම සියළු සේවාවන් ජනතාවට බාධාවකින් තොරව ලබා ගැනීමට අවශ්‍ය සියළු පහසුකම් සපයා ඇති අතර මෙම සේවාවන් සියල්ල ජනතාවට නොමිලේ ලබා දෙනු ලැබේ. (උදාහරණයක් වශයෙන් ජාතික හැඳුනුම්පතට අවශ්‍ය ඡායාරූප හා මුද්දර ද උප්පැන්න,විවාහ හා මරණ සහතික වෙනුවෙන් අයකරනු ලබන ගාස්තු හා නව විවාහවීම්වලට අදාල ගාස්තුද එම පුද්ගලයින්ගෙන් අයකිරිමකින් තොරව ලබා දේ.)

මේ මගින් ජනතාවට කාලය හා ශ්‍රමය අවම කර ගැනීමට හැකිවන අතර, පුරවැසියකු ලෙස තමන්ගේ අනන්‍යතාවය තහවුරු කිරීමේ මූලික ලේඛනය වන ජාතික හැඳුනුම්පතට හිමිකම ඇති වීම තුලින් ඔවුන් සමාජගත වීමට හැකි වේ. මෙහිදී ලබා දුන් සේවාවන්,

- ජාතික හැඳුනුම්පත් ලබා දීම

2014 වර්ෂය සඳහා 2364 පමණ ජාතික හැඳුනුම්පත් ලබා දී ඇත.

- උප්පැන්න සහතිකපත් ලබාදීම, කල්පසු උපත් ලියාපදිංචිය, සංශෝධන, අනුමාන වයස් සහතික නිකුත් කිරීම,

2014 වර්ෂය සඳහා 6229 පමණ උක්ත ලේඛන ලබා දී ඇත.

- නව විවාහ සිදුකිරීම්

  2014 වර්ෂයේදී පමණක් අවිවාහකව එකට ජීවත් වන පුද්ගලයින් 413 කට නොමිලේ විවාහ ලියාපදිංචි කිරීම සිදුකරන ලදී.

- අස්ථානගතවූ හැඳුනුම්පත් සඳහා පොලිස් සහතික නිකුත් කිරීම

අස්ථාන ගත වූ ජාතික හැඳුනුම්පත් සඳහා පොලිස් වාර්තා නොමිලේ ලබා දෙනු ලැබේ.

- විදේශ ගමන් බලපත්‍ර නිකුත් කිරීම
- සාමවිනිසුරු සහතික නිකුත්කිරීම

  මෙමගින් ජාතික හැඳුනුම්පත් සහ උප්පැන්න, මරණ හා විවාහ සහතිකපත්වලට අදාල දිවුරුම් ප්‍රකාශ ලබා දීමට කටයුතු කර ඇත.

- වැඩිහිටි හැඳුනුම්පත් නිකුත්කිරීම

  ජ්‍යෙෂ්ඨ පුරවැසියන් වෙනුවෙන් ඡායාරූප නොමිලේ ලබා දී වැඩිහිටි හැඳුනුම්පත් ලබා දීමට කටයුතු කර ඇත. 2014 වර්ෂය සඳහා 70 කට පමණ ප්‍රතිලාභ හිමි වී ඇත.

මෙම ජංගම සේවාවන් විශේෂයෙන් උතුරු, නැගෙනහිර පළාත්, වතු ආශ්‍රිත ප්‍රදේශ, දුෂ්කර ප්‍රදේශ ආවරණය වන පරිදි පවත්වා ඇත. (මුලතිව්, කිලිනොච්චි, මන්නාරම, මඩකලපුව, ත්‍රිකුණාමලය ,අම්පාර, රත්නපුර, බදුල්ල, නුවරඑළිය දිස්ත්‍රික්ක)

2013 වර්ෂයේ සිට අමාත්‍යාංශයේ යුක්තිදාමයට සම ප්‍රවේශත්ව ව්‍යාපෘතිය මගින් (UNDP අනුග්‍රහය) පවත්වන ලද නීතිමය ලේඛන ලබා දීම සම්බන්ධව දිස්ත්‍රික්ක 12ක පවත්වන ලද සමීක්ෂණයේදී හඳුනාගත් දත්තයන් මත 2014 වර්ෂයේ සිට ජංගම සේවා පැවැත්වීමට කටයුතු යොදා ඇත.

4. සමාජ ඒකාබද්ධතා තරුණ කඳවුර

විවිධ ජන කොටස්වලට අයත් තරුණ පිරිස් අතර සාමය, සහජීවනය හා සමාජ ඒකාබද්ධතාවය මුල් කරගත් සමාජ අවබෝධය ඇති කිරීම තුළින් හෘදයාංගමව බැඳුණ තරුණ පරපුරක් බිහි කිරීම, මෙම තරුණ කඳවුරෙහි අරමුණ වේ.

තරුණ පරපුර රටේ අනාගතය භාරගැනීමට හා සමාජයේ වෙනසක් සිදුකිරීමේ ක්‍රියාවලියේ මූලිකත්වයක් ගත හැකි කණ්ඩායමක් වශයෙන් අවබෝධකොට ගෙන අමාත්‍යාංශය මගින් සෑම වසරකම විශේෂ වැඩසටහනක් ලෙස "සමාජ ඒකාබද්ධතා" තරුණ කඳවුරු පවත්වනු ලැබේ.

වර්ෂයකට මෙම කඳවුරු 04 බැගින් ක්‍රියාත්මක කරනු ලබන අතර, එක් කඳවුරක් සඳහා සිංහල, දෙමළ හා මුස්ලිම් ජාතීන් නියෝජනය වන පරිදි අවුරුදු 18 ත් 30 අතර තරුණ තරුණියන් 100 ත් 150 අතර ප්‍රමාණයක් සහභාගි කර ගන්නා ලදී.

මෙම තරුණ කඳවුර තුල නායකත්ව හා පෞරුෂ වර්ධන ක්‍රියාකාරී වැඩසටහන්, විශ්ව විද්‍යාල දේශක මහත්ම මහත්මීන්ගේ සහභාගීත්වයෙන් දේශන, සංගීතය සංහිඳියාව ඇති කිරීමේ ප්‍රබල මාධ්‍යයක් ලෙස හඳුනාගෙන සංගීතය තුලින් සමාජ ඒකාබද්ධතාවය තරුණයන් තුළට ගෙන යාම සඳහා රසවින්දනය තුළින් සමාජ ඒකාබද්ධතාවය තේමා කරගත් සංගීත වැඩසටහනක්ද, සිංහල ,දෙමළ හා ඉංග්‍රීසි භාෂාව ඉගෙනීමේ නව ක්‍රමවේද ඇතුලත් ක්‍රියාකාරී වැඩසටහනක් හා තරුණ තරුණියන්ගේ හැකියාවන් විදහා දැක්වීමට අවස්ථාවන් ඇතුළු අංග රාශියකින් සමන්විත වේ.

2014 වර්ෂය තුළ තරුණ කඳවුරු 3 ක් පවත්වා ඇති අතර, තරුණ තරුණියන් 300 කට ආසන්න ප්‍රමාණයක් සහභාගි වී ඇත. මොණරාගල, නුවරඑළිය සහ වව්නියා යන දිස්ත්‍රික්කවල මෙම කඳවුරු පවත්වා ඇත.

මෙහිදී පැමිණෙන තරුණ කොටස් වෙනුවෙන් වෘත්තීය පුහුණු අධිකාරිය, වෘත්තීය මාර්ගෝපදේශන සේවාව හරහා ඔවුන්ට තිබෙන පුහුණුවීම් හා ඒ මගින් ඇති වන රැකියා අවස්ථාවන් පිළිබඳ දැනුවත් භාවයක් හා ඒ සඳහා අවස්ථාවන් ලබා දීමට කටයුතු කර ඇත.

5.දෙමාපියන් අහිමි හා එක් භාර කරුවකු පමණක් සිටින දරුවන් සඳහා වූ සමාජ ඒකාබද්ධතා වැඩසටහන

සමාජ ඒකාබද්ධතා ප්‍රතිපත්තියේ එක් ඉලක්කයක් වන්නේ අධ්‍යාපනය සඳහා ප්‍රවේශයයි.මෙම අයිතිය ලබා දීම සඳහා ආර්ථික,සමාජයීය විෂමතා හෝ වාර්ගිකභාවය

නිසා හෝ ආගම නිසා හෝ අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ කිසිදු අසාධාරණයක් හෝ ආන්තීකරණය වීමක් සිදුවීම වැළැක්වීම සඳහා අවධානය යොමු කරයි.

ආන්තීකරණයට ලක් වී ඇති කණ්ඩායම්වල දරුවන් අධ්‍යාපනය සඳහා ප්‍රවේශවීමට පහසුකම් සැලසීම සඳහා දෙමාපියන් අහිමි හෝ එක් භාරකරුවකු සිටින පාසල් දරුවන් සඳහා පාසල් උපකරණ ලබා දීමේ වැඩසටහනක් අප අමාත්‍යාංශය මගින් සිදු කරනු ලබයි.

2014 වසර තුළ කිළිනොච්චි,රත්නපුර ,වවුනියාව, දිස්තික්කවල මෙම වැඩසටහන සිදු කර ඇත. පාසල් සිසුන් 300 කට අධික පිරිසකට පහසුකම් සලසා දී ඇත.

මෙමගින් අඩු වරප්‍රසාද ලත් දරුවන්ගේ ඉගෙනීමට පහසුකම් ලබා දීමෙන් ඔවුන් අධ්‍යාපනය සඳහා යොමු කිරීමත්, සමාජයතුළ පීඩාවට පත් විය හැකි කණ්ඩායම්වල දැනුම, හැකියාව, ආකල්ප වර්ධනය තුළින් ඔවුන් සමාජගත කිරීම තහවුරු වේ.

6. කාන්තා නායකත්වය සමාජ ඒකාබද්ධතාවය සඳහා සවිබලගැන්වීම.

කාන්තාව සමාජයේ ඉටුකරන්නා වූ මෙහෙවර ශක්කිමත් කිරීමට ඔවුන් සමාජ ඒකාබද්ධතාවය සඳහා සවිබල ගැන්වීමේ අභිලාෂයෙන් ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය මගින් සමාජ ඒකාබද්ධතාවය සඳහා කාන්තා නායිකාවන් බලගැන්වීමේ වැඩසටහන ආරම්භ කරන ලදී. වසරක කාලයක් තුළ ක්‍රියාත්මක වැඩසටහනක් වන මෙහි මූලික අරමුණ වනුයේ කාන්තාවන් 30 දෙනෙකු කාන්තා නායිකාවන් ලෙස සමාජ ඒකාබද්ධතාවය සඳහා බලගැන්වීමයි. මේ සඳහා මූල්‍ය අනුග්‍රහය ලබා දෙනු ලබන්නේ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) යටතේ වූ නීතිය බලාත්මක කිරීමත් යුක්ති දාමයට සමප්‍රවේශයත් සමාජ ඒකාබද්ධතාවත් ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය (SELAJSI) මගිනි. අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ වන මෙම වැඩසටහන සමග ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යාංශය ද එක්ව කටයුතු කරන ලදී. SearchFor Common Ground (SFCG) රාජ්‍ය නොවන ආයතනය මගින් මෙම වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී. මේ සඳහා මොණරාගල හා කිලිනොච්චිය යන දිස්ත්‍රික්කයන්හි කාන්තාවන් 15 දෙනා බැගින් 30 දෙනෙකු තෝරා ගන්නා ලදී.

ඔවුන් සඳහා නායකත්වය, සමාජ ඒකාබද්ධතාවය, සන්නිවේදනය, ස්ත්‍රී පුරුෂ සමාජභාවය, සහ අධිවාචනය(Advocacy) ලෙස පුහුණු වැඩමුළු 05 ක් පවත්වන ලදී.

මෙම පුහුණු වැඩමුළු තුලින් ලබාගත් දැනුම ක්‍රියාවට නැංවීම සඳහා මෙම කාන්තාවන්ට තම දිස්ත්‍රික් දෙකෙහි සමාජ ඒකාබද්ධතාවය, භාෂාව හා එක්සත්කමට අදාලව ව්‍යාපෘති 03ක් ක්‍රියාවට නංවන ලදී. නිරාවරණ සංචාරයක් හා දිස්ත්‍රික් රැස්වීම් පැවැත්වීම තුලින් මෙම වැඩසටහන ප්‍රායෝගිකව ක්‍රියාවට නැංවීම පහසුවිය. මෙම වැඩසටහන 2013 වසරේ අවසන් කාර්තුවේ ආරම්භ කර 2014 වසර පුරා ක්‍රියාත්මක කර ඇත.

7. සංස්කෘතික හා ආගමික උත්සව

බහු වාර්ගික රටක් වන ශ්‍රී ලංකාව තුළ සිංහල, දමිළ සහ මුස්ලිම් යන ජන වර්ග ජීවත් වේ. මෙම ජන වර්ග අනුව ඔවුන්ගේ ආගම, සංස්කෘතිය එකිනෙකට වෙනස්වේ. තෛපොංගල් උත්සවය, සිංහල හින්දු අලුත් අවුරුදු උත්සවය, හජ්ජි උත්සවය, දීපාවලී, සරස්වතී පූජාව, නත්තල් උත්සවය එම සංස්කෘතික උත්සව වේ. මෙවැනි එකිනෙකට වෙනස් ආගමික හා සංස්කෘතික උත්සව සැමරීම අප අමාත්‍යාංශය මගින් සෑම වසරකම සිදු කරයි. එකම සමාජයක් තුළ එකිනෙකට වෙනස් ආගම සහ සංස්කෘතික වටිනාකම් පිළිබඳ හඳුනා ගැනීමට මෙම අවස්ථාව උදාවේ.

එමගින් ශ්‍රී ලාංකේය සමාජය තුළ ජීවත් වන එක් එක් ජන වර්ගය තුළ අන්‍යෝන්‍ය විශ්වාසය, අවබෝධය සහ අන්‍යෝන්‍ය ගරුත්වය හා පිළිගැනීම තහවුරුවේ. වර්ග භේදයකින් තොර සියළුම ජන වර්ග මෙම උත්සව සඳහා සහභාගී වේ.

2014 වර්ෂයේ අප අමාත්‍යාංශය මගින් මෙවැනි උත්සව දිවයින පුරා පැවැත්වූහ. යාපනය, රත්නපුර, මාතලේ, පුත්තලම, මීගමුව, කොළඹ එම උත්සව පැවැත්වූ දිස්ත්‍රික්ක කිහිපයක් වේ.

8. බාහිර ආයතන ක්‍රියාත්මක කරන සමාජ ඒකාබද්ධතා සඳහා මූල්‍යඅනුග්‍රහය ලබා දීම

සමාජ ඒකාබද්ධතාවය ගොඩනැංවීමේ අරමුණින් සමාජ ඒකාබද්ධතාවයට අදාළ වැඩසටහන් අනෙකුත් ආයතන හා එක්ව පැවැත්වීම හෝ මූල්‍ය දායකත්වය ලබාදීම අප අමාත්‍යාංශය මගින් සිදු කරනු ලබයි. ඒ අනුව 2014 වර්ෂයේදී මූල්‍යමය අනුග්‍රහය ලබා දුන් වැඩසටහන් පහත දැක්වේ.

1 ජනතාව අතර සංස්කෘතික සංහිඳියාව හා උසස් රසඥතාවයක් ඇති කිරීම සඳහා ලංකා ගිටාර් වාදකයින්ගේ සංගමය විසින් ඉදිරිපත් කල "ගිටාර් වාදන ප්‍රසංගය"

2 සෞන්දර්යාත්මක මාධ්‍යයන් ඔස්සේ තිරසාර අන්තර් සාමුහික සංහිඳියාවක් ගොඩනැංවීම සඳහාහෝමාගම මහින්ද රාජපක්ෂ විද්‍යාලය මගින් ඉදිරිපත් කළ "මිහිසර ප්‍රසංගය - 3" සහ ත්‍රිකෝණීසංස්කෘතික පදනම මගින් ඉදිරිපත් කළ "ධවල භීෂණ ප්‍රදර්ශනය"

3 ජන කණ්ඩායම් අතර අන්‍යෝන්‍ය විශ්වාසය, ගෞරවය, පිළිගැනීම ඇති කිරීම හා විවිධ සංස්කෘතින් හඳුනා ගැනීමේ අවස්ථාව ලෙස අවුරුදු උත්සව 07 ක් සඳහා මුල්‍ය අනුග්‍රහය ලබා දෙන ලදී. ඒවා නම්

- "සිගිති අවුරුදු උත්සවය"- ඇඹිලිපිටිය,
- "සුරල් නද" - ඉඹුල්පේ,
- "සමාජ ඒකාබද්ධතා බක්මහ සැණකෙළිය"- ඇහැළියගොඩ ප්‍රා.ලේ. කොට්ඨාශ දෙකක පැවැත් විය.
- "සහෝදරත්වයේ බක්මහ සැණකෙළිය"- කුරුවිට,

4 උතුරු පළාතේ දමිළ සංස්කෘතිය පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම හා සංස්කෘතික හුවමාරුව තුළින් ජාතීන් අතර සුහදතාව ගොඩනැංවීම සඳහා ගොවිජන අයිතීන් සුරකීමේ ජාතික සංධානය විසින් සංවිධානය කළ"අපි වවමු ජාතීන් අතර සහෝදරත්වය නගමු ශ්‍රී ලාංකේය ජාතිය" වැඩසටහන සහ අ / නිකවැව අනුර මහා විද්‍යාලය විසින් සංවිධානය කළ"ත්‍රී භාෂා සංවර්ධන හා සංස්කෘතික හුවමාරු වැඩසටහන"

5 "විවිධත්වයේ එකමුතුව ශක්තිමත් වූ ද්විභාෂාවෙන් හෘදයාංගමව බැඳුණු සියලූ ජන සංස්කෘතික අනන්‍යතාවයන් සුරකින සමගි සම්පන්න ශ්‍රී ලංකීය ජාතියක් ගොඩනගමූ" යන අමාත්‍යතුමාගේ පණිවිඩයත් සමග ලංකා ජනරජ සෞඛ්‍ය සේවකයන්ගේ 60 වන සංවත්සර සමරු කලාපයේ පිටුවක් අමාත්‍යාංශය වෙනුවෙන් වෙන් කරන ලදී.

6 ආගමික භක්තිය ඇති කිරීම, සහජීවනයේ වැදගත්කම, සුහදතාව, එකමුතුකම ඇතිකිරීම සඳහා ඇහැලියගොඩ ප්‍රා.ලේ.කාර්යාලය විසින් සංවිධානය කරන ලද"අසිරිමත් බුදු තෙමඟුල" හඳබැතියෙන් සමරන සඳහම් උදානය වැඩසටහන.

7 ජාතික හා ආගමික සමගිය සඳහා වන ළමා පදනම මගින් ඉදිරිපත් කළ"සාමයේ ගීතය" සහ සමාජ ඒකාබද්ධතා එකමුතු සංසදය විසින් ඉදාරිපත් කළ"සංකලන ගී" වැඩසටහන

තවද ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මගින් වැඩසටහන් ක්‍රියාත්මක කරයි. ඒ අතර

- "ළමයින්ට සහ කාන්තාවන්ට හිතකර හෙට දිනක්" යනුවෙන් ළමයින් සහ කාන්තාවන් දැනුවත් කිරීමේ වැඩසටහන.
- කාන්තා දිනයට සමගාමීව "රැකියා නියුක්ත කාන්තාවගේ දෛනික ජීවිතය හා මානසික ආතතිය" දැනුවත් කිරීමේ වැඩසටහන.
- "බෞද්ධ දෘෂ්ඨිකෝණට අනුව කාන්තාව" සහ "ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය අගයමු" යන වැඩසටහන් අමාත්‍යාංශ ශ්‍රවණාගාරයේදී පවත්වන ලදී.
- ලෝක ළමා දිනයට සමගාමීව රත්මලාන අන්ධ විද්‍යාලයේදී " සෙනහසදී අප රකින්න"වැඩසටහන .
- ගැහැණු දරුවාගේ ජාත්‍යන්තර දිනය වෙනුවෙන් "දියණිය ඔබයි අපේ අනාගතය"වැඩසටහන මහරගම සුචරිත ළමා නිවාසයේදී පවත්වන ලදී.

ජාතික භාෂා අධ්‍යාපන හා පුහුණු ආයතනය මගින් පැවැත් වූ පුනරුත්ථාපනය කළ තරුණ කොටස් ඒකාබද්ධ කිරීමේ වැඩසටහන සඳහා අමාත්‍යාංශය විසින් රු. 242,111.60 ක ප්‍රතිපාදන ලබා දී ඇත.

03.3 ආයතන අංශය

හැඳින්වීම

අමාත්‍යාංශයේ ආයතනික පරිපාලනය, මානව හා භෞතික සම්පත් කළමණාකරණය කිරීම පාලන අංශයේ ප්‍රධාන කාර්යයන් වේ. අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලය සඳහා නව තනතුරු ඇති කිරීම යටතේ නීති නිළධාරී තනතුරක් අනුමත කර ගැනීම හා අභ්‍යන්තර විගණක තනතුර උසස් කිරීම මෙම වසර තුළ සිදු කර ඇත. පළාත් කාර්යාල 8ක් සඳහා අමාත්‍යාංශය යටතේ තනතුරු 64ක් සහ අමාත්‍යාංශයේ අනුබද්ධ ආයතන යටතේ තනතුරු 20ක් අනුමත කර ඇත.

පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා අමාත්‍යාංශය විසින් කාර්යාල කාර්ය සහයක තනතුරු 3ක් රියදුරු තනතුරු 1ක් සහ භාෂා ඇමතුම් සම්බන්ධීකාරක තනතුරු 3ක් සඳහා නිලධාරීන් බඳවා ගන්නා ලදී. ජාතික ඒකාබද්ධතා සම්බන්ධීකාරක තනතුරු 205ක් සඳහා නිළධාරීන් බඳවා ගැනීමට අදාළ බඳවා ගැනීම් පටිපාටිය අනුව කටයුතු කර නොවැම්බර් මාසය තුළදී පත්වීම් ලබා දීමට සහ සේවා ආරම්භක පුහුණුව හා භාෂා පුහුණුව ලබා දීමට සැලසුම් කර තිබේ. පළාත් මධ්‍යස්ථාන 2ක් සඳහා වැඩ බලන සහකාර අධ්‍යක්ෂකවරුන් පත්කළ අතර සංවර්ධන නිලධාරීන් ද පත්කර ඇත. කාර්යාල කාර්ය සහයක වරුන් බඳවා ගැනීමට අයදුම්පත් කැඳවා ඇත.

අමාත්‍යාංශයේ හා ක්ෂේත්‍රයේ රාජකාරී කරන නිලධාරීන් සඳහා භාෂා පුහුණු පාඨමාලාව පවත්වා ඇති අතර හඳුනාගත් පුහුණු අවශ්‍යතා අනුව නිලධාරීන් ට අවශ්‍ය පුහුණු අවස්ථා ලබා දෙන ලදී.

කළමණාකරණ ප්‍රතිසංස්කරණ යටතේ කාර්යයන් සහ වැඩ ක්‍රියාවලී සමාලෝචන වාර්තාවේ නිර්දේශ ක්‍රියාවට නංවමින් පවතින අතර ඉන් නිර්දේශ කීපයක් ක්‍රියාවට නංවා අවසන් කර ඇත.

අමාත්‍යාංශයේ වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම සඳහා නිලධාරීන් පුහුණු වැඩසටහනක් පවත්වා යාවත්කාලීන කරන ලදි. අමාත්‍යාංශය සඳහා නව විද්‍යුත් තැපැල් ලිපින සකස් කිරීමේ කටයුතු සිදු කරමින් පවතී. භාෂා ඇමතුම් මධ්‍යස්ථාන සඳහා ලැබෙන දුරකථන ඇමතුම් පටිගත වීමේ පහසුකම් හා දත්ත පද්ධතියක් සමග වැඩි දියුණු කිරීමට අවශ්‍ය කටයුතු කරන ලදී.

2014 වසරේ දෙසැම්බර් මස වන විට ප්‍රසම්පාදනය යටතේ ඉටු කළ ප්‍රධාන කාර්යයන් වන්නේ,කුලියාපිටියේ පැවති දැයට කිරුළ ප්‍රදර්ශනයේ කුටිය නිර්මාණය හා එහි සියළු සම්බන්ධීකරණ කාර්යයන්ද,ජාතික සමගියේ මහා සමුළුවේ ඉසව් කළමනාකරණ කාර්යයන් හා සමුළු කාර්යාලය පිළිබඳ කාර්යයන් ද,සමාජ ඒකාබද්ධතා සතියට සමගාමීව සිදු කරන ලද උතුරු හා සබරගමු පළාත් මධ්‍යස්ථාන ස්ථාපනය හා විවෘත කිරීමට අදාළ කාර්යයන් ද, සමාජ ඒකාබද්ධතා සතියේ සරුංගල් උත්සවයේ ප්‍රසම්පාදන කටයුතු ද ,අමාත්‍යාංශයේ භාෂා ඇමතුම් මධ්‍යස්ථානයට Sip Trunk පහසුකම ලබාදීමේ කටයුතු ද ,ගරු නියෝජ්‍ය අමාත්‍ය තුමාගේ කාර්යාලය ස්ථාපිත කිරිම සම්බන්ධ කටයුතු ද, මාධ්‍ය ඒකකය සඳහා අලුතින් වීඩියෝ කැමරාවක් මිලදි ගැනීම ආදිය වේ.තවද භාෂා අංශයේ කටයුතු සඳහා තොරතුරු කළමනාකරණ පරිගණක පද්ධතියක් සකස් කිරිමේ හා SELAJSI ව්‍යාපෘතියේ ප්‍රසම්පාදන කටයුතු මේ වන විට ඉටු කරමින් පවතින කට යුතු අතර වේ.

03.4 සැලසුම් අංශය

හැඳින්වීම

සැලසුම් අංශය, ජාතික භාෂා සහ සමාජඒකාබද්ධතා අමාත්‍යාංශයේ ප්‍රධාන අංශවලින් එකකි. ජනනය කරනු ලබන ප්‍රතිඵල ,කාර්යක්ෂමතාව සහ සඵලතාව පිළිබඳ තොරතුරු ලබාගැනීම සඳහා ක්ෂේත්‍ර මට්ටමේ ක්‍රියාත්මක කරන ව්‍යාපෘති / වැඩසටහන් අධීක්ෂණය හා ඇගයීම සිදු කරනු ලැබේ.මාසිකව, ත්‍රෛමාසිකව සහ වාර්ෂිකව ප්‍රගති වාර්තා පිළියෙල කර ඉහළ කළමනාකාරිත්වය සහ මුදල් සහ ක්‍රම සම්පාදන අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනුලැබේ.

සැලසුම් අංශයේ කාර්යයන් වනුයේ

- ආයතනික සැලසුම්, ක්‍රියාකාරී සැලසුම්, අයවැය දෙපාර්තමේන්තු ආදී දිගුකාලීන / කෙටි කාලීන සැලසුම් පිළියෙල කිරීම සඳහා අමාත්‍යාංශයේ විවිධ අංශ සහ අමාත්‍යාංශය යටතේ ඇති ආයතන සමග සම්බන්ධීකරණය
- අමාත්‍යාංශය මගින් හඳුනා ගත් නියමු ව්‍යාපෘතිවලට අදාල ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය
- අමාත්‍යාංශය සහ ඒ යටතේ ඇති ආයතන මගින් ඉටු කිරීමට බාර ගෙන ඇති ක්‍රියාකාරකම් අධීක්ෂණය සහ ඇගයීම
- මාසික, ත්‍රෛමාසික සහ වාර්ෂික ප්‍රගති වාර්තා පිළියෙල කිරීම සහ ඒවා අමාත්‍යාංශයේ ලේකම්, ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව, ජාතික අයවැය දෙපාර්තමේන්තුව, විදේශාධාර සහ අයවැය අධීක්ෂණ දෙපාර්තමේන්තුව සහ උනන්දුවක් දක්වන අනෙකුත් පාර්ශ්වවලට ඉදිරිපත් කිරීම
- ප්‍රගතිය හා ක්‍රියාකාරී සැලැස්ම වාර්තාව සකස්කොට අයවැය සකච්ජාවන්හි දී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම
- අංශයේ දත්ත සමුදාය පවත්වාගෙන යාම, යාවත්කාලීන කිරීම සහ සංවර්ධනය කිරීම
- වාර්ෂික කාර්යසාධක වාර්තාව පිළියෙල කොට පාර්ලිමේන්තුවට, මුදල් අමාත්‍යංශයට හා විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම

03.5 ගිණුම් අංශය

හැඳින්වීම

මෙම අංශය මගින් මූල්‍ය සේවා සැපයීමේ කටයුතු සම්බන්ධීකරණය සහ අදාළ අංශ සම්බන්ධීකරණය කිරීමෙන් අමාත්‍යාංශය සඳහා සාධනීය මූල්‍ය තොරතුරු සහ මූල්‍ය කළමනාකරණ පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබයි.

ගිණුම් අංශයේ කාර්යයන් වනුයේ

- ප්‍රධාන ගණන් තැබීමේ නිලධාරියා ලෙස අමාත්‍යාංශ ලේකම්වරයාට අමාත්‍යාංශයේ මූල්‍ය බැඳීම් ඉටු කරලීමට සහ පාර්ලිමේන්තුව වෙත වගවීම දැරීමට සහාය වීම.
- රජයේ මූල්‍ය නීතිරීති සහ රෙගුලාසි සමග අනුකූලතාව සහතික කිරීම.
- මුදල් කළමනාකරණය ඇතුළුව, යහපත් මූල්‍ය ගිණුම්කරණ පද්ධතියක් ස්ථාපනය කිරීම සහ පවත්වාගෙන යාම.
- මූල්‍ය වාර්තා සහ අයවැය අවශ්‍යතා පිළියෙල කිරීම / යාවත්කාලීන කිරීම /සමාලෝචනය කිරීම සහ ගිණුම් පියවීම සඳහා භාණ්ඩාගාරය, අමාත්‍යාංශය යටතේ පවතින ආයතන සහ විදේශ ආධාර ලබන ව්‍යාපෘති සමග සම්බන්ධීකරණය .
- මූල්‍ය සැලසුම්කරණය සහ අය වැයකරණය.
- කාලීන සහ නිවැරදි මූල්‍ය වාර්තාකරණය සහතික කිරීම.
- අමාත්‍යාංශ වත්කම් කළමනාකරණය .

03.6 අභ්‍යන්තර විගණන අංශය

හැඳින්වීම

අමාත්‍යාංශයේ හා ඒ යටතේ පවතින ආයතන වල සියළුම මට්ටම් වෙතින් ඉටු කෙරෙන සේවාවන් හා කාර්යයන් සමාලෝචනය, මැන බැලීම, ඇගයීම හා අභ්‍යන්තර පාලන ක්‍රමයේ සිද්ධිදායකභාවය සම්බන්ධයෙන් වාර්තා කිරීම මගින් කළමනාකරණයට සහාය වීම.

අභ්‍යන්තර විගණන අංශය ශක්තිමත් කිරීම සඳහා මෙතෙක් පැවති අභ්‍යන්තර විගණක (ශ්‍රී.ලං.ග.සේ III) වනපන්තියේ තනතුර(ශ්‍රී.ලං.ග.සේ I) පන්තියේ තනතුරක් ලෙස සංශෝධනය කර අනුමත කර ඇත.

අභ්‍යන්තර විගණන අංශයේ කාර්යයන් වනුයේ

- වැරදි හා වංචන වැළැක්වීම සඳහා අමාත්‍යාංශයේ හා ඒ යටතේ පවතින ආයතන තුල ක්‍රියාත්මක වන අභ්‍යන්තර පාලන ක්‍රමයේ සාර්ථකත්වය ඇගයීම හා අභ්‍යන්තර පාලනය ශක්තිමත් කිරීමට සහාය වීම.
- ගිණුම් හා වෙනත් වාර්තා වල විශ්වාසනීයභාවය නිශ්චය කිරීම හා යොදාගෙන ඇති පිළිගත් ගිණුම්කරන පිළිවෙත් මගින් නිවැරදි මූල්‍ය ප්‍රකාශනයන් පිළියෙල කිරීම සඳහා අවශ්‍ය තොරතුරු සැපයේදැයි සොයා බැලීම.
- කාර්ය මණ්ඩලයට පවරා ඇති වගකීම් ඉටුකිරීමෙහිලා ඔවුන්ගේ කාර්යසාධනයේ ගුණාත්මකභාවය ඇගයීම.
- අමාත්‍යාංශයේ හා ඒ යටතේ පවතින ආයතන වල වත්කම් සියළුම ආකාරයේ අලාභහානි වලින් කොතරම්දුරට ආරක්ෂා වේදැයි සොයා බැලීම.
- ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි, රාජ්‍ය පරිපාලන, භාණ්ඩාගාර හා වෙනත් චක්‍රලේඛ හා උපදෙස් පිළිපදිනු ලැබේදැයි සොයා බැලීම.
- අවශ්‍ය අවස්ථාවලදී විශේෂ විමර්ශන පැවැත්වීම.
- විගණන හා කළමනාකරණ කමිටු පැවැත්වීම.

04. රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව සහ එහි ප්‍රගතිය

04.රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව

හැඳින්වීම

1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනත ක්‍රියාත්මක කිරීමේ ආයතනය ලෙස 1956.10.01 දින රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව ස්ථාපනය කරන ලදී. 1987 ,13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සහ 1988 -16 වන ව්‍යවස්ථා සංශෝධනය අනුව සිංහල හා දෙමළ භාෂා දෙකම ශ්‍රී ලංකාවේ රාජ්‍ය භාෂා බවට පත් කෙරුණු අතර, ඉංග්‍රීසි සන්ධාන භාෂාව ලෙස නම් කෙරිණි.

ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ 18 හා 19 වන ව්‍යවස්ථාවල සඳහන් වන පරිදි රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය කාර්යක්ෂම ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා පහසුකම් සලසන්නා ලෙස ඉහත සඳහන් භාෂා තුනට අදාළ පර්වර්තන කටයුතු රජයට සපයාදීමත්, රාජ්‍ය සේවකයන්ගේ භාෂා නිපුණතා වැඩිදියුණු කිරීමත්, පාරිභාෂික ශබ්දමාලා සකස් කිරීමත්, රාජ්‍ය භාෂා පෙළ පොත් සහ ශබ්ද කෝෂ සම්පාදනය කිරීමත් රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව මගින් සිදුකරනු ලබයි.ෂීභාෂා මන්දිරය෴, අංක 341/7, කෝට්ටේ පාර, රාජගිරිය යන ලිපිනයේ පිහිටා ඇති මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන තනතුර රාජ්‍ය භාෂා කොමසාරිස් විසින් හොබවනු ලබයි.

දැක්ම

සහජීවනයෙන් පිරිපුන් සාමකාමී ත්‍රෛභාෂික සමාජයක්

මෙහෙවර

ජනවාර්ගික සමගිය හා සාමය අරමුණු කරගත් රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය කාර්යක්ෂමව ක්‍රියාවට නැංවීම සඳහා පහසුකම් සැලසීම හා සම්බන්ධීකරණය

දෙපාර්තමේන්තුව මගින් ඉටුකරනු ලබන ප්‍රධාන කාර්යයන්

1.රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2007 හා 07/2007 පරිදි රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබාගැනීමට නියමිත නිලධාරින් සඳහා අදාල ලිඛිත හා වාචික පරීක්ෂණ පැවැත්වීම හා සහතිකපත් නිකුත් කිරීම.

2.රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතනවල පරිවර්තන කාර්යයන් ඉටුකිරීම.(සිංහල, දෙමළ,ඉංග්‍රීසි)

3.විවිධ විෂයයන් සඳහා සිංහල ,දෙමළ,ඉංග්‍රීසි පාරිභාෂික පදමාලා සම්පාදනය කිරීම.

4.රජයේ නිලධාරීන්ගේ භාෂා ප්‍රවීණතා විභාග සඳහා වන පෙළ පොත්, ආධාරක ග්‍රන්ථ සම්පාදනය කිරීම හා අලෙවි කිරීම.

5. ත්‍රිභාෂා ශබ්ද කෝෂයන් සැකසීම

6.නවීන තාක්ෂණික ක්‍රම උපයෝගි කරගනිමින් සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂා මෙන්ම ජාත්‍යන්තර භාෂා ඉගැන්වීම හා විභාග පැවැත්වීම

7. බාහිර ආයතනවල කාර්ය මණ්ඩල සඳහා භාෂා ප්‍රවීණතා විභාග හා කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්විම

8.විශ්වවිද්‍යාල හා පිළිගත් අධ්‍යාපනික ආයතනවල භාෂා පරිවර්තන පාඨමාලා හදාරන්නන්ට ප්‍රායෝගික පුහුණුව ලබාදීම

ඉහත කාර්යන් ඉටුකිරීම සඳහා දෙපාර්තමේන්තුවතුළ සංවර්ධන,විභාග,භාෂා පරිවර්තන, භාෂා විද්‍යාගාරය, ප්‍රකාශන හා අලෙවි, පදමාලාසම්පාදන, පර්යේෂණ, පුස්තකාලය යන අංශස්ථාපනයකොටඇත.

ක්‍රියාකාරි සැලැස්මට අනුව කාර්යසාධනය

රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව



අනු අංකය	විස්තරය	ඇස්මේන්තුගත වියදම (රුපි.)	සත්‍ය වියදම (රුපි.)	ප්‍රතිශතය
01	භාෂා ප්‍රවීණතාවය ලබා ගැනීමට උපකාරී වන ග්‍රන්ථ හා අභ්‍යාස පොත් මුද්‍රණය සහ භාෂා ප්‍රවීණතා විභාග පැවැත්වීම	23,000,000.00	10,341,226.90	44.96%
02	රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතන සඳහා භාෂා පරිවර්තන සේවාවන් සැපයීම සහපාරිභාෂිත පදමාලා සැකසීම	2,350,000.00	2,175,210.00	92.56%
03	ජාතික හා ජාත්‍යන්තර භාෂා ප්‍රවර්ධනය කිරිම	1,900,000.00	1,031,344.00	54.28%
04	මානව සම්පත් සංවර්ධනය සහ ආයතනික සංවර්ධනය	1,000,000.00	1,000,000.00	100%
05	දැයට කිරුළ ජාතික සංවර්ධන වැඩසටහන	1,500,000.00	411,305.00	27.42%
	එකතුව	**29,750,000.00**	**14,959,085.00**	**49.07%**

2014 වසර තුළ ඉටුකරන ලද කාර්යයන් හා ප්‍රගතිය

1.භාෂා ප්‍රවීණතා විභාග පැවැත්වීම

රජයේ නිලධාරීන්ගේ භාෂා කුසලතාවය තක්සේරු කිරීම හා ත්‍රෛභාෂා ප්‍රවීණතාව ලබාගැනීම සඳහා දිරිගැන්වීම අරමුණු කරගනිමින් විභාග පැවැත්වීම, ප්‍රතිඵල නිකුත් කිරීම හා සහතිකපත් ප්‍රදානය කිරීම සිදුකරනු ලබයි.

භාෂා ප්‍රවීණතා වාචික (නැවත) පරීක්ෂණයක් ඌව පළාතේ අපේක්ෂකයින් 146 දෙනෙකුගේ සහභාගීත්වයෙන් 2014.01.11 දින පැවැත්වු අතර ඊට සමගාමී බස්නාහිර පළාත් විභාගය 2014.02.10,11 හා 12 යන දිනයන් හි අපේක්ෂකයින් 358 දෙනෙකුගේ සහභාගීත්වයෙන් පවත්වන ලදී.

2013.09.29 දින පැවැත් වූ ලිඛිත විභාගයට අදාල III මට්ටම වාචික පරීක්ෂණ 2014.07.19 හා 20 යන දිනයන්හි සබරගමුව පළාතේ අපේක්ෂකයින් 1198ක් සඳහා ද 2014.07.18,19 හා 20 යන දිනයන්හි නැගෙනහිර පළාතේ අපේක්ෂකයින් 1675ක් හා 2014.07.26 හා 27 යන දිනයන්හි මධ්‍යම පළාතේ අපේක්ෂකයින් 2588ක් සඳහා වාචික පරීක්ෂණ පවත්වන ලදී.

2014 රාජ්‍ය භාෂා ප්‍රවීණතා වාචික පරීක්ෂණ පළාත් මට්ටමින් පැවැත්වීම මුල්කර ගනිමින් වයඹ පළාතේ අපේක්ෂකයින් 2549 දෙනෙකු සඳහා 2014.11.15/ 16/ 23 හා 29 යන දිනයන්හි ද දකුණු පළාතේ අපේක්ෂකයින් 3821 දෙනෙකු සඳහා 2014.11.15/ 16/ 22/ 23/ 29 හා 30 යන දිනයන්හි විභාගය පවත්වන ලදී. 2014.11.24/ 25/26 දිනයන්හි ඌව පළාතේ අපේක්ෂකයින් 2440 දෙනෙකු සඳහා විභාගය පවත්වන ලදී.

ඒ අනුව 2014 වර්ෂය තුළදී රාජ්‍ය භාෂා ලිඛිත විභාගය හා අ.පො.ස. (සා.පෙ) විභාගයෙන් දෙවනබස සමත් වූ නිලධාරීන් 6007 ක් සඳහා වාචික පරීක්ෂණ දිස්ත්‍රික් මට්ටමින් පවත්වන ලදී.

රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලද නිලධාරින් සඳහා සහතිකපත් නිකුත් කිරීම විභාග අංශය සතු තවත් කාර්යයකි. එහි දී ඌව පළාත් රාජ්‍ය නිලධාරීන් 1222ක් සඳහා 2014.01.11 දින සහතිකපත් බෙදා දෙනු ලැබූ අතර ගරු අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් 2014.10.25 දින ඇහැලියගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී නිලධාරීන් 70 දෙනෙකු සඳහා සහතිකපත් ප්‍රදානය කරන ලදී. සහතිකපත් 603 ක් තැපැල් මගින් අදාල නිලධාරීන්ට යොමුකරන ලදී.

විභාග අංශයේ කාර්යයක් ලෙස බාහිර ආයතන සඳහා විභාග පැවැත්වීම ද සිදුකරනු ලබයි. ඒ අනුව රන්ටැඹේ ජාතික ශිෂ්‍යභට බලකා මූලස්ථානයේ නිලධාරින් 74 දෙනෙකුගේ සහභාගීත්වයෙන් මූලික දෙමළ භාෂා විභාගය 2014.01.20 දින ද කොත්මලේ ජාතික ශිෂ්‍යභට බලකා මූලස්ථානයේ නිලධාරීන් 107 දෙනෙකු සඳහා උසස් දෙමළ විභාගය 2014.03.07 දින ද පවත්වන ලදී. අනුරාධපුර දිස්ත්‍රික්කයේ වාණිජ මණ්ඩලයේ නිලධාරින් 74 දෙනෙකු සඳහා දෙමළ (විශේෂ) ලිඛිත/වාචික විභාගයක් 2014.04.29 දින පවත්වන ලදී. එමෙන් ම රාජ්‍ය භාෂා කොමිෂන් සභා ප්‍රධාන කළමනාකරණ සහකාර පත්කර ගැනීමේ තරග විභාගය 2014.07.05 දින අපේක්ෂයින් 27 දෙනෙකු සඳහා පවත්වන ලදී. භාෂා පරිවර්තක සහකාරවරුන් සඳහා කාර්යක්ෂමතා කඩඉම් විභාගය 2014.10.25, 26 යන දිනයන්හි නිලධාරීන් 09 දෙනෙකුගේ සහභාගීත්වයෙන් පවත්වන ලදී. භාෂා ප්‍රවීණතා විභාග පැවැත්වීම සඳහා 2014 වර්ෂය තුළ වැය වූ මුලු මුදල 5419783.30 කි.

2. භාෂා ප්‍රවීණතාවය ලබා ගැනීමට උපකාරී වන ග්‍රන්ථ හා අභ්‍යාස පොත් මුද්‍රණය

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 07/2007 අදාල වන වෘත්තිකයින්ට හා රාජ්‍ය භාෂා හැදෑරීමට කැමැත්තක් දක්වන සියලුම දෙනාට ලිඛිත මාධ්‍යයක් ලෙස යොදා ගත හැකිවන අයුරින් පෙළපොත් හා අනෙකුත් ආධාරක ග්‍රන්ථ සම්පාදනය කිරීම සහ අලෙවිය ප්‍රකාශන හා අලෙවි අංශයේ ප්‍රධාන කාර්යභාරය වේ. ඒ අනුව 2014 වර්ෂයේදී කථන දෙමළ පොත් පිටපත් 5000ක් , ලේඛන දෙමළ පොත් පිටපත් 3500ක් , අපි සිංහල, දෙමළ, ඉංග්‍රීසි ඉගෙන ගනිමු පොත් පිටපත් 50000ක් හා ත්‍රිභාෂා සගරාවේ පිටපත් 1000ක් මුද්‍රණය කරන ලදී. මේ සඳහා 2014 වර්ෂය තුළ වැය වූ මුලු මුදල 5191443.60කි. ප්‍රකාශන අලෙවිය මගින් රජය ඉපයූ ආදායම රු.44793010.00 කි.

3. රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතන සඳහා භාෂා පරිවර්තන සේවාවන් සැපයීම

සම්මත ක්‍රමයන්ට අනුකූලව තාක්ෂණික ක්‍රම භාවිතයෙන් සිදු කරන ලද ප්‍රමිතියෙන් යුතු පරිවර්තන සේවාවන් සැලසීම පරිවර්තන අංශයේ කාර්යභාරයයි.

ඒ අනුව ජාතික භාෂා ව්‍යාපෘතියේ මූල්‍ය අනුග්‍රහය යටතේ දෙපාර්තමේන්තුවේ තුන්වන මහලේ ස්ථාපිත කරන ලද නවීන පහසුකම් සහිත භාෂා පරිවර්තන මධ්‍යස්ථානය විවෘත කිරීම ජනාධිපති ලේකම් තුමාගේ හා ජාතික භාෂා හා සමජ ඒකාබද්ධතා ගරු අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් 2014.01.03 දින සිදු කරන ලදී. තවද මෙම වර්ෂයේ ජුනි මස සිට දෙසැම්බර් මස දක්වා මසකට දින 05 බැගින් පරිවර්තන පුහුණු වැඩසටහන් පැවැත්විණ. රාජ්‍ය හා අර්ධ රජ්‍ය ආයතනවල භාෂා පරිවර්තනයන් සිදු කිරීම යටතේ එම ආයතන මගින් ලබා දෙනු ලැබූ ලිපි ලේඛන 723න් පිටු 3035 ක් පරිවර්තනය කර අවසන් කරන ලදී.

4. පාරිභාෂිත පදමාලා සැකසීම

විද්වතුන්ගේත්, වෘත්තිකයින්ගේත්, සිසු සහ ලේඛක පිරිසගේත්, පොදුවේ සියලුම ජන කණ්ඩායම්වලත් දැනුම වර්ධනයට ඉවහල්වන අයුරින් නීතිය, අධ්‍යාපනය, ගොඩනැගිලි ඉදිකිරීම්, තොරතුරු තාක්ෂණය, මනෝ විද්‍යාව, සංඛ්‍යානය, කෘෂිකර්මය, ඉතිහාසය, වාග් විද්‍යාව, උද්භිද විද්‍යාව, ගණිතය, භෞතික විද්‍යාව, රාජ්‍ය පරිපාලනය, මුදල් රෙගුලාසි, ඉඩම් නිරවුල් කිරීම්, නාවික හමුදාව, ගුවන් හමුදාව හා පොලිස් දෙපාර්තමේන්තුව යන පදමාලා විෂයයන් 20ක් 2014 වර්ෂය තුළදී සකස්කර අවසන් කරන ලදී.එහිදී නව ත්‍රෛභාෂික පදමාලා සකස් කිරීම සහ දැනට පවතින ද්වීභාෂික පදමාලා ඇසුරින් ත්‍රෛභාෂික පදමාලා සම්පාදනය කිරීම සිදු කරනලදී. ඉංග්‍රීසි*සිංහල පදමාලා සම්පාදනය යටතේ විෂයයන් 12ක ත්‍රෛභාෂික පදමාලා සකස්කර ඇති අතර වෙබ් අඩවියේ ද පළකරන ලදී. අනෙකුත් වීෂයන් සම්පූර්ණ කරමින් පවතී. ඉංග්‍රීසි*දෙමළ පදමාලා සම්පාදනය යටතේ අධ්‍යාපනය, ගොඩනැගිලි ඉදිකිරීම්, වාග් විද්‍යාව හා ඉතිහාසය යන විෂයන්හි ත්‍රෛභාෂික පදමාලා සකස්කර අවසන් කරනලදී.. නීතිය, තොරතුරු තාක්ෂණය, මනෝ විද්‍යාව, සංඛ්‍යානය, කෘෂිකර්මය, උද්භිද විද්‍යාව, ගණිතය, භෞතික විද්‍යාව යන වීෂයයන්හි පදමාලා 85% කින් අවසන් කර ඇති අතර අනෙකුත් විෂයන්හි පද 3500ට වැඩි සංඛ්‍යාවක් රැස්කර පරිවර්තනය කර අවසන් කරන ලදී.

5. ජාතික හා ජාත්‍යන්තර භාෂා ප්‍රවර්ධනය කිරීම

ජාතික හා ජාත්‍යන්තර භාෂා හැදෑරීමට කැමැත්තක් දක්වන පිරිස් සඳහා නවීන තාක්ෂණයෙන් යුත් භාෂා විද්‍යාගාරයක් තුළ

සිංහල, දෙමළ, ඉංග්‍රීසි හා විදේශ භාෂා පාඨමාලා අර්ධ වාර්ෂිකව පැවැත්වීම සිදුකෙරේ.ඒ අනුව 2014 වසර තුළ පාඨමාලා 17 ක් යටතේ සිසුන් 1664 ක් භාෂා අධ්‍යාපනය ලැබීය. එම පාඨමාලා සියල්ල සාර්ථකව අවසන් කෙරුණ අතර ඒ සඳහා වූ සමස්ථ වැය රු.1,031,344.00 කි. පළමු අර්ධවාර්ෂිකය තුල භාෂා පාඨමාලා සාර්ථකව නිමකළ සිසුන් 599 ක් සඳහා සහතිකපත් ප්‍රධානෝත්සවය 2014.12.02 දින ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා ගරු අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණ. මෙම පාඨමාලා මගින් වසර තුළ රජයට ඉපයූ ආදායම රු.11824500 .00කි.

දුරස්ථ අධ්‍යාපන ක්‍රමවේදය ELearning භාවිතා කරමින් ද්විභාෂා දැනුම වර්ධනය කිරීමේ වැඩසටහන (I මට්ටම සඳහා) ක්‍රියාත්මක කිරීම සඳහා Mobitel ආයතනය සමග එකගතාවට එළඹීමේ මූලික කටයුතු සූදානම් කරන ලදී. වැඩසටහන් සම්බන්ධීකරන නිලධාරීන් 04 දෙනෙකු පත්කර විෂය සම්බන්ධව පුහුණු වැඩසටහන් 02ක් පවත්වන ලදී.

6. භාෂා භාවිතය තාක්ෂණය, සම්මතකරණය පිළිබඳ පර්යේෂණ පැවැත්වීම, නිර්දේශ ඉදිරිපත් කිරීම සහ මෙවලම් සම්පාදනය.

වඩාත් නිවැරදි සන්නම් නාම භාවිතයට එක්වීම හා සමාජගත වීම අරමුණු කරගනිමින් සිංහල හා දෙමළ බසින් ඇති සියලූ සන්නම් නාම පිළිබඳ තොරතුරු රැස්කර, ඒ සඳහා අර්ථවත් සිංහල හා දෙමළ වචන සකස් කිරීම දෙපාර්තමේන්තුවේ පර්යේෂණ ඒකකය මගින් සිදුකෙරේ. රාජ්‍ය ආයතන 25කින් පාඨ 112ක් මෙම ඒකකය වෙත යොමුකර තිබූ අතර ආයතන 12 ක සිංහල පාඨ 47ක් දෙමළ භාෂාවෙන් සකසන ලදී.විද්වත් මණ්ඩල සාකච්ඡා 05ක් පවත්වා ඇති අතර ඒ සඳහා සහභාගී කරගන්නා සම්පත්දායකයින්ට දීමනා ගෙවීමට අනුමැතිය ඉල්ලා සිටීමේ ලිපි වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව වෙත යොමුකරන ලදී.

7. රාජ්‍ය නිලධාරීන්ගේ භාෂා ප්‍රවීණතාව පිළිබඳ අමාත්‍ය මණ්ඩලය විසින් පත්කරන ලද කමිටු නිර්දේශ ක්‍රියාත්මක කිරීම.

ඉහත කමිටුවේ අංක 8.2 (අ) නිර්දේශය අනුව රාජ්‍ය නිලධාරීන්ට පහසුවෙන් පරිහරණය කළහැකි සරල බසින් යුත් පෙළ පොත් 04 බැගින් සිංහල හා දෙමළ බසින් සම්පාදනය කිරීම දෙපාර්තමේන්තුවට පැවරී ඇති විශාල කාර්යභාරයකි. ඒ අනුව I,II,III,IV මට්ටම් යටතේ වන පාඩම් ලිවීම 60% කින් අවසන් කරන ලදී. මේ සඳහා දරන ලද වියදම රු.27,00,000 කි.

8. මානව සම්පත් සංවර්ධනය සහ ආයතනික සංවර්ධනය

කාර්යක්ෂම මහජන සේවාවන් සැපයිම සඳහා විෂයානුබද්ධ දැනුමෙන් පිරිපුන් කාර්ය මණ්ඩලයක් ආයතනය තුළ ස්ථාපනය කිරීම අරමුණු කරගනිමින් විෂයානුබද්ධ පුහුණුව, ආකල්ප සංවර්ධනය, ඵලදායිතාව, තොරතුරු තාක්ෂණය හා භාෂා පුහුණුව (සිංහල, දෙමළ හා ඉංග්‍රීසි) යන මාතෘකා යටතේ පුහුණු හා සංවර්ධන වැඩවසටහන් 10ක් සඳහා නිලධාරීන් 115 දෙනෙකු ආයතන අංශය මගින් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය සහ අනෙකුත් ආයතනවලට යොමුකර පුහුණුව ලබාදෙන ලදී.

දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයේ සියලූම නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහනක් 2014.12.29 දින පවත්වන ලදි.තවද බඳවාගැනීමේ පටිපාටියට අනුව ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් භාෂා විද්‍යාගාර අධිකාරී තනතුර සඳහා 2014.07.23 දින නිලධාරියෙක් පත්කරගන්නා ලදී.

දෙපාර්තමේන්තුවේ සියලූම මූල්‍ය කටයුතු හා ප්‍රසම්පාදන කටයුතු ඉටුකිරීම ගිණුම් අංශයෙන් සිදුකරන ප්‍රධාන කාර්යභාරයන්ය. දෙපාර්තමේන්තුව සඳහා වෙන්වන වාර්ෂික ඇස්තමේන්තු ප්‍රතිපාදනවලට යටත්ව සාමාන්‍ය පරිපාලනයට අදාල වැටුප් ගෙවීම වැනි කාර්යයන් සඳහා ප්‍රතිපාදන වියදම් කිරීමත් දෙපාර්තමේන්තුවේ මූලධන ව්‍යාපෘති වලට අදාල ප්‍රසම්පාදන කටයුතු සිදුකිරීමත් මේ යටතේ සිදුකරනලදී.මනා මූල්‍ය පාලනයකින් යුතුව ඉහත කාර්යයන් ඉටුකිරීම මෙන්ම ඒ සම්බන්ධයෙන් මහා භාණ්ඩාගාරයට හා අදාල අනෙකුත් ආයතනවලට වාර්තා කිරීම හා මූල්‍ය ප්‍රගතිය ඉදිරිපත් කිරීමද සිදුකරනු ලැබිණ.එමෙන්ම වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ කටයුතු ද වර්ෂය තුළ ඉටුකරන ලදී. 2014 වසර සඳහා භාණ්ඩාගාරයෙන් වෙන් කළ මුදල රු103,160,000.00ක් වන අතර ,ඉන් දරන ලද වියදම රු95,934,491.15 කි.

දෙපාර්තමේන්තුවේ වාර්ෂික අයවැය තුළ සැලසුම්කර ඇති වැඩසටහන්හි ප්‍රගතිය පවත්වාගෙන යාම සහ ප්‍රගතිය මාසිකව, තෛමාසිකව, අර්ධ වාර්ෂිකව හා වාර්ෂිකව අමාත්‍යාංශය සහ අදාළ අනෙකුත් ආයතන වෙත වාර්තා කිරීම සංවර්ධන අංශයෙන් සිදුකරන ලදී.එසේම අනෙකුත් රේඛීය අමාත්‍යාංශ සමග ඒකාබද්ධව ක්‍රියාත්මක කෙරෙන මානව හිමිකම් ක්‍රියාකාරී සැලැස්ම, උගත් පාඩම් හා ප්‍රතිසංධාන කොමිෂන් සභා සැලැස්ම යටතේ ප්‍රගතිය වාර්තා කිරීම සහ පාර්ලිමේන්තු උපදේශක කාරක සභාවට අදාළ වාර්තා කිරීම් ද නියමිත කාල වකවානු තුළ ඉටුකරන ලදී.

දෙපාර්තමේන්තුවේ පවත්වාගෙන යන අධි ශ්‍රේණියේ පුස්තකාලය මගින් බ්‍රවුන් ක්‍රමය යටතේ දෙපාර්තමේන්තු පාඨකයින්ට පොත් නිකුත් කිරීම, පුස්තකාල දැන්වීම් පුවරුව පවත්වාගෙන යාම , විශේෂාංග ලිපි එකතුවක් පවත්වාගෙන යාම , පුවත්පත්වල පළවන භාෂා ලිපි එකතුවක් පවත්වාගෙන යාම,දෙපාර්තමේන්තුව සම්බන්ධ පුවත්පත් ලිපි එක්රැස් කිරීම,පුස්තකාල සුචිය පරිගණකගත කිරීම මෙම වසර තුළ අඛණ්ඩව සිදු කෙරිණි.එසේම පුස්තකාලයේ පැවති පැරණි රාක්ක වෙනුවට නව රාක්ක යොදා ක්‍රමවත් සහ නවීන මුහුණුවරක් ලබාදීමට ද හැකිවිය.

9. විශේෂ වැඩසටහන් හා අවස්ථා

දැයට කිරුළ ජාතික සංවර්ධන වැඩසටහන

2014 දැයට කිරුළ ජාතික සංවර්ධන වැඩසටහන යටතේ ජාතික සංවර්ධන ක්‍රියාවලියට දායක වීම අරමුණු කරගනිමින් දෙපාර්තමේන්තුව මගින් වැඩසටහන් 6 ක් ක්‍රියාත්මක කරන ලදී.ඒ යටතේ ප්‍රධාන වැඩසටහන් වශයෙන් ප්‍රදර්ශනයෙන් ආවරණය වූ දිස්ත්‍රික්ක තුනෙහි භාෂා ප්‍රවීණතා විභාගය සමත් රාජ්‍ය නිලධාරීන් 736 දෙනෙකු සඳහා ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා ගරු අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් සහතිකපත් ප්‍රදානය කරන ලදී. එමෙන්ම දෙපාර්මේන්තු ප්‍රකාශන අලෙවි සැල පවත්වාගෙන යමින් ප්‍රකාශන 1248 අලෙවි කරනු ලැබූ අතර ඉන් රජයට ඉපයූ ආදායම රු. 2,24,475.00කි.

ප්‍රදර්ශන භූමියේ දී "අපි සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි ඉගෙන ගනිමු" පොතෙහි පිටපත් 18000ක් නොමිලේ බෙදා දෙන ලදි. එමෙන්ම ඉදිරිපත් කරන ලද පරිගණක ආශ්‍රිත භාෂා ක්‍රීඩා සඳහා දෙපාර්තමේන්තුවේ ප්‍රදර්ශන කුටිය වෙත පැමිණි පිරිසෙන් 80%ට වැඩි පිරිසක් සහභාගී වූ අතර 2014.02.24 දින සිට ප්‍රදර්ශනය පැවති සෑම දිනකම උදය හා සවස වශයෙන් දර්ශන වාර 2ක් සමාජ ඒකාබද්ධතාවය තේමා කොටගත් නාට්‍ය 02ක් දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලය විසින් ඉදිරිපත් කරන ලදී.

එමෙන්ම අමාත්‍යාංශ කුටියේ විස්තර කිරීම් සඳහා සිංහල,දෙමළ,මුස්ලිම් ජාතීන් නියෝජනය වන පරිදි නිලධාරීන් තිදෙනෙකු දිනපතා යොදවන ලදී.දෙපාර්තමේන්තු ප්‍රදර්ශන කුටිය පවත්වාගෙන යාමේ සමස්ථ වියදම රු.4,11,305.66 කි.

05. රාජ්‍ය භාෂා කොමිෂන් සභාව සහ එහි ප්‍රගතිය

05.රාජ්‍ය භාෂා කොමිෂන් සභාව

හැඳින්වීම

රාජ්‍ය භාෂා කොමිෂන් සභාව 1991 අංක 18 දරණ රාජ්‍ය භාෂා කොමිෂන් සභා පනත මගින් ස්ථාපිත ව්‍යවස්ථාපිත ආයතනයකි. කොමිෂන් සභාවේ අරමුණ වන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ෂඩ වන පරිච්ඡේදයේ අන්තර්ගත විධිවිධානවලට අනුව ක්‍රියාකිරීම පිළිබඳව විමසිලිමත්වීම සහ අධීක්ෂණය කිරීමයි.

දැක්ම

මහජනයා වෙත සේවය සපයනු ලබන සියලූ ආයතනවල රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සහතික කිරීමට බලගැන්වූ ආයතනය බවට පත්වීම.

මෙහෙවර

රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් විමර්ශනය, අධීක්ෂණය, අධ්‍යාපනය සහ උපදේශනය මගින් මහජනතාවගේ ද්විභාෂාමය අවශ්‍යතා සැපයීම.

අරමුණු

(අ) රාජ්‍ය භාෂා භාවිතය පිළිබඳ ප්‍රතිපත්තිමය මූලධර්ම නිර්දේශ කිරීම සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ අන්තර්ගත විධිවිධාන අනුව ක්‍රියාකිරීම පිළිබඳව විමසිලිමත්වීම හා අධීක්ෂණය කිරීම

(ආ) (මෙහි මින්මතු අදාල භාෂාව යනුවෙන් සඳහන් කරනු ලබන) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 18 වන ව්‍යවස්ථාවෙහි සඳහන් භාෂා භාවිතය, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ භාවාර්ථයට හා චේතනාවට අනුකූලව සිදුවන බවට වගබලා ගැනීම සඳහා අවශ්‍ය විය හැකි සියලූ ක්‍රියාවන් කිරීම සහ පියවර ගැනීම

(ඇ) රාජ්‍ය භාෂා ඇගයීම, දිරිගැන්වීම සහ ඒවායේ තරාතිරම, සමානත්වය සහ භාවිත කිරීමේ අයිතිවාසිකම පිළිගැනීම, පවත්වාගෙන යාම සහ ඉදිරියට ගෙනයාම

(ඈ) සිය මෙහෙවීමෙන් සහ ලැබෙන යම් පැමිණිලිවලට ප්‍රතිචාර වශයෙන් යන දෙආකාරයෙන්ම විමර්ශන පැවැත්වීම හා මේ පනතේ විධිවිධානවලින් සලසා ඇති පරිදි ප්‍රතිකර්ම යෙදීම

උක්ත අරමුණු ඉටුකරගැනීම සඳහා කොමිෂන් සභාව ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් පහත දැක්වෙන ප්‍රධාන කාරණා 04 ට අයත් වේ.

1. අධීක්ෂණය - රාජ්‍ය භාෂා භාවිතය පිළිබඳව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන රාජ්‍ය යාන්ත්‍රණය මගින් නිසිපරිදි අනුගමනය කරන්නේද යන්න සම්බන්ධයෙන් විමසිලිමත්වීම (භාෂා විගණන පැවැත්වීම, පරික්ෂණ හා සමීක්ෂණ පැවැත්වීම)

2. අධ්‍යාපනය - අදාල භාෂාවල තරාතිරම හෝ භාවිතය පිළිබඳව (මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන්, රාජ්‍ය නිලධාරින් දැනුවත් කිරීමේ වැඩසටහන්)

3. විමර්ශනය -ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අන්තර්ගත භාෂා අයිතීන් උල්ලංඝනය කිරීම පිළිබඳ පැමිණිලි

4. උපදේශනය - ප්‍රතිපත්ති මූලධර්ම සම්පාදනය

ඉහත සඳහන් කාණ්ඩවලට ඇතුළත්වන විශේෂිත වැඩසටහන් ද කොමිෂන් සභාව මගින් ක්‍රියාත්මක කර ඇත.

ක්‍රියාකාරි සැලැස්මට අනුව කාර්යසාධනය

රාජ්‍ය භාෂා කොමිෂන් සභාව



රාජ්‍ය භාෂා කොමිසම

අනු අංකය	**විස්තරය**	**ඇස්මේන්තුගත වියදම (රුපි.)**	**සත්‍ය වියදම (රුපි.)**	**ප්‍රතිශතය**
01	අර්ධ රාජ්‍ය ආයතන ප්‍රධානීන් දැනුවත් කිරිම	200,000.00	100,000.00	50%
02	පෞද්ගලික මුල්‍ය ආයතන ප්‍රධානීන් දැනුවත් කිරිම	200,000.00	150,000.00	75%
03	**භාෂා විගණන** 2013 දක්වා විගණනයට ලක්කරන ලද ආයතන වල රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියක්‍රියාත්මක කිරිම සම්බන්ධයෙන් පසු විපරම් කිරිම	200,000.00	100,000.00	50%
04	වර්ෂ 2013දක්වා විගණනයට ලක්කරන ලද සුළු ජන අනුපාතය 15% කට වැඩිප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වල පවතින රාජ්‍ය ආයතන විගණනයට ලක්කිරිම	200,000.00	175,000.00	87.5%
05	රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය උල්ලංඝනය කීම සම්බන්ධයෙන් ලැබෙන පැමිණිලි විමර්ශනය කිරීම	100,000.00	50,000.00	50%
06	දීප ව්‍යාප්තව මහජනතාව දැනුවත් කිරීම	4,000,000.00	2,700,000.00	67.5%
07.	සමාජ ඒකාබද්ධතා සතිය	2,000,000.00	1,900,000.00	95%
	එකතුව	**6,900,000.00**	**5,175,000.00**	**75%**

2014 වර්ෂයේදී කොමිෂන් සභාව මගින් ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් පහත පරිදි වේ.

1. අර්ධ රාජ්‍ය ආයතන ප්‍රධානීන් දැනුවත් කිරීම

මෙම වැඩසටහන යටතේ අධිකාරි සහ මණ්ඩලවල ආයතන ප්‍රධානීන් දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදී.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ (22) (6) ව්‍යවස්ථාවට අනුව සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩල රාජ්‍ය ආයතන ලෙස වර්ග කර ඇත. ඒ අනුව මෙම ආයතනයන් මගින් සේවාවන් සපයන මහජනතාවගේ භාෂා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා එනම්, තමන්ගේ මවුභාෂාවෙන් තමන්ට අවශ්‍ය සේවාවන් ලබා ගැනීම උදෙසා අධිකාරී සහ මණ්ඩල යන ආයතනයන් ද රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියට අනුකූලව කටයුතු කිරීම සිදු කළ යුතුය.

සියළු රාජ්‍ය ආයතනයන් මහජන සේවය සැලසීමේදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV පරිච්ඡේදයේ 22(1),22(2),22(3),22(4) සහ 22(5) වගන්තිවලට අනුකූලව කටයුතු කළ යුතු වේ. ඒ අනුව ආයතනික නාම පුවරුව , අංශ නාම පුවරු, සහ වාහන නාම පුවරු, ත්‍රෛභාෂාවෙන් යෙදීම, මහජනයා වෙත නිකුත් කරනු ලබන සියළු ලේඛන ත්‍රෛභාෂාවෙන් පිළියෙල කිරීම මහජනයා සමග සිදු කරන වාචික සන්නිවේදනය රාජ්‍ය භාෂා වලින් සිදු කිරීමට හැකිවීම සහ ලැබෙන ලිපි සඳහා එම භාෂාවෙන්ම (සිංහල හෝ දෙමළ) පිළිතුරු යැවීම රාජ්‍ය ආයතනයන් මගින් සිදු කල යුතු වේ.

රාජ්‍ය භාෂා කොමිෂන් සභාව වෙත ලැබෙන පැමිණිලි විශ්ලේෂණය කිරීමේදී මණ්ඩල සහ අධිකාරී සම්බන්ධවද පැමිණිලි ඉදිරිපත්වී ඇත. ඒ අනුව භාෂා අයිතිවාසිකම් උල්ලංඝනය කළ අවස්ථාවන් සම්බන්ධයෙන් විමර්ශනයන්ද සිදු කර ඇත.

මෙම තත්වය සලකා බලා ව්‍යවස්ථාපිත මණ්ඩල සහ අධිකාරීවල ආයතන ප්‍රධානීන් රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් දැනුවත් කිරීම සඳහා රාජ්‍ය භාෂා කොමිෂන් සභාව විසින් මෙම දැනුවත් කිරීමේ වැඩසටහන පවත්වන ලදි.

එම වැඩසටහන 2014.06.02 දින ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා ගරු අමාත්‍ය වාසුදේව නානායක්කාර මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් රාජ්‍ය භාෂා කොමිෂන් සභා කාර්යාලයේදී පවත්වන්නට යෙදුණි.

රාජ්‍ය භාෂා කොමිෂන් සභාවේ සභාපති මෙම වැඩසටහනේ අරමුණ පැහැදිලි කල අතර කොළඹ විශ්ව විද්‍යාලයේ නීතිපීඨයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය මේනක හරංකහ මහතා විසින් ශ්‍රී ලංකාවේ රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය නීතිමය ඇසින් සහ එහි ප්‍රායෝගික භාවිතය සම්බන්ධයෙන් දේශනයක් පවත්වන ලදි.මීට අමතරව රාජ්‍ය භාෂා කොමිෂන් සභාවේ ලේකම් සහ රාජ්‍ය භාෂා කොමසාරිස්.ජේ.ඩී.සී. ජයසිංහ මහතා සහ ජාතික භාෂා, අධ්‍යාපන හා පුහුණු ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් ප්‍රසාද් ආර් හේරත් මහතා යන නිලධාරීන් සම්පත් දායකයන් ලෙස සහභාගී වු අතර සාකච්ඡා වාරයක්ද පැවැත්විණි.එහිදී රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේදී පැන නගින ගැටළු හඳුනා ගන්නා ලද අතර එමගැටළු සඳහා යෝජනා ඉදිරිපත් විය.

2. පෞද්ගලික මූල්‍ය ආයතන ප්‍රධානීන් දැනුවත් කිරීම

1991 අංක 18 දරණ පනතින් ස්ථාපිත රාජ්‍ය භාෂා කොමිෂන් සභාව ලාංකීය පුරවැසියන්ට ද්වී භාෂාවෙන් ස්වකීය සේවාවන් ලබා ගැනීම ප්‍රවර්ධන කිරීමෙහිලා විවිධ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම ආරම්භකොට ඇත. උක්ත පනතෙහි 31 වන වගන්තිය අනුව මහජන යහපත පිණිස පොදු ආයතන යටතට නොවැටෙන ආයතන සම්බන්ධයෙන් ද රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියට අදාළ නිර්දේශ නිකුත් කිරීමට කොමිෂන් සභාවට බලය පැවරී ඇත.

ඒ අනුව 2014.12.23 වන දින ශ්‍රී ලංකා මහ බැංකුවේ“බැංකු විදු පියස” ශ්‍රවණාගාරයේදී පෞද්ගලික මූල්‍ය ආයතන ප්‍රධානීන් දැනුවත් කිරීමේ වැඩසටහනක් පැවැත්වීය. පෞද්ගලික මූල්‍ය ආයතන සඳහා මෙවැනි වැඩසටහන් සංවිධානය කරනු ලැබුවේ මහජනයා සමග නිරන්තරයෙන් කටයුතු කරන ආයතන වන බැංකු නොවන මූල්‍ය ආයතන මහජනයා සමග ගණුදෙනු කිරීමේදී භාෂා ගැටලූ ඇතිවන බව රාජ්‍ය භාෂා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් වූ පැමිණිලි ද සැලකිල්ලට ගෙනය. මෙම වැඩසටහන සඳහා පෞද්ගලික මූල්‍ය ආයතන 56ක ප්‍රධානීන් කැඳවූ අතර, ප්‍රධාන ආරාධිත දේශක වශයෙන් කොළඹ විශ්ව විද්‍යාලයේ නීති පීඨයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය මේනක හරන්කහ මහතා ද, ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ආර්.ඩී.ඩබ්. පල්ලේගම මහතා ද, රාජ්‍ය භාෂා කොමිෂන් සභාවේ සභාපති නිමල් ආර් රණවක මහතා ද, රාජ්‍ය භාෂා කොමසාරිස් ජේ.ඩී.සී. ජයසිංහ මහතා ද සහභාගි වූහ.

රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය පිළිබඳ දැනුවත් කිරීමෙන් පසුව පැවති ප්‍රශ්න හා සාකච්ඡා වාරයේ දී පෞද්ගලික මූල්‍ය ආයතනවල රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා පවතින ගැටළු හඳුනා ගත් අතර, ඉන් කිහිපයක් ලෙස පෞද්ගලික මූල්‍ය ආයතන මහජනයා සමග ගණුදෙනු කිරීමේදී භාවිත කරන ලේඛන ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් භාවිතාවීම, එම ආයතනවල විගණන වාර්තා ආදිය ද ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සකස් කිරීම, දෙවන භාෂාව පිළිබඳ දැනුමැති නිලධාරීන්ගේ හිඟතාව ආදිය දැක්විය හැකිය.

එහිදී පෞද්ගලික මූල්‍ය ආයතනවල භාවිත වන ලේඛන රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියට අනුකූලව සකස් කිරීමට රාජ්‍ය භාෂා කොමිෂන් සභාවේ සහයෝගය අවශ්‍ය බවත්, පෞද්ගලික මූල්‍ය ආයතනවල නිළධාරීන්ගේ දෙවන භාෂා හැකියාව වර්ධනය කිරීමට වැඩමුළුවක් අවශ්‍ය බවත් යෝජනා විය. ඒ අනුව, එහි පළමු පියවර වශයෙන් පෞද්ගලික මූල්‍ය ආයතන මහජනයා සමග ගණුදෙනු කිරීමේ දී භාවිත කරනු ලබන ලේඛන රාජ්‍ය භාෂා කොමිෂන් සභාව වෙත ගෙන්වා ගැනීමට තීරණය කෙරිණි.

රාජ්‍ය භාෂා කොමිෂන් සභාවේ සභාපති නිමල් ආර් රණවක මහතා සභාව අමතමින්

රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය පිළිබඳපෞද්ගලික මූල්‍ය ආයතන ප්‍රධානීන් දැනුවත් කිරීමේ වැඩසටහන සහභාගිවූවන්

3. භාෂා විගණන

i. 2013 දක්වා විගණනයට ලක්කරන ලද ආයතනවල රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් පසුවිපරම් කිරීම

2013 වර්ෂය දක්වා විගණනයට ලක්කරන ලද ආයතන සඳහා කොමිෂන් සභාව නිර්දේශ නිකුත් කර ඇත. මෙම නිර්දේශ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අදාළ ආයතන ප්‍රධානීන් කොමිෂන් සභාව වෙත වාර්තා කිරීම සිදුකරයි.

නිර්දේශ ක්‍රියාත්මක කිරීම පරික්ෂා කිරීම පසුවිපරම් භාෂා විගණනවල අරමුණ වේ. 2014 වර්ෂයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 09ක්,පොලිස් ස්ථානය 02ක් සහ රෝහල් 01 ක පසුවිපරම් භාෂා විගණන සිදුකරන ලදි .

ii කොළඹ මහානගර සභාවේ භාෂා විගණනය

මීට අමතරව කොළඹ මහනගර සභාව තුල රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධ ව්‍යාපෘතියක් කොමිෂන් සභාව විසින් සිදුකරන ලදී. මෙහිදී කොළඹ මහනගර සභාවේ දෙපාර්තමේන්තු 16 ක් හා අංශ 214 ක් විගණනයට ලක්කර නිර්දේශ නිකුත් කර ඇත. මේ යටතේ නගර සභා සීමාවේ සියලුම වීථි නාමපුවරු ත්‍රෛභාෂාවෙන් පිළියෙළ කිරීමට පියවර ගෙන ඇත.

සියළුම ආයතනවල රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය මනාව ක්‍රියාත්මක කිරිම තුළින් මහජනතාවට තමන් කැමති භාෂාවෙන් සේවය ලබාගැනීමට හැකියාව මෙමගින් ලැබේ.

iii. වර්ෂ 2013 දක්වා විගණනයට ලක්කරන ලද සුළු ජන අනුපාතය 15% ට වැඩි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල පවතින රාජ්‍ය ආයතන විගණනයට ලක්කිරීම.

රාජ්‍ය භාෂා කොමිෂන් සභාව මගින් 2013 දක්වා විගණනයට ලක් නොකරන ලද රාජ්‍ය ආයතන විගණනය කිරීම මෙම වර්ෂයේදී සිදුකෙරිණි. මෙහිදී ආයතන තේරීමේදී එක් එක් රාජ්‍ය ආයතන පිහිටි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ ජන අනුපාතය ද සැලකිල්ලට ගනු ලැබේ. භාෂාමය සුළුතරය 20% ආසන්න ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල පිහිටි රාජ්‍ය ආයතන විගණනයට ලක්කිරීම විශේෂ අවධානයට ලක්කරයි. මෙම වර්ෂයේදී ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05ක්, පොලිස් ස්ථාන 12ක්, රෝහල් 16ක්,මහනගර සභා 01 ක්,තැපැල් ස්ථාන 01ක් සහ වෙනත් ස්ථාන 03ක් විගණනයට ලක් කරන ලදි.

4. රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියට අනුකූලව දැයට කිරුළ ප්‍රදර්ශන කුටි සමීක්ෂණයට භාජනය කිරීම

1991 අංක 18 දරණ රාජ්‍ය භාෂා කොමිෂන් සභා පනතෙන් පැවරී ඇත් බලතල ප්‍රකාරව රාජ්‍ය භාෂා කොමිෂන් සභාව මගින් 2012 ,2013 සහ 2014 වර්ෂ වලදී දැයට කිරුළ ජාතික සංවර්ධන ප්‍රදර්ශන වලදී රාජ්‍ය ආයතන සහ අර්ධ රාජ්‍ය ආයතන විසින් ඉදිරිපත් කරන ලද ප්‍රදර්ශන කුටි රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියට අනුකූලව ඉදිරිපත් කරන ලද්දේද යන්න පිළිබඳව සමීක්ෂණ සිදු කරනු ලදි.2013 සහ 2014 වර්ෂ වලදී පැවති මෙම භාෂා ඇගයීම් සමීක්ෂණ සඳහා මූල්‍ය දායකත්වය සපයනු ලැබුවේ ජාතික භාෂා ව්‍යාපෘතිය මගිනි.

2014 වර්ෂයේ දැයට කිරුළ ජාතික ප්‍රදර්ශනය කුලියාපිටිය නගරයේ පැවැත්වූ අතර රාජ්‍ය භාෂා කොමිෂන් සභාව ඊට සමගාමීව ප්‍රදර්ශන භූමියේ ඉදිකරනු ලැබූ ප්‍රදර්ශන කුටි රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියට අනුකූලව ඉදිරිපත් කරන ලද්දේද යන්න පිළිබඳව සමීක්ෂණය කරන ලදි.

මෙම සමීක්ෂණයේදී දැයට කිරුළ ප්‍රදර්ශන භූමියේ පැවති රාජ්‍ය අංශයේ ප්‍රදර්ශන කුටි 400 ක් පමණ සමීක්ෂණයට භාජනය කර හොඳම කුටි 3ක් තෝරාගන්නා ලදි.

මෙම ඇගයීමේදී කොළඹ විශ්ව විද්‍යාලයේ විද්‍යාර්ථීන් 30 දෙනෙකුගෙන් සමන්විත කණ්ඩායමක් විසින් අදාළ සියලුම කුටි සමීක්ෂණය කර එකතු කරගත් දත්තයන් වාග් විද්‍යාව පිළිබඳව විශේෂ දැනුමක් සහ අවබෝධයක් සහිත මහාචාර්යවරුන් පස් දෙනෙකුගෙන් සමන්විත විශේෂ මණ්ඩලයක් මගින් ඇගයීමට ලක්කොට මෙම තේරීම සිදු කෙරිණි. ඒ අනුව ශ්‍රී ලංකා මහ බැංකුව,වරාය අධිකාරිය,සහ විදේශ සේවා නියුක්ති කාර්යාංශය යන රාජ්‍ය ආයතන මගින් ඉදිරිපත් කරන ලද කුටි තුන විසින් රාජ්‍ය භාෂා සම්මාන තුන දිනා ගන්නා ලදි.එමෙන්ම එක් එක් ප්‍රදර්ශන කුටිය ලබා ගත් ලකුණු ප්‍රමාණය ඇතුලත් කොට වාර්තාවක් ද පිළියෙල කෙරිණි.

5. රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය උල්ලංඝනය කීම සම්බන්ධයෙන් ලැබෙන පැමිණිලි විමර්ශනය කිරීම

රාජ්‍ය භාෂා කොමිෂන් සභා පනත මගින් හිමිවී ඇති බලතල අනුව 2014 වර්ෂයේදී භාෂා අයිතීන් උල්ලංඝනය වීම් සම්බන්ධයෙන් සිදු කරනු ලැබූ පැමිණිලි විමර්ෂණය කිරීම පහත පරිදි වේ.

වර්ෂය	2014 වර්ෂය තුලදී ලැබුණු පැමිණිලි	2013 වර්ෂයෙන් ඉදිරියට ගෙනා පැමිණිලි	2014 වර්ෂයේ අවසන් කල පැමිණිලි		විමර්ශණය කෙරෙන පැමිණිලි	
			2013 වර්ෂයේ පැමිණිලි	2014 වර්ෂයේ පැමිණිලි	2013	2014
2014	106	88	65	54	23	52

2013 වර්ෂයේදී කොමිෂන් සභාව වෙත පැමිණිලි 156 ක් ලැබුණු අතර එම වර්ෂයේ දෙසැම්බර් මස අවසන් වන විට ඉන් 78ක් විමර්ශනය කර අවසන් කරන ලදි.

2014 වර්ෂයේ දී විමර්ශනය කරන ලද පැමිණිලිවලට අදාලව ක්‍රියාත්මක කරන ලද නිර්දේශ කිහිපයක් පහත පරිදි වේ.

- ලංකා විදුලි බල මණ්ඩලය මගින් පාරිභෝගිකයන් වෙත එවනු ලබන බිල්පත් වල සියලූ උපදෙස් හා නිවේදන ත්‍රෛභාෂාවෙන්ම මුද්‍රණය කිරීම.
- අධ්‍යාපන අමාත්‍යාංශය විසින් විවිධ කරුණු සම්බන්ධයෙන් නිකුත් කරනු ලබන පොදු චක්‍රලේඛ ,ලිපි ත්‍රෛභාෂාවෙන් නිකුත් කිරීම.
- වව්නියාව කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ කාර්යාලයේ නිල නාම පුවරුව ත්‍රෛභාෂාවෙන් සකස් කිරීම.
- මාතර අධිවේගී මාර්ගයේ පිවිසුමේ ඇති "Nilwala Gate" යන්න ත්‍රෛභාෂාවෙන් දක්වා තිබීම.
- අධිවේගී මාර්ගවල මහජන ප්‍රදර්ශිත දැන්වීම් හා විද්‍යුත් නාම පුවරු වල ත්‍රෛභාෂාවෙන් අදාල දැන්වීම් ප්‍රදර්ශනය වීම.
- රාජ්‍ය බැංකු වල මහජන ප්‍රදර්ශිත උපදෙස් පුවරු, දැන්වීම් පුවරු ත්‍රෛභාෂාවෙන් ප්‍රදර්ශනය වීම.

6. පාසල් මට්ටමින් භාෂා කව ඇති කිරීම ප්‍රවර්ධනය කිරීම සහ පාසල් වැඩසටහන් එම කව හරහා ක්‍රියාත්මක කිරීම.

2013 සහ 2014 වර්ෂවල කොමිෂන් සභාව සංවිධානය කරන ලද පාසැල් විවාද තරගවල සහ කථික තරගයේ අත්දැකීම් පදනම් කරගෙන පාසැල් ළමුන් සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ වැදගත්කම කොමිෂන් සභාවේ අවධානයට ලක්විණි. මෙහි ඉදිරි පියවරක් වශයෙන් පාසැල් තුළ භාෂා ප්‍රවර්ධන කව ඇති කිරීමට තීරණය කෙරිණි.

රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් පාසල් ළමුන්ගේ දැනුම, ආකල්ප, අවබෝධය වර්ධනය කිරීම තුළින් ත්‍රෛභාෂික පරිසරයක් ශ්‍රී ලංකාව තුල ස්ථාපිත කිරීමේ දිගුකාලීන අරමුණ ඇතිව භාෂා කව පිහිටුවීම සඳහා රාජ්‍ය භාෂා කොමිෂන් සභාව විසින් පියවර ගන්නා ලදී.

මේ යටතේ දිවයිනේ සියළුම පාසල් තුළ භාෂා කව පිහිටුවීම රාජ්‍ය භාෂා කොමිෂන් සභාව ආපේක්ෂා කරනු ලබයි. මෙහිදී පාසල තුළ ප්‍රධාන නාමපුවරුව ප්‍රදර්ශනයේ සිට පාසල තුළ සිදුකරනු ලබන සියලූ ක්‍රියාකාරකම් ද්විභාෂාවෙන් සිදුකිරීමට අවශ්‍ය කටයුතු භාෂා කව හරහා සිදුකිරීමට නියමිතය.

ද්විභාෂාවෙන් හෘදයංගමව බැඳුණු එකම ලාංකේය ජාතියක් බිහිකිරීමේ අරමුණ තුළට සිසු පරපුර යොමු කිරීම සඳහාත් පාසල් ළමුන් තුළ ත්‍රිභාෂා භාවිත කිරීම සම්බන්ධයෙන් ආකල්ප හා උනන්දුව ඇතිකිරීම සඳහාත් පාසල තුල ඇසෙන, දකින, කියවන සියලූ දෙයම ත්‍රෛභාෂාවෙන් සිදුකිරීම සඳහාත්

අනාගත සමාජය ත්‍රෛභාෂා සමාජයක් බවට පරිවර්තනය කිරීමේ හැකියාව වර්ධනය කිරීම සඳහාත් භාෂා කව පිහිටුවීමේ අරමුණ වේ.

භාෂා කවය තුළ විදුහල්පති ගුරුවරු සහ එක් ශ්‍රේණියකින් එක් ශිෂ්‍යයෙකු බැගින් ශිෂ්‍ය නියෝජිතයන්ගෙන් සමන්විත නිලධාරි මණ්ඩලයකින් සංයුක්ත වේ.

භාෂා කව හරහා ක්‍රියාත්මක කිරීමට හඳුනාගෙන ඇති ක්‍රියාකාරකම් වන්නේ පාසලේ ප්‍රධාන නාම පුවරුවේ සිට අනෙකුත් සියලුම පුවරු ත්‍රිභාෂාවෙන් ම ප්‍රදර්ශනය කිරීම, පාසල තුළ සිදුවන සියලුම ක්‍රියාකාරකම්වලදී සිංහල, දෙමළ, ඉංග්‍රීසි යන භාෂා තුනම භාවිත කිරීම, ත්‍රිභාෂා තරග පවත්වා ජයග්‍රාහකයින්ට ත්‍යාග සහ සහතිකපත් ප්‍රදානය කිරීම, ත්‍රිභාෂා හෝඩිය පාසල තුළ ප්‍රදර්ශනය කිරීම හා දිනපතා, සතිපතා, මාස්පතා, වචන හා වාක්‍ය නිර්මාණය කිරීම සහ ඒ සඳහා ලකුණු ලබාදී ජයග්‍රාහකයින් උනන්දු කිරීමේ වැඩසටහන් පැවැත්වීම, අනෙක් භාෂාවලින් අධ්‍යාපන කටයුතු කරන මිත්‍රත්ව පාසල් කරාගොස් සංස්කෘතිය සහ සුහදත්වය හුවමාරු කරගැනීමේ වැඩසටහන් සංවිධානය කිරීම, ජාතික උත්සවවලදී ත්‍රිභාෂාවම යොදාගනිමින් කටයුතු කිරීම, අවට ජනතාවගේ භාෂා අවශ්‍යතාවලදී ඒවාට සහය ලබාදීම ඇතුළු තවත් ක්‍රියාකාරකම් රැසකි.

භාෂා කව පිහිටුවීම සඳහා රාජ්‍ය භාෂා කොමිෂන් සභාව, අධ්‍යාපන අමාත්‍යාංශය සමග සම්බන්ධ වී අදාළ කාර්යයන් නියාමනය කරනු ලබයි. මේ වෙනුවෙන් පාසල් වෙත නිකුත් කිරීම සඳහා චක්‍රලේඛයක් සකස්කොට ඇති අතර අධ්‍යාපන අමාත්‍යාංශය විසින් එය පාසල් වෙත නිකුත් කිරීමට නියමිතය.

7. දීප ව්‍යාප්තව මහජනතාව දැනුවත් කිරීම

7.1 මුද්‍රිත මාධ්‍ය දැන්වීම්

මුද්‍රිත මාධ්‍ය දැන්වීම් පළකිරීමෙහි මූලික අරමුණු දෙකකි. ඉන් එක් අරමුණක් වන්නේ සිය භාෂා අයිතිවාසිකම් කෙරෙහි මහජනතාව දැනුවත් කිරීම මගින් ද්වි භාෂික රාජ්‍ය සේවයක් කෙරෙහි මහජන ඉල්ලුමක් ඇති කිරීමයි.

ද්වි භාෂික මහජන සේවයක් සැපයීම සම්බන්ධයෙන් රාජ්‍ය සේවකයන්ට ඇති නෛතික බැඳීම පිළිබඳ දැනුවත් කිරීම මෙහි අනෙක් අරමුණ ලෙස දැක්විය හැකිය.

ශ්‍රී ලාංකිකයන්ගේ ප්‍රධාන ආගමික සංස්කෘතික හා ජාතික වැදගත්කමක් සහිත දිනයන් අරමුණු කර ගනිමින් මෙම දැන්වීම් ද්වි භාෂාවෙන්ම පළ කරනු ලබයි. එම දිනයන් සඳහා සුබ පැතුම් පණිවුඩයක් ද ජනතාවගේ භාෂා අයිතිවාසිකම් පිළිබඳව සහ රාජ්‍ය නිලධාරින්ගේ වගකීම සම්බන්ධයෙන් පණිවුඩ ද මෙම දැන්වීම් වල ඇතුළත් වේ. ඒ අනුව 2014 වර්ෂයෙහි පළකරන ලද මෙවැනි දැන්වීම් පහත පරිදි වේ.

- 2015 නව වසර සඳහා සුබ පැතීම.
- සිංහල හින්දු අලුත් අවුරුද්ද සඳහා සුබ පැතීම.
- හජ්ජි උත්සවය සඳහා සුබ පැතීම.
- නත්තල් උත්සවය සඳහා සුබ පැතීම.

මීට අමතරව 2014 වර්ෂයේදී රාජ්‍ය භාෂා කොමිෂන් සභාව විසින් සමාජ ඒකාබද්ධතා සතිය වෙනුවෙන් පවත්වන ලද කථික තරගය පිළිබඳව දැනුවත් කිරීම සහ කොමිෂන් සභාව රාජගිරියේ සිට බොරැල්ලේ නව කාර්යාල පරිශ්‍රයකට පිවිසීම පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම සඳහා ද දිනමිණ පුවත්පතේ දැන්වීම් පළ කරන ලදි. එම දැන්වීම් පහත පරිදී වේ.

7.2 දැයට කිරුළ ප්‍රදර්ශන කුටිය නිර්මාණය කිරීම සහ ප්‍රදර්ශන භූමිය තුළ එලක ප්‍රදර්ශනය කිරීම

දැයට කිරුළ භාෂා ඇගයීම් සමීක්ෂණයට සමගාමීව රාජ්‍ය භාෂා කොමිෂන් සභාව මගින් දැයට කිරුළ ප්‍රදර්ශන භූමිය තුල එලක නිර්මාණය කරන ලද අතර මෙම එලක නිර්මාණයේ මූලික අරමුණු දෙකක් විය.

1. ප්‍රදර්ශන කුටි රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියට අනුකූලව නිර්මාණය කිරීම සහ ඒවා ඇගයීම සම්බන්ධයෙන් ප්‍රදර්ශන භූමියේදී රාජ්‍ය ආයතන දැනුවත් කිරීම.

2. ප්‍රදර්ශනය සඳහා පැමිණෙන මහජනතාව දැනුවත් කිරීම.

දැයට කිරුළ ප්‍රදර්ශන කුටි රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියට අනුකූලව නිර්මාණය කිරීම සම්බන්ධයෙන් නිලධාරින් සහ නිර්මාණකරුවන් දැනුවත් කිරීම පිණිස ප්‍රදර්ශනය ආරම්භ කිරීමට මසක කාලයකට පෙර ප්‍රධාන පිවිසුම් 3 ආසන්නයේ රාජ්‍ය භාෂා සම්මානය දිනාගන්න යනුවෙන් දැන්වීම් ස්ථාපනය කරන ලදි.

එසේම ප්‍රදර්ශනයට පැමිණෙන මහජනතාව දැනුවත් කිරීම සඳහා ප්‍රදර්ශන කුටිය තුලට පමණක් සීමා නොවී ප්‍රදර්ශන භූමිය පුරා භාෂා අයිතිවාසිකම් පිළිබඳ එකිනෙකට වෙනස් වූ පණිවිඩ 5ක් ඇතුලත් එලක 300ක් මහජන ප්‍රදර්ශනය සඳහා ස්ථාපනය කරන ලදි.

8.සමාජ ඒකාබද්ධතා සතිය

බස්නාහිර පළාත් ආරාධිත පාසල් විවෘත කේවල කථික තරගය

රාජ්‍ය භාෂා කොමිෂන් සභාව විසින් පවත්වන ලද විවාද තරගාවලි සඳහා පාසැල් සිසුන් විශේෂ උනන්දුවකින් සහභාගි වීම නිසා 2014 වර්ෂයේදී ද සමාජ ඒකාබද්ධතා සතිය වෙනුවෙන් බස්නාහිර පළාතේ පාසල් අතර කථික තරගයක් පවත්වන ලදි. විවාද තරගාවලි සඳහා සහභාගි විය හැක්කේ විවාද කණ්ඩායම් සහිත පාසල් වලට පමණක් නිසා කේවල දක්ෂතා සහිත වැඩි සිසු පිරිසක් සහභාගි කර ගැනීමේ අරමුණින් කථික තරගයක් පැවැත්වීමට කටයුතු කරන ලදි.

ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය විසින් සංවිධානය කරන ලද සමාජ ඒකාබද්ධතා සතිය 2014 නිමිත්තෙන් මෙම කථික තරගය බස්නාහිර පළාත් පාසල් සිසුන් ඉලක්ක කරගනිමින් පැවැත්විණි. මේ සඳහා පුවත්පත් දැන්වීමක් මගින් අයදුම්පත් කැඳවීම සිදුකෙරිණි. ඒ අනුව දෙමළ මාධ්‍ය අයදුම්පත් 120 ක් සහ සිංහල මාධ්‍ය අයදුම්පත් 239 ක් කොමිෂන් සභාව වෙත ලැබිණි.

තරග වට 03 ක් යටතේ මෙම තරගය සිංහල හා දෙමළ මාධ්‍යයෙන් පවත්වන ලද අතර අවසන් තරත වටය 2014.07.21 වන දින ශ්‍රී ලංකා පදනම් ආයතනයේදී ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා ගරු අමාත්‍ය වාසුදේව නානායක්කාර මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලදී. එහිදී ප්‍රථම දෙවන හා තෙවන ස්ථාන සඳහා ත්‍යාග හා කුසලාන ප්‍රදානය කරන ලදි.

අවසන් දින තරතයේදී පැමිණිසිටි ප්‍රේක්ෂකයන්ගේ ඡන්දයෙන් සිංහල හා දෙමළ මාධ්‍යයන්ගෙන් ජනප්‍රියතම කථිකයා තේරීම සිදුකරන ලදි.

රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් පාසැල් ළමුන් තුළ පවතින දැනුම සහ යහපත් ආකල්ප වර්ධනය කිරීම මගින් අනාගතයේදී ද්වී භාෂාමය රාජ්‍ය සේවයක් ඇති කිරීම රාජ්‍ය භාෂා කොමිෂන් සභාවේ අපේක්ෂාවයි.

9.2014 ක්‍රියාකාරි සැලැස්මට අමතරව රාජ්‍ය භාෂා කොමිෂන් සභාව සිදුකරන ලද වැඩසටහන්

9.1 නුවරඑළිය දිස්ත්‍රික් රාජ්‍ය නිලධාරීන් දැනුවත්කිරීමේ වැඩසටහන

9.2 උතුරු පළාත් විවාද තරගාවලිය

රාජ්‍ය භාෂා කොමිෂන් සභාව 2013 වර්ෂයේ දී බස්නාහිර පළාතේ පාසල් අතර විවාද තරගයක් පවත්වන ලදි. මෙම තරගය සඳහා පාසල් සිසුන් විශේෂ උනන්දුවකින් සහභාගී විය. එම තත්වය සැලකිල්ලට ගෙන උතුරු පළාතේ ද පාසල් විවාද තරගාවලියක් පැවැත්වීමට රාජ්‍ය භාෂා කොමිෂන් සභාව තීරණය කරන ලදි.

ඒ අනුව උතුරු පළාතෙහි ආරාධිත පාසල් විවාද තරගාවලියක් 2013.10.18 වන දින පැවැත්විණි. මෙම විවාද තරගාවලියේ තේමාව වූයේ “රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය, එහි භාවිතය හා ජනවාර්ගික සංහිඳියාව” යන්නයි. රටේ අනාගත සිසු පරපුර තුළ ද්විභාෂා භාවිතයේ වටිනාකම පිළිබඳ යහපත් ආකල්ප ගොඩනැගීම විවාද තරගාවලියේ මූලික අරමුණ විය. උතුරු පළාතෙහි දිස්ත්‍රික්කයන් පහෙහිම පාසැල් ආවරණය වන පරිදි මෙම තරගාවලිය පැවැත්වීය. දෙමළ මාධ්‍ය පාසල් දාසයක් සහ සිංහල මාධ්‍ය පාසල් හයක් මේ සඳහා තෝරා ගන්නා ලදී.

2013.10.18 දින ආරම්භ කරන ලද මෙම තරගාවලියේ දී සිංහල මාධ්‍ය ශූරතාවය ව/පැරකුම් විද්‍යාලය ද අනු ශූරතාවය අලගල්ල විද්‍යාලය ද දෙමළ මාධ්‍ය ශූරතාවය විද්‍යානන්ද විද්‍යාලය ද අනු ශූරතාවය පුදුකුඩුරිප්පු මහා විද්‍යාලය ද දිනා ගන්නා ලදී.

ඒ අනුව 2014/01/28 වන දින යාපනය විශ්ව විද්‍යාලයේ කයිලාසපති ශාලාවේදී මෙම විවාද තරගාවලියේ ත්‍යාග හා කුසලාන ප්‍රදානෝත්සවය පැවැත්විණි. උතුරු පළාත් ප්‍රධාන අමාත්‍ය ගරු සී.වී. විග්නේෂ්වරන් මැතිතුමා සහ ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා ගරු අමාත්‍ය වාසුදේව නානායක්කාර මැතිතුමා මෙම උත්සවය සඳහා ආරාධනය කර තිබිණි.

සහතිකපත්‍ර ප්‍රදානෝත්සවයෙහි විශේෂිත අංගය වූයේ දෙමළ සහ සිංහල මාධ්‍ය ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගෙන් සමන්විත කණ්ඩායම් දෙකක සහභාගිත්වයෙන් සංදර්ශනාත්මක විවාද තරගයක් පැවැත්වීමයි. මෙහිදී භාෂා පරිවර්තන උපකරණ ආධාරයෙන් සිංහල සහ දෙමළ මාධ්‍ය සිසුන් අතර සන්නිවේදනය සිදුකරන ලදී.

9.3 පාරිභෝගික සේවා අධිකාරිය සමග පවත්වන ලද සාකච්ඡා

පාරිභෝගික භාණ්ඩ මිලදී ගැනීමේදී පාරිභෝගිකයා විසින් අත්‍යවශයෙන්ම දැනගත යුතු තොරතුරු වන භාවිතය, කල්ඉකුත් වීම්, ඇසුරුම් ආදිය රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියට අනුකූලව සකස් කිරීම සම්බන්ධයෙන් පාරිභෝගික සේවා අධිකාරිය සමග සාකච්ඡා කෙරිණි. මෙම කරුණ සම්බන්ධයෙන් ඉදිරියේදී සෞඛ්‍ය අමාත්‍යාංශයේආහාර උපදේශක කමිටුව සමග ද සාකච්ඡා කිරීමට නියමිතය.

9.4 වැවිලි කර්මාන්ත නියෝජිතයින් දැනුවත් කිරීම

2014 වර්ෂයේදී කොමිෂන් සභාව වැවිලි කර්මාන්ත නියෝජිතයින් දැනුවත් කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මකකොට ඇත. මෙහි අරමුණ වූයේ වතු ආශ්‍රිත දෙමළ ජනතාවගේ භාෂා අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමය.

මෙම වැඩසටහන්වල සමාජ බලපෑම වන්නේ රාජ්‍ය ආයතනවල රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් පවතින නෛතික බැඳීම සහ රාජ්‍ය නිලධාරින්ගේ වගකීම සම්බන්ධයෙන් නිලධාරින් දැනුවත්කර මහජනතාවගේ භාෂා අයිතිවාසිකම් ආරක්ෂා කිරීමය.

9.5 කෙටි වාර්තාමය වැඩසටහනක් සකස් කිරීම

රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් රාජ්‍ය භාෂා කොමිෂන් සභාව විසින් සිදුකරන ලද ක්‍රියාකාරකම් ඇතුළත් කරමින් කෙටි වාර්තා වැඩසටහනක් සකස් කිරීම මෙම වර්ෂය තුළ සිදුකොට ඇත. මෙම වාර්තා වැඩසටහන "බසින් දෙබසට" ලෙසින් නම්කර ඇත. රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය සම්බන්ධ දැනුවත් කිරීමේ වැඩසටහන්වලදී යොදාගැනීම මෙම වාර්තා වැඩසටහන නිර්මාණය කිරීමේ අරමුණයි.

9.6 කොමිෂන් සභාව මගින් ලබාදෙන ලද පරිවර්තන සහයන්

රාජ්‍ය භාෂා කොමිෂන් සභාව විසින් සිදු කරන ලද දැනුවත් කිරීමේ වැඩසටහන් වල ප්‍රතිඵලයක් වශයෙන් විවිධ රාජ්‍ය හා පෞද්ගලික ආයතන මගින් තම ආයතනයන් තුළ මහජන ප්‍රදර්ශනය කෙරෙන නාම පුවරු , ආකෘති පත්‍ර භාෂාත්‍රයෙන් සකස් කිරීමට අවශ්‍ය සහය සම්බන්ධ ඉල්ලීම් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇත.

ඒ අනුව කොමිෂන් සභාව රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ පරිවර්තන අංශය වෙත එම ලේඛන යොමු කර පරිවර්තන ලබාදීමට කටයුතු කර ඇත. මෙම වර්ෂයේදී ලබා දෙන ලද පරිවර්තන සහයන් පහත පරිදි වේ.

- ශ්‍රී ලංකා යුද්ධ හමුදා කඳවුරු වල සියලුම නාමපුවරු ත්‍රෛභාෂාවෙන් සැකසීම.
- සීතාවක ප්‍රාදේශීය සභාවේ දැනට භාවිතා කරනු ලබන ආකෘති පත්‍ර ත්‍රෛභාෂාවෙන් සැකසීම.
- සී/ස රුහුණු ඩිවලොප්මන්ට් කන්ට්‍රක්ටර්ස් ඇන්ඩ් ඉංජිනියර්ස් පුද්ගලික සමාගම විසින් ඉදිරිපත් කරනු ලබන විවිධ මාර්ග ව්‍යාපෘති වල නාම පුවරු ත්‍රෛභාෂාවෙන් සැකසීම.

9.7 රාජ්‍ය ආයතන වල ලිපි ශීර්ෂ රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියට අනුව සැකසීම.

රාජ්‍ය ආයතන වල ලිපි ශීර්ෂයන් රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියට අනුකූලව පිළයෙල කිරීමට රාජ්‍ය භාෂා කොමිෂන් සභාව විටින් විට දැනුවත් කිරීම් හා නිර්දේශ නිකුත් කිරීම් සිදුකර ඇත. මේ සම්බන්ධයෙන් පවතින තත්වය පිළිබඳව සොයා බැලීමට සියළු රාජ්‍ය ආයතන වල ලිපි ශීර්ෂ පිළිබඳව සමීක්ෂණයක් සිදුකෙරිණි.

ඒ අනුව සෑම රාජ්‍ය ආයතනයකම භාවිතා කරනු ලබන ලිපි ශීර්ෂයන් රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියට අනුකූලව සකස් කර ඇත්තේ ද යන්න සමීක්ෂණය කිරීමටත් එසේ සකස් කර නොමැති ලිපි ශීර්ෂයන් රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියට අනුකූලව සැකසීමටත් අවශ්‍ය උපදෙස් හා නිර්දේශයන් කොමිෂන් සභාව මගින් ලබාදී ඇත. මෙම සමීක්ෂණයේදී පහත දැක්වෙන රාජ්‍ය ආයතන ආවරණය කරන ලදී.

1. දිස්ත්‍රික් ලේකම් කාර්යාල
2. ප්‍රාදේශිය ලේකම් කාර්යාල
3. මහ නගර සභා
4. නගර සභා
5. ප්‍රාදේශීය සභා

උක්ත සමීක්ෂණයට අදාලව ලිපි ශීර්ෂය රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියට අනුකූලවන පරිදි සකස්කර ඇත්තේද යන්න නිරීක්ෂණ කරනු ලැබුවේ පහත සඳහන් නිර්නායක 05 යටතේය.

i.කාර්යාලයේ/ආයතනයේ නම ත්‍රෛභාෂාවෙන් සකස්කර තිබීම.

(උතුරු හා නැගෙනහිර පළාත් වල දෙමළ, සිංහල , ඉංග්‍රීසි යන භාෂා අනුපිළිවෙලින් හා අනෙකුත් පළාත්වල සිංහල , දෙමළ, ඉංග්‍රීසි යන භාෂා අනුපිලිවෙළින් කාර්යාලයේ / ආයතනයේ නම සකස් කර තිබිම)

ii.ලිපි ශීර්ෂයෙහි අන්තර්ගත දුරකථන අංකය, නාමයන් සහ අනෙකුත් සන්නිවේදන නාමයන් සියල්ල භාෂාත්‍රයෙන් සැකසීම.

iii.ලිපි ශීර්ෂයේ ඉහලින් හා පහළින් යොදනු ලබන කෙටි උද්‍ධෘත සියල්ල භාෂාත්‍රයෙන් තිබීම.

iv.අක්ෂර වල නිරවද්‍යතාවය.

v.භාෂාත්‍රයෙන් යොදා ඇති සියලූම වචන/ වාක්‍ය සමාන අක්ෂර ප්‍රමාණයෙන් (Font size)යුක්ත වීම.

රාජ්‍ය ආයතනය	ලිපි ශීර්ෂයන් ප්‍රමාණය	දැනට නිර්දේශ නිකුත් කළ
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	25	25
ප්‍රාදේශිය ලේකම් කාර්යාලය	319	
මහ නගර සභාව	23	23
නගර සභාව	41	41
ප්‍රාදේශීය සභාව	271	
	679	89

vii.මාර්ගා සමීක්ෂණය

භාෂා කොමිෂන් සභාව මගින් 2007/2008 වර්ෂයේදී රාජ්‍ය ආයතනවල භාෂා සම්පත් අවශ්‍යතා තක්සේරු කිරීමේ සමීක්ෂණයක් පැවැත්විණි. මේ සඳහා නියැදිය වශයෙන් ආයතන 50 ක් තෝරා ගැනිණ. මෙහි පසුවිපරම් සමීක්ෂණයක් 2014 ඔක්තොම්බර් මස සිට දෙසැම්බර් දක්වා පවත්වන ලදී. රාජ්‍ය භාෂා කොමිෂන් සභාව මගින් එම සමීක්ෂණ කටයුතු සහ වාර්තාව පිළියෙළ කිරීම මේ වන විට මාර්ගා ආයතනය වෙත බාරදී ඇත

06. ජාතික භාෂා අධ්‍යාපන හා පුහුණු ආයතනය සහ එහි ප්‍රගතිය

ජාතික භාෂා අධ්‍යාපන හා පුහුණු ආයතනය

හැඳින්වීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ත්‍රෛභාෂා සංකල්පය ක්‍රියාවට නැංවීමේ අරමුණින් ජාතික භාෂා සහ සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය යටතේ ව්‍යවස්ථාපිත ආයතනයක් වශයෙන් 2007 අංක 26 දරණ ජාතික භාෂා අධ්‍යාපන හා පුහුණු ආයතන පනත අනුව ජාතික භාෂා අධ්‍යාපන හා පුහුණු ආයතනය ප්‍රතිෂ්ඨාපනය කර ඇත.

ආරම්භයේදී එනම් 2007 නොවැම්බර් මස පළමුවැනි දින සිට මෙම ආයතනය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කටයුතු සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශයේ විෂය පථය යටතට ගැණුනු අතර ආයතනය එම අමාත්‍යාංශය පිහිටි, කොළඹ 03 ගාලු පාරේ අංක 310 යන ස්ථානයේ පවත්වාගෙන යන ලදි. 2010 අප්‍රේල් මස 25 වෙනි දින සිට අමාත්‍යාංශය ජාතික භාෂා සහ සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය වශයෙන් නාම ගත කරන ලද අතර, මෙම ආයතනය එම අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ආයතන අතරට එක් විය.

2011 නොවැම්බර් 15 දින සිට ආයතනයේ ප්‍රධාන කාර්යාලය අංක 155A , කාසල් වීදිය, කොළඹ 08 යන ස්ථානයේ පවත්වාගෙන ගිය අතර 2013 සැප්තැම්බර් මස 03 වෙනි දින සිට 2015 පෙබරවාරි 28 දින දක්වා දෙවන මහල, ගොඩනැගිලි අංක 09, බණ්ඩාරනායක ජාත්‍යන්තර අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාව, කොළඹ 07 යන ස්ථානයේ පවත්වාගෙන යන ලදී. වර්තමානයේ ආයතනය අංක 40, බුත්ගමුව පාර, රාජගිරිය යන ස්ථානයේ පවත්වා ගෙන යනු ලැබේ. මේ වන විට ආයතනය තම කාර්යභාරය වඩාත් පුලුල් කරමින් පුහුණු පාඨමාලා රාශියක් දීප ව්‍යාප්තව ක්‍රියාත්මක කරමින් පවති. ඒවා අතරින් පහත සඳහන් පුහුණු පාඨමාලා ප්‍රධාන වේ.

- රාජ්‍ය නිලධාරින් සඳහා අර්ධ කාලින දෙවන භාෂා පුහුණු පාඨමාලා (I මට්ටම, II මට්ටම, III මට්ටම)
- සමාන්‍යය ප්‍රජාව සඳහා පැය 150 කථන සිංහල, දෙමළ භාෂා පාඨමාලා
- රාජ්‍ය නිලධාරින් සඳහා දින 12 නේවාසික නොවන කෙටි කාලීන පුහුණු පාඨමාලා
- ගුරු පුහුණු වැඩසටහන්
- සම්පත්දායකයන් සඳහා පසු විපරම් වැඩසටහන්
- පරිවර්තන අධ්‍යයනයන් පිළිබඳ ඩිප්ලෝමා පායමාලා (අර්ධ කාලීන / පූර්ණ කාලීන)
- මූලික භාෂා පරිවර්තන පාඨමාලා (දින 10 නේවාසික)
- අලුතින් බඳවා ගන්නා ලද රාජ්‍ය නිලධාරින් සඳහා සීමාවාසික කාලය තුළ පවත්වනු ලබන කෙටිකාලීන දෙවන භාෂා පුහුණු පාඨමාලා (වෛද්‍යවරුන් , පරිපාලන සේවයේ නිලධාරින් හා අනෙකුත් වෘත්තිකයන් සඳහා)

ආයතනය මගින් සංවිධානය කරනු ලබන නේවාසික පාඨමාලා රාශියක් ගලේවත්ත, අගලවත්තෙහි පිහිටි පුහුණු මධ්‍යස්ථානයේදී ක්‍රියාත්මක කරනු ලැබේ. රමණීය භූමි භාගයක පිහිටි මෙම පුහුණු ආයතනය පුහුණුවන්නන් 250ට පමණ එකවර සහභාගි විය හැකි දේශන ශාලාවකින් ද කණ්ඩායම් සාකාච්ඡා සඳහා ශාලා පහසුකම් ද 60 දෙනෙකුට නවාතැන් පහසුකම් සැපයිය හැකි නේවාසිකාගාරයකින් හා පුස්තකාලයකින් ද සමන්විත වේ.

ඉහතින් සඳහන් කරන ලද පාඨමාලා දීප ව්‍යප්තව ක්‍රියාත්මක කිරිම සඳහා ප්‍රවීණ සම්පත්දායක මණ්ඩලයක දායකත්වය ලබා ගන්නා අතර ආයතනයේ කාර්ය මණ්ඩලයද ඒ සඳහා ඉමහත් කැපවීමකින් යුතුව කටයුතු කරනු ලබයි.

දැක්ම

ජාතික භාෂා පුහුණුව තුලින් ශ්‍රී ලාංකේය ජනතාව අතර සාමය සහ සහජීවනය වර්ධනය කිරීම.

මෙහෙවර

රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිණිස භාෂා අධ්‍යාපන සහ පුහුණුව සඳහා ත්‍රෛ භාෂා දැනුම් සම්පාදන කේන්ද්‍රස්ථානය ලෙසින් කටයුතු කිරීම.

අරමුණු

01.සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා පිළිබද දැනුම් ලබා ගැනීමට කැමැත්තෙන් සිටින්නේ යම් තැනැත්තෙක් ද එවැනි තැනැත්තන්ට සිංහල, දෙමළ, ඉංග්‍රිසි භාෂා ඉගැන්වීමට දක්ෂ ගුරුවරුන් බිහි කිරීම.

02.ලිඛිත නීතියකින් පිහිටුවන ලද ජාතික භාෂා පරිවර්තක සේවයෙන් සහ ජාතික භාෂණ පරිවර්තක සේවයෙන් පත් කළ යුතු සිංහල, දෙමළ සහ ඉංග්‍රිසි භාෂාවල නිපුණතාවයන් ඇති පරිවර්තකයින් සහ භාෂණ පරිවර්තකයින් බිහිකිරීම.

03.සිංහල, දෙමළ, ඉංග්‍රිසි භාෂාවලින් භාෂා ගුරුවරුන්, භාෂා පරිවර්තකයින් සහ භාෂණ පරිවර්තකයින් පුහුණු කිරීමට සුදුසුකම් ලත් ගුරුවරුන් බිහිකිරීම.

04.මහජනතාවට කාර්යක්ෂම සේවාවක් සැපයීම සඳහා ත්‍රෛ භාෂා හැකියාවැති රාජ්‍ය සේවකයින් බිහි කිරීම.

ආයතනයේ කාර්ය භාරය

- සිංහල, දෙමළ සහ ඉංග්‍රිසි භාෂා දැනුම ලබා ගැනීමට අපේක්ෂා කරන තැනැත්තන් හට සිංහල, දෙමළ සහ ඉංග්‍රිසි භාෂා ඉගැන්වීමට දක්ෂ තැනැත්තන් බිහි කිරිම සඳහා සිංහල, දෙමළ ඉංග්‍රිසි භාෂා පිළිබද දිර්ඝ පුහුණුවක් ලබා දිම.
- ආයතනයේ ක්‍රියාකාරිත්වය කාර්යක්ෂමව පවත්වාගෙන යාම සඳහා පර්යේෂණ සහ අධ්‍යයනවල ප්‍රතිඵල භාවිතා කිරිමේ අරමුණු ඇතිව භාෂා පුහුණු කිරිමට අදාලව පවතින ගැටලු පිළිබද පර්යේෂණ සහ අධ්‍යයන පැවැත්විම
- සුදුසු තැනැත්තන් හට භාෂා පුහුණුව සහ අධ්‍යාපනය ලබා දිම සහ ඒ පුහුණුවිම සහ අධ්‍යාපනය සම්පුර්ණ කරන සාර්ථක අපේක්ෂකයන්ට සහතික පත් සහ ඩිප්ලෝමා ප්‍රදානය කිරිම
- භාෂා ඉගැන්විම කරගෙන යාමට පුහුණු පුද්ගලයන්ගෙන් සමන්විත මණ්ඩලයක් පිහිටුවිම.
- භාෂාවන්ට අදාළ කාරණා පිළිබද තොරතුරු තැන්පත් කර තබන ස්ථානයක් පිහිටුවිම
- භාෂා පරිවර්තකයින්, භාෂණ පරිවර්තකයින් සහ ලඝුලේඛකයින් යනාදි වශයෙන් විශේෂ කාණ්ඩවලට අයත් තැනැත්තන් සඳහා සිංහල, දෙමළ සහ ඉංග්‍රිසි යන භාෂාවලින් විශේෂිත භාෂා පුහුණු පාඨමාලා පැවැත්විම
- අවශ්‍ය යැයි පෙනි යන අවස්ථාවලදි සිංහල, දෙමළ සහ ඉංග්‍රිසි භාෂාවල තත්වය වැඩි දියුණු කිරිම සහ ඒවාට කළ යුතු වෙනස්කම් පිළිබද අදාළ අධිකාරියට නිර්දේශ ඉදිරිපත් කිරිම, සිංහල දෙමළ සහ ඉංග්‍රිසි යන භාෂා සහ විදේශිය භාෂා පිළිබද භාෂාමය පර්යේෂණ කටයුතු කර ගෙන යාම , ඒවාට සහාය දැක්විම සහ ප්‍රවර්ධනය කිරිම

ආයතනයෙහි ඉහතින් සදහන් කරන ලද පරමාර්ථයන් ඉටු කර ගැනිම සඳහා අදාල සියලු තිරණයන් කලමානාකරණ මණ්ඩලය විසින් ගනු ලබන අතර ආයතනයේ අධ්‍යයන කටයුතුවලට අධ්‍යයන මණ්ඩලය විවිධ අයුරින් සහාය දක්වයි.

ක්‍රියාකාරී සැලැස්මට අනුව කාර්යසාධනය

ජාතික භාෂා අධ්‍යාපන හා පුහුණු ආයතනය



අනු අංකය	විස්තරය	ඇස්මේන්තුගත වියදම (රුපි.)	සත්‍ය වියදම (රුපි.)	ප්‍රතිශතය
01	රාජ්‍ය නිලධාරීන් සඳහා පවත්වන ලද අර්ධකාලීන පුහුණු පාඨමාලා	7,912,000.00	16,168,950.00	204.35%
02	රාජ්‍ය නිලධාරීන් සඳහා දින 12 නේවාසික නොවන දෙවන භාෂා පුහුණු පාඨමාලා	1,400,000.00	6,650,464.50	47.53%
03	දූයට කිරුළ ජාතික වැඩසටහනට සමගාමීව පවත්වන ලද දින 12 කෙටි කාලීන පුහුණු පාඨමාලා	1,800,000.00	2,297,858.00	127.65
04	රාජ්‍ය නිලධාරීන්ට හා සාමාන්‍ය ප්‍රජාවට ඉගැන්වීම සඳහා පවත්වන ලද ගුරු උපදේශකවරුන් පුහුණු කිරීමේ වැඩසටහන්	500,000.00	719,981.00	143.99%
05	ගුරුවරුන් සඳහා පසු විපරම් වැඩසටහන්	700,000.00	621,663.00	88.81%
06	සාමාන්‍ය ප්‍රජාව සඳහා භාෂා පුහුණු වැඩසටහන්	18,840,000.00	12,834,614.00	68.12%
07	පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා සිංහල සහ දෙමළ භාෂා පාඨමාලා	43,500.00	11,200.00	25.74%
08	ආයතනයේ කාර්ය මණ්ඩලය සඳහා පුහුණු හා ශක්‍යතා වැඩසටහන්	300,000.00	111,017.00	37%
09	වෛද්‍යවරුන් සඳහා දෙමළ භාෂා පාඨමාලා	2,500,000.00	3,606,579.00	144.26%
10	ගුරු පුහුණු වැඩසටහන්	1,250,000.00	1,158,361.00	92.66%
11	රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතන සඳහා කෙටි කාලීන පුහුණු වැඩසටහන්	1,500,000.00	155,467.00	10.36%
12	විශේෂ ඉල්ලීම් මත පවත්වනු ලබන පාඨමාලා	750,000.00	424,702.60	56.62%
	එකතුව	**44,760,857.00**	**37,495,500.00**	**83.76%**

ජාතික භාෂා අධ්‍යාපන ආයතනය මඟින් 2014 වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලද විවිධ පුහුණු පාඨමාලා

1. භාණ්ඩාගාර අරමුදල් මත ක්‍රියාත්මක කල පාඨමාලා

ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය විසින් රාජ්‍ය නිලධාරීන් ද්වි භාෂාවෙන් බල ගැන්වීම පිණිස අර්ධ කාලීන භාෂා පුහුණු පාඨමාලා දීප ව්‍යාප්තව ක්‍රියාත්මක කරනු ලබයි. මෙම වැඩසටහන් සේවා ස්ථාන මට්ටමින් සංවිධානය කරනු ලබන අතර රජයේ දෙපාර්තමේන්තු, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, පොලිස් ස්ථාන ආදී රජයේ ආයතනවල සතියකට පැය 4ක් හෝ 6ක් ආවරණයන වන පරිදි නිලධාරීන්ගේ රාජකාරියට බාධා නොවන අයුරින් ක්‍රියාත්මක කරනු ලබයි. මෙම සිංහල හා දෙමළ අර්ධ කාලීන භාෂා පුහුණු පාඨමාලා I, II, III යනුවෙන් මට්ටම් තුනකට බෙදා වෙන් කර ඇති අතර I මට්ටම මඟින් පැය 300ක් ද II මට්ටම මඟින් පැය 216 ක් ද III මට්ටම මඟින් පැය 108ක් ද ආවරණය කරනු ලබයි. රාජ්‍ය නිලධාරීන්ට දෙවන භාෂා ප්‍රවීණතාව ලබා දීම මඟින් රාජ්‍යය සේවාවේ කාර්යක්ෂමතාව වර්ධනය කිරීමත් රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය කාර්යක්ෂම ක්‍රියාත්මක කිරීම සඳහා පහසුකම් සැලසීමත් මෙම පාඨමාලාව ක්‍රියාත්මක කිරීමේ අරමුණයි.

ඒ අනුව 2014 වර්ෂයේදී I මට්ටම පංති 05ක් ද II මට්ටම පංති 25ක් ද III මට්ටම පංති 95ක්ද පැවැත්වීමට සැලසුම් කරන ලද අතර ඒ සඳහා ඇස්තමේන්තුගත මුදල රු. 7,912,000 කි. ඒ අනුව 2014 වර්ෂයේදී රාජ්‍ය නිලධාරීන් සඳහා පවත්වන ලද අර්ධකාලීන පුහුණු පාඨමාලාවල විස්තර පහත පරිදි වේ.

2014 වර්ෂය තුළ අනුමැතිය දුන් පංති

මට්ටම	සිංහල පංති	සහභාගිත්වය	මට්ටම	දෙමළ පංති	සහභාගිත්වය
I	01	67	I	1	35
II	13	451	II	82	2743
III	32	1430	III	236	11420
එකතුව	**46**	**1948**		**319**	**14198**

ඒ අනුව 2014 වර්ෂය තුළ පංති 365ක් තුළින් සහභාගිවන්නන් 16146ට භාෂා පුහුණුව ලබා ගැනීම සඳහා ආයතනය විසින් අනුමැතිය දී ඇත.

2014 වර්ෂය තුළ සම්පූර්ණ කරන ලද පංති

මට්ටම	සිංහල පංති	සහභාගිත්වය	මට්ටම	දෙමළ පංති	සහභාගිත්වය
I			I		
II	02	58	II	44	1065
III	24	1302	III	144	5580
එකතුව	**26**	**1360**		**188**	**6645**

ඒ අනුව 2014 වර්ෂය තුළ පංති 214 මඟින් නිලධාරීන් 8005 දෙනෙකු භාෂා පුහුණුව ලබා ඇත. මෙම කණ්ඩායමට 2012 හා 2013 වර්ෂවල අනුමැතිය දුන් භාෂා පංතිවල නිලධාරීන් ද ඇතුළත් බව සඳහන් කළ යුතුය.

2014 දෙසැම්බර් 31 දිනට ක්‍රියාත්මක වෙමින් පවතින පංති (2012 වර්ෂයේ ආරම්භ කරන ලද)

මට්ටම	සිංහල පංති	සහභාගිත්වය	මට්ටම	දෙමළ පංති	සහභාගිත්වය
I			I		
II			II	14	390
III			III	19	644
එකතුව				**33**	**1034**

2013 වර්ෂයේ ආරම්භ කර ක්‍රියාත්මක වෙමින් පවතින පංති

මට්ටම	සිංහල පංති ගණන	සහභාගිවන්නන් ගණන	මට්ටම	දෙමළ පංති ගණන	සහභාගිවන්නන් ගණන
I			I		
II	22	1049	II	54	1817
III	16	1022	III	225	10239
එකතුව	**38**	**2071**		**279**	**12056**

2014 වර්ෂයේ ආරම්භ කර ක්‍රියාත්මක වෙමින් පවතින පංති

මට්ටම	සිංහල පංති ගණන	සහභාගිවන්නන් ගණන	මට්ටම	දෙමළ පංති ගණන	සහභාගිවන්නන් ගණන
I	01	47	I	01	35
II	11	342	II	51	2300
III	24	942	III	125	6923
එකතුව	**36**	**1331**		**177**	**9258**

ඒ අනුව 2014 දෙසැම්බර් 31 දින වන විට පංති 563 ක් හරහා නිලධාරීන් 25750 දෙනෙකු භාෂා පුහුණුව ලබමින් සිටිති.

2014 වර්ෂය තුළ ආරම්භ කළ නමුත් නිසි පරිදි සම්පූර්ණ නොකළ පංති

මට්ටම	සිංහල පංති සංඛ්‍යාව	සහභාගිවන්නන්	මට්ටම	දෙමළ පංති සංඛ්‍යාව	සහභාගිවන්නන්
I			I		
II	06	171	II	59	1665
III			III	123	4258
එකතුව	**06**	**171**		**182**	**5923**

ඉහත වගුව අනුව 2014 වර්ෂය තුළ පංති 188ක් අක්‍රිය වී ඇති අතර එම පංතිවලට 2012 හා 2013 වර්ෂවලදී අනුමැතිය දුන් පංති ද ඇතුළත් බව සඳහන් කළ යුතුය.

රාජ්‍ය නිලධාරීන් හට අර්ධකාලීන පාඨමාලා මගින් දෙවන භාෂා පුහුණුව ලබාදීම සඳහා 2014 වර්ෂය තුළ දී ආයතනය විසින් රු. 16,168,950.00 වැය කර ඇත.

1.1 රාජ්‍ය නිලධාරීන් සඳහා දින 12 නේවාසික නොවන දෙවන භාෂා පුහුණු පාඨමාලා

ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය විසින් අර්ධ කාලීන භාෂා පුහුණු පාඨමාලාවටල සම්බන්ධ වීමට අපහසු රාජ්‍ය නිලධාරීන් සඳහා දින 12ක කෙටි කාලීන භාෂා පුහුණු පාඨමාලා සංවිධානය කරනු ලබයි. සංස්කෘතික හා සමාජ ඒකාබද්ධතාව උදෙසා මානව දයාවෙන් හා සහජීවනයෙන් පිරිපුන් රාජ්‍ය නිලධාරීන් නිර්මාණය කිරීමට ආයතනය ගන්නා අග්‍රගණ්‍ය උත්සාහයක් ලෙස මෙම දින 12 කෙටි කාලීන භාෂා පුහුණු පාඨමාලා හැඳින්විය හැකිය. මෙම පාඨමාලාවට සම්බන්ධ වන නිලධාරීන් දින 12 අඛණ්ඩව සහභාගි විය යුතු අතර පාඨමාලාව අවසානයේ විධිමත් ලිඛිත හා වාචික ඇගයීම මත සහතික පත්‍ර ප්‍රදානය කරනු ලැබේ.

ඒ අනුව 2014 වර්ෂය තුළ දින 12 නේවාසික නොවන පාඨමාලා 10 ක් පැවැත්වීමට සැලසුම් කරන ලද අතර ඒ සඳහා වෙන් කරන ලද මුදල රු. 1,400,000කි. 2014 වර්ෂය තුළ දින 12 නේවාසික නොවන පාඨමාලා35 ක් පැවත්වූ අතර ඒ සඳහා 2563 ක් සහභාගි වූ අතර සමස්ත වියදම රුපියල් 6,650,464.50 විය.

1.2 දැයට කිරුළ ජාතික වැඩසටහනට සමගාමීව පවත්වන ලද දින 12 කෙටි කාලීන පුහුණු පාඨමාලා

ආයතනය විසින් දැයට කිරුළ ජාතික වැඩසටහනට සමගාමීව ද දින 12 කෙටි කාලීන භාෂා පුහුණු පාඨමාලා පවත්වනු ලැබේ. ඒ අනුව 2014 වර්ෂය තුලදී දැයට කිරුළ ජාතික වැඩසටහනෙහි ඉලක්කගත දිස්ත්‍රික්ක වූ කෑගල්ල, කුරුණෑගල, පුත්තලම හා හලාවත දිස්ත්‍රික්කයන්හීදි දින 12 දෙමළ භාෂා පුහුණු වැඩසටහන් 15ක් පැවැත්වීමට සැලසුම් කරන ලදී. ඒ සඳහා ඇස්තමේන්තුගත මුදල රු. 1,800, 000කි. රාජ්‍ය නිලධාරීන්ට දෙවන භාෂා ප්‍රවීණතාව ලබා දීම තුළින් රාජ්‍ය සේවාවේ කාර්යක්ෂම බව වර්ධනය කිරීම හා රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට පහසුකම් සැලසීම මෙම වැඩසටහන පැවැත්වීමේ අරමුණයි.

2014 වර්ෂයේ දින12 කෙටි කාලීන භාෂා පුහුණු වැඩසටහන් 17 ක් මඟින් රාජ්‍ය නිලධාරින් 977 දෙනෙකු පුහුණුව ලබා ඇත. ඒ සඳහා වැය වී ඇති මුලු මුදල රු. 2,297,858.00 කි.

දැයට කිරුළ වැඩසටහනට සමගාමී ක්‍රියාකාරකම් හා ප්‍රදර්ශන භාණ්ඩ සඳහා ද 2014 වර්ෂය තුලදී රු.850,000ක මුදලක් වෙන් කර තිබුණි. එම මුදලින් 2014 පෙබරවාරි 24 දින ගරු ඇමතිතුමාගේ ප්‍රධානත්වයෙන් වයඹ විශ්වවිද්‍යාල ශ්‍රවණාගාරයේදී පවත්වන ලද සංස්කෘතික සංදර්ශනය සඳහා සහ ආයතනය මඟින් පවත්වනු ලබන පුහුණු වැඩසටහන්/පාඨමාලා පිළිබඳ තොරතුරු ඇතුළත් පොත් පිංචක් මුද්‍රණය කර බෙදා හැරීම සඳහා රු.373,308.00ක මුදලක් වැය වන ලදී.

1.3 ගුරු පුහුණු වැඩසටහන්

ආයතනය මගින් දීප ව්‍යාප්තව සංවිධානය කරනු ලබන භාෂා පුහුණු පාඨමාලාවල ඉගැන්වීමට සුදුසුකම් ලබන්නේ දින 05 නේවාසික ගුරු පුහුණු වැඩසටහනට සහභාගි වී ඉන් සමත් වන ගුරුවරුන් පමණි. මෙම ගුරුවරුන් හෘදයාංගමව බැඳුණු ආවර්ජිත සහභාගීත්ව ඉගැනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය (Participatory Reflective Heart holding Teaching Learning Process) උපයෝගි කර ගනිමින් ඉගැන්වීම් කටයුතුවල නිරත වනු ලබන අතර ආයතනය විසින් ඔවුන් සඳහා පළාත් මට්ටමින් පසු විපරම් හා අධීක්ෂණ පුහුණු පාඨමාලා ද ක්‍රියාත්මක කරනු ලබයි. රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා රාජ්‍ය නිලධාරීන් හට දෙවන භාෂාව ඉගැන්වීමට දක්ෂ ගුරුවරුන් බිහි කිරීමත් භාෂා සංගම් ව්‍යාපාරය හරහා සාමාන්‍ය ප්‍රජාවට භාෂා ප්‍රවීණතාව ලබා දීමට හැකි ගුරු මණ්ඩලයක් බිහි කිරීමත් මෙවැනි වැඩසටහන් පැවැත්වීමෙහි අරමුණ වේ.

1.4 2014 වර්ෂය තුළ රාජ්‍ය නිලධාරීන්ට හා සාමාන්‍ය ප්‍රජාවට ඉගැන්වීම සඳහා පවත්වන ලද ගුරු උපදේශකවරුන් පුහුණු කිරීමේ වැඩසටහන්

2014 වර්ෂය තුළ මෙවැනි වැඩසටහන් 04ක් පැවැත්වීමට සැලසුම් කරන ලද අතර ඒ සඳහා වෙන් කරන ලද මුදල රු.1,000,000කි.

වැඩ සටහන් ගණන	සහභාගිවූ ගණන	වැය වූ මුදල
05	**190**	**719,981.00**

ඉහත වගුව අනුව 2014 වර්ෂය තුළ ගුරු උපදේශකවරුන් 190ක් වැඩසටහන් 05ක් තුළින් පුහුණුව ලබා ඇති අතර ඒ සඳහා වැය වීඇති මුලුමුදල රු. 719,981.00 කි.

1.5 ගුරුවරුන් සඳහා පසු විපරම් වැඩසටහන්

2014 වර්ෂය තුළ ගුරුවරුන් සඳහා පසු විපරම් වැඩසටහන් 06ක් පැවැත්වීමට සැලසුම් කරන ලද අතර ඒ සඳහා වෙන් කරන ලද මුදල රු.700,000කි.

අනු අංකය	ස්ථානය	දිනය	සහභාගිවූ ගණන	වැය වූ මුදල
01	රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව	පෙබරවාරි 18	176	100,992.00
02	අගලවත්ත පුහුණු මධ්‍යස්ථානය	පෙබරවාරි 27	179	132,629.00
03	අගලවත්ත පුහුණු මධ්‍යස්ථානය	මාර්තු 1820	22	63,849.00
04	බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	අප්‍රේල් 25	178	119,433.00
05	ත්‍රෛභාෂික ශ්‍රී ලංකාවක් සඳහා වන ජනාධිපති කාර්ය සාධක බලකා කාර්යාලය	මැයි 06	15	4,200.00
06	රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව	ජුනි 04	23	32,432.00
07	රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව	ජුනි 18	17	33,418.00
08	මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	සැප්තැම්බර් 19	153	102,265.00
09	කලුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	නොවැම්බර් 15 16	33	32,445.00
	එකතුව		**796**	**621,663.00**

ඉහත වගුව අනුව 2014 වර්ෂය තුළ ගුරුවරුන් සඳහා පසු විපරම් වැඩසටහන් 09 ක් පවත්වා ඇති අතර ගුරුවරුන් 796 දෙනෙකු සහභාගි වී ඇත.ඒ සඳහා වැය වී ඇති මුලු මුදල රු. 621,663.00 කි.

1.6 සාමාන්‍ය ප්‍රජාව සඳහා භාෂා පුහුණු වැඩසටහන්

ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය මඟින් ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා ගරු අමාත්‍ය වාසුදේව නානායක්කාර මැතිතුමාගේ විශේෂ සංකල්පයක් මත සාමාන්‍ය

ප්‍රජාව සඳහා භාෂා පුහුණුව ලබා දීම 2012 වර්ෂයේදී ආරම්භ කරන ලදී.මෙම පාඨමාලා පැය 150 ක කථන පාඨමාලාවක් වන අතර දීප ව්‍යාප්තව පවත්වනු ලැබේ.සාමාන්‍ය ප්‍රජාව සඳහා සිංහල සහ දෙමළ භාෂා දැනුම ලබා දීම තුළින් සමාජ ඒකාබද්ධතාව ගොඩ නැගීම මෙම පාඨමාලාව පැවැත්වීමේ අරමුණයි. 2014 වර්ෂයේදී මෙවැනි පංති 314 ආරම්භ කිරීමට සැලසුම් කරන ලද අතර ඒ සඳහා රු.18,840,000ක් වෙන් කරන ලදී.වර්ෂය පුරා පවත්වන ලද භාෂා සංගම් පංති පිළිබඳ විස්තර පහත පරිදි වේ.

2014 වර්ෂය තුල අනුමැතිය දුන් පංති

භාෂාව	පංති ගණන	සහභාගිවන්නන් ගණන
සිංහල	42	1260
දෙමළ	322	12660
එකතුව	**364**	**13920**

ඒ අනුව 2014 වර්ෂය තුළ පංති 364 මගින් සහභාගිවන්නන් 13920ට භාෂා පුහුණුව ලබා ගැනීමට ආයතනය විසින් අනුමැතිය දී ඇත.

2014 වර්ෂය තුල සම්පූර්ණ කරන ලද පංති

භාෂාව	පංති ගණන	සහභාගිවන්නන් ගණන
සිංහල	23	690
දෙමළ	157	4710
එකතුව	**180**	**5400**

ඉහත වගුව අනුව 2014 වර්ෂය තුළ පංති 180ක් හරහා පාඨමාලාලාභීන් 5400 දෙනෙකු භාෂා පුහුණුව ලබා ඇත. මෙයට 2012 හා 2013 වර්ෂවල ආරම්භ කරන ලද පාඨමාලා ද ඇතුලත් බව සඳහන් කල යුතුය.

2014 දෙසැම්බර් 31 දිනට ක්‍රියාත්මක වෙමින් පවතින පංති

භාෂාව	2012		2013		2014	
	පංති	සහභාගිවන්නන්	පංති	සහභාගිවන්නන්	පංති	සහභාගිවන්නන්
සිංහල			06	180	09	270
දෙමළ			126	3780	131	3930
එකතුව			132	3960	140	4200

ඒ අනුව 2014 වර්ෂය අවසාන වන විට පංති 272 ක් හරහා සහභාගිවන්නන් 8160 දෙනෙකු දීප ව්‍යාප්ත භාෂා පුහුණුව ලබමින් සිටිති.

2014 වර්ෂය තුල ආරම්භ කළ නමුත් නිසි පරිදි සම්පූර්ණ නොකළ පංති

භාෂාව	පංති ගණන	සහභාගිවන්නන් ගණන
සිංහල	08	240
දෙමළ	-	-
එකතුව	**08**	**240**

ඉහත වගුව අනුව 2014 වර්ෂය තුළ පංති 08ක් අක්‍රිය වී ඇති අතර මෙයට 2012 හා 2013 අනුමැතිය දුන් පංති ද ඇතුළත් බව සඳහන් කළ යුතුය. 2014 වර්ෂයේදී භාෂා සංගම් පංති සඳහා ආයතනය විසින් දරණ ලද සමස්ථ වියදම රු. 12,834,616.00 කි.

භාෂා සංගම් ජාතික ව්‍යාපාරය යටතේ සාමාන්‍ය ප්‍රජාව සඳහා ඉංග්‍රිසි භාෂාව ඉගැන්වීම සඳහා පංති 55ක් පැවැත්වීමට සැලසුම් කළ ද ඒ සඳහා ආයතනයට අවස්ථාවක් නොලැබුණි. ඉංග්‍රිසි ගුරු පුහුණු වැඩසටහන් 01ක් පමණක් පවත්වන ලද අතර එයට ගුරුවරුන් 36 දෙනෙකු සහභාගි වෙන ලදී.ඒ සඳහා වැයවූ මුදල රු. 75, 356.00 කි.

1.7 කැබිනට් මණ්ඩලය විසින් පත් කරන ලද කමිටුව මගින් නිර්දේශ කරන ලද නිර්දේශ ක්‍රියාත්මක කිරීමට නියමිත නව ක්‍රියාකාරකම්

මෙම ක්‍රියාකාරකම යටතේ මහනුවර දිස්ත්‍රික්කයේ නවක ග්‍රාම නිලධාරීන් 339 දෙනෙකු සඳහා දින 17ක දෙමළ භාෂා පාඨමාලාවක් 2014.12.06 2014.12.22 දින දක්වා මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදී පැවැත්වීමට කටයුතු යොදන ලදී. නමුත් ජනාධිපතිවරණය හේතු කොට ගෙන ග්‍රාම නිලධාරීන්ගේ සේවය අතවශ්‍ය වී ඇති බැවින් නැවත දැනුම් දෙන තෙක් වැඩසටහන කල් දැමීමට සිදු වන බව මහනුවර අතිරේක දිස්ත්‍රික්

ලේකම්ගේ 2014.11.25 දිනැති ලිපිය මගින් දැනුම් දී ඇත.

1.8 පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා සිංහල සහ දෙමළ භාෂා පාඨමාලා

ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය විසින් මහජන නියෝජිතයන් සඳහා ද භාෂා පුහුණුව ලබා දීමට කටයුතු කරනු ලබයි. භාෂාව ඉගැනීම තුලින් ජනතාව සමඟ පවතින සුහදතාව වර්ධනය කිරීම හා ඔවුන්ට වඩාත් කාර්යක්ෂම සේවාවක් සැපයීම මෙම වැඩසටහන පැවැත්වීමේ අරමුණයි. ඒ අනුව ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ ගරු මන්ත්‍රීවරුන් සඳහා පැය 108ක කරන සිංහල සහ දෙමළ භාෂා පාඨමාලා දෙකක් මෙම වර්ෂයේදීද ක්‍රියාත්මක කරන ලදී. පාඨමාලා දෙක පාර්ලිමේන්තු සැසිවාර පැවැත්වෙන දිනවලදී ක්‍රියාත්මක කරන ලද අතර සිංහල පාඨමාලාව සඳහා ගරු මන්ත්‍රීවරුන් 06 දෙනෙකුද දෙමළ පාඨමාලාව සඳහා මන්ත්‍රීවරුන් 16 දෙනෙකු ද සහභාගි වෙන ලදී.ඒ සඳහා රු. 87, 000ක මුදලක් වෙන් කරන ලද අතර මෙම වර්ෂය තුලදී රු.11,200ක් වැය වන ලදී.

1.9 ආයතනයේ කාර්ය මණ්ඩලය සඳහා පුහුණු හා ශක්‍යතා වැඩසටහන්

ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනයේ කාර්යය මණ්ඩලයෙහි ධාරිතාව ගොඩනැංවීම සඳහා ආයතනය විසින් විවිධ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි. ඒ සඳහා අවස්ථාව ලැබෙන පරිදි වෙනත් ආයතනවලට නිලධාරීන් යොමු කරන අතර ආයතනයේ මුලු කාර්යය මණ්ඩලය සඳහා එකවර එක් පුහුණු වැඩසටහනක් පවත්වන ලදී. මෙම පුහුණු වැඩසටහන් මගින් කාර්යය මණ්ඩලය සඳහා වෘත්තිය මඟ පෙන්වීමක් මෙන්ම පෞරුෂත්ව වර්ධනයට අවශ්‍ය අත්වැලක්ද ලබා දෙයි.මේ සඳහා 2014 වර්ෂය තුලදී රු.300,000ක් වෙන් කරන ලද අතර රු. 111,017.00 ක් වැය වන ලදී.

2. ආදායම් උපයන වැඩසටහන්

ආයතනය විසින් ඇතැම් පාඨමාලා සඳහා පාඨමාලාලාභීන්ගෙන් මුදල් අය කර ක්‍රියාත්මක කරනු ලබයි. මෙම පුහුණු වැඩසටහන් බහුතරයක් අගලවත්ත පුහුණු ආයතනයේදී පවත්වන අතර පාඨමාලාලභීන්ගෙන් ආහාර හා නේවාසික පහසුකම් සඳහා මුදල් අය කරනු ලැබේ.සම්පත්දායක දීමනා හා වෙනත් වියදම් ආයතනය විසින් දරණු ලබයි.

2.1 වෛද්‍යවරුන් සඳහා දෙමළ භාෂා පාඨමාලා

සිමාවාසික පුහුණුව ලබන වෛද්‍යවරුන් සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයේ ඉල්ලීම මත ආයතනය විසින් දින 11ක නේවාසික දෙවන භාෂා පුහුණු පාඨමාලා පවත්වනු ලබයි. මෙම පාඨමාලා සඳහා යන සියලුම වියදම් සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් දරණ අතර ජනතාවට වඩාත් සුහදශීලි හා කාර්යක්ෂම සේවාවක් ලබා දීම මෙම පාඨමාලාව පැවැත්වීමේ අරමුණයි. 2014 වර්ෂය තුළ මෙවැනි වැඩසටහන් 10ක් පැවැත්වීමට සැලසුම් කරන ලදී.

අනු අංකය	ස්ථානය	කාල සීමාව	සහභාගී සංඛ්‍යාව	වැය වූ මුදල
01	අගලවත්ත පුහුණු මධ්‍යස්ථානය	පෙබරවාරි 10 20	70	484,316.00
02	අගලවත්ත පුහුණු මධ්‍යස්ථානය	මාර්තු 31 අප්‍රේල් 10	87	654,343.00
03	අගලවත්ත පුහුණු මධ්‍යස්ථානය	අප්‍රේල් 21 මැයි 01	62	472,846.00
04	අගලවත්ත පුහුණු මධ්‍යස්ථානය	මැයි 02 12	56	406,736.00
05	අගලවත්ත පුහුණු මධ්‍යස්ථානය	මැයි 23 ජූනි 02	80	560,573.00
06	අගලවත්ත පුහුණු මධ්‍යස්ථානය	ජූනි 22 ජූලි 02	46	342,585.00
07	අගලවත්ත පුහුණු	අගොස්තු 0111	48	381,447.00

	මධ්‍යස්ථානය			
08	අගලවත්ත පුහුණු මධ්‍යස්ථානය	නොවැම්බර් 0212	20	303,733.00
	එකතුව		**469**	**3,606,579.00**

ඉහත වගුව අනුව වෛද්‍යවරුන් 469 දෙනෙකු පාඨමාලා 08ක් තුළින් දෙමළ භාෂා පුහුණුව ලබා ඇති අතර ඒ සඳහා වැය වී ඇති මුදල රු. 3, 606, 579.00කි.

2.2 ගුරු පුහුණු වැඩසටහන්

2014 වර්ෂය තුළ ආදායම් උපයන ගුරු පුහුණු වැඩසටහන් 05ක් පැවැත්වීමට සැලසුම් කරන ලද අතර පවත්වන ලද වැඩසටහන්වල විස්තර පහත පරිදි වේ.

අනු අංකය	ස්ථානය	කාල වකවානුව	සහභාගිවූ ගණන	වැය වූ මුදල
01	අගලවත්ත පුහුණු මධ්‍යස්ථානය	පෙබරවාරි 2226	66	205,967.00
02	අගලවත්ත පුහුණු මධ්‍යස්ථානය	මාර්තු 10 14	42	135, 016.00
03	අගලවත්ත පුහුණු මධ්‍යස්ථානය	මාර්තු 11 12 (පොලිස් නිලධාරීන් සඳහා)	39	46,289.00
04	අගලවත්ත පුහුණු මධ්‍යස්ථානය	ජූනි 0509	42	141,624.00
05	අගලවත්ත පුහුණු මධ්‍යස්ථානය	අගෝස්තු 1317	62	211,695.00
06	පළාත් මධ්‍යස්ථානය, කිලිනොච්චි	දෙසැම්බර් 1317	32	417,770.00
	එකතුව		**283**	**1,158,361.00**

ඒ අනුව 2014 වර්ෂය තුළ සිංහල හා දෙමළ ගුරු පුහුණු වැඩසටහන් 05 ක් තුළින් පාඨමාලාලාභීන් 251 දෙනෙකු පුහුණුව ලබා ඇත.ඒ සඳහා වැය වී ඇති මුදල රු. 740,591 .00කි.

2.3 මූලික භාෂා පරිවර්තන කුසලතා පාඨමාලා

ආයතනය විසින් අයදුම්කරුවන්ගෙන් ලද ඉල්ලුම්පත්‍ර සැලකිල්ලට ගෙන 2014 අගෝස්තු 22 සිට 31 දක්වා දින 10ක මූලික භාෂා පරිවර්තන පාඨමාලාවක් සංවිධානය කරන ලදී. නමුත් ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් පැමිණීම තහවුරු නොකරන ලද හෙයින් පාඨමාලාව නොපැවැත්වීමට තීරණය කරන ලදී.

- **පරිවර්තන අධ්‍යයනයන් පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව (පූර්ණ කාලීන)**

පරිවර්තන අධ්‍යයනයන් පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවේ විෂය නිර්දේශය නැවත අධ්‍යනය කිරීම මෙම වර්ෂයේදී ආරම්භ කරන ලද අතර එය අවසන් වන තුරු මෙම පාඨමාලාව ආරම්භ නොකරන ලදී.

- **පරිවර්තන අධ්‍යයනයන් පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව (අර්ධ කාලීන)**

පරිවර්තන අධ්‍යයනයන් පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවේ විෂය නිර්දේශය නැවත අධ්‍යනය කිරීම මෙම වර්ෂයේදි ආරම්භ කරන ලද අතර එය අවසන් වන තුරු මෙම පාඨමාලාව ආරම්භ නොකරන ලදී.

2.4 රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතන සඳහා කෙටි කාලීන පුහුණු වැඩසටහන්

රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතන සඳහා කෙටි කාලීන පුහුණු වැඩසටහන් 10 ක් පැවැත්වීමට 2014 වර්ෂය තුළදී සැලසුම් කරන ලදී. මෙම පාඨමාලා සඳහා යන වියදම ඒ ඒ ආයතන විසින් දරණ අතර ජනතාවට වඩාත් කාර්යක්ෂම සේවාවක් සැපයීම සඳහා රාජ්‍ය නිලධාරීන්ට භාෂා පුහුණුව ලබා දීම මෙම වැඩසටහනේ අරමුණයි. 2014 වර්ෂය තුළ පවත්වන වන ලද එවැනි වැඩසටහන් පිළිබඳ විස්තර පහත පරිදි වේ.

අනු අංකය	භාෂාව	ස්ථානය	කාල වකවානුව	සහභාගීත්ව ගණන	වැය මුදල
01	දෙමළ	හාලි ඇල ප්‍රාදේශිය ලේකම් කාර්යාලය	මැයි 1627	47	කෙයා ආයතනය
02	දෙමළ	අඹගමුව ප්‍රාදේශිය ලේකම් කාර්යාලය	මැයි 1728	40	කෙයා ආයතනය
03	දෙමළ	පන්විල ප්‍රාදේශිය ලේකම් කාර්යාලය	අගෝස්තු 1627	33	කෙයා ආයතනය
04	දෙමළ	ඌව පළාත් සභාව	දෙසැම්බර් 1527	45	155,467.00
		එකතුව		**165**	

2.5 විශේෂ ඉල්ලීම් මත පවත්වනු ලබන පාඨමාලා

ආයතනය විසින් එක් එක් ආයතන විසින් කරනු ලබන විශේෂ ඉල්ලීම් සැළකිල්ලට ගනිමින් ඔවුන් සඳහාද පාඨමාලා ක්‍රියාත්මක කරනු ලැබේ. ඒ අනුව 2014 වර්ෂය තුළදී ද සමාජ ඒකාබද්ධතා සතියට සමගාමීව එල්.ටී.ටී.ඊ පුනරුත්ථාපනලාභීන් සඳහා වැඩසටහන් දෙකක් ද ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍ය කාර්යාලයේ නිලධාරීන් සඳහා එක් වැඩසටහනක් ද ක්‍රියාත්මක කරන ලදී.ඒ පිළිබඳ විස්තර පහත දක්වේ.

අනු අංකය	භාෂාව	ස්ථානය	කාලය	සහභාගීත්වය	වැය
01	දෙමළ	අගලවත්ත (*අමාත්‍ය කාර්යය මණ්ඩලය සඳහා*)	ජනවාරි 07 16	25	182,591.00
02	සිංහල	පුනරුත්ථාපන කඳවුරපුන්තෝට්ටම්	ජුලි 10 24	41	121,056.00
03	සිංහල	පුනරුත්ථාපන කඳවුර, පුන්තෝට්ටම්	ජුලි 10 24	41	121,055.60
		එකතුව		**107**	**424,702.60**

3. ජාතික භාෂා ව්‍යාපෘතිය මගින් අරමුදල් සපයන ලද වැඩසටහන්

3.1 භාෂා සංගම් ජාතික ව්‍යාපාරය යටතේ ලියාපදිංචි භාෂා සංගම් අතර බෙදා හැරීම සඳහා සිංහල භාෂා පෙළ පොත සැකසීම

සිංහල භාෂා පෙළ පොත සැකසීමේ කාර්යයෙහි පහත සඳහන් සම්පත්දායකයන් 04 දෙනා නිරත වී සිටිති.

ලසිත් නලන්ත මහතා (රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව නියෝජනය කරමින්)

සුනිල් ආරියරත්න මහතා

ඒ.ආර්.එම් නිසාම් මහතා

එස්.රාහුලන් මහතා

2014 වර්ෂය තුළ සිංහල භාෂා පෙළ පොත සැකසීම සඳහා වැඩමුලු 06ක් පහත දිනයන්හිදි ක්‍රියාත්මක කරන ලදී.

ජූලි 31 අගෝස්තු 03 දක්වා

අගොස්තු 03සිට 17 දක්වා

සැප්තැම්බර් 12 සිට14 දක්වා

සැප්තැම්බර් 20 සිට24 දක්වා

ඔක්තෝබර් 11සිට15 දක්වා

දෙසැම්බර් 08සිට12 දක්වා

වර්ෂාවසානය වන විට එම කාර්යයෙහි කටයුතු 60%ක් පමණ නිම කරන ලද අතර 2015 වර්ෂය තුළ එය අවසන් කිරීමට නියමිතය.

3.2 රාජ්‍ය සේවකයන් හට සිංහල හා දෙමළ භාෂා ඉගෙනීම සඳහා පුහුණු මොඩියුල හා සංයුක්ත තැටි නිර්මාණය කිරීම

රාජ්‍ය සේවකයන් සඳහා දෙවන භාෂා පෙළ පොත් සැකසීම රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව මගින් සිදු කරනු ලබන අතර එය අවසන් වන තුරු පුහුණු මොඩියුල හා සංයුක්ත තැටි නිර්මාණය කිරීමට නොහැකිය.

3.3 රාජ්‍ය සේවකයන් හට ඉංග්‍රිසි භාෂාව ඉගෙනීම සඳහා ඇති විෂය නිර්දේශය නැවත අධ්‍යයන කිරීම

මෙම කාර්යය ඉටු කිරීම සඳහා සම්පත්දායකයෙකු ලෙස නොයෙල් ජයමාන්න මහතා (ව්‍යාපෘති අධ්‍යක්ෂ, ජනාධිපති විශේෂ බලකාය ජීවන කුසලතාවක් ලෙස ඉංග්‍රිසි) හඳුනාගත් අතර ඔහුගේ ජීව දත්ත පත්‍රිකාව අනුමැතිය සඳහා අධ්‍යයන මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලදී. ඒ සඳහා අධ්‍යයන මණ්ඩලයේ නිර්දේශය ලැබුණ ද කළමනාකරණ මණ්ඩලයේ උපදෙස් මත මෙම කාර්යය තාවකාලිකව අත් හැර දැමීමට සිදුවන ලදී.

3.4 කැබිනට් කමිටුවේ හා පර්යේෂණ නිර්දේශ මත දත්ත ගබඩා කිරීම සඳහා දත්ත පාදම සැකසීම

මෙම කාර්යයෙහි 90%ක් නිම කරන ලද අතර ජාතික භාෂා ව්‍යාපෘතිය මගින් ඒ සඳහා තාක්ෂණික සහයෝගය ද ලබා දෙන ලදී.දත්ත ගබඩා කිරීමෙන් අනතුරුව ආයතනයේ නිලධාරීන් ඒ සඳහා පුහුණු කිරීමට නියමිතය.

3.5 පරිවර්තන අධ්‍යයනයන් පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවේ නැවත අධ්‍යයන කිරීම

මේ සඳහා සම්පත්දායකයෙකු ලෙස මහාචාර්ය අසෝක ප්‍රේමරත්න මහතා (සම්බන්ධීකාරක, පරිවර්තන පාඨමාලා කැලණිය විශ්ව විද්‍යාලය) හඳුනා ගන්නා ලද අතර ඔහු සමග පැවති මූලික සාකාච්ඡාවලින් අනතුරුව ව්‍යාපෘති යෝජනාවලියක් ඉදිරිපත් කරන ලදී. එම ව්‍යාපෘති යෝජනාවලියට අනුව ප්‍රශ්නාවලියක් හරහා අවශ්‍යතා විශ්ලේෂණයක් සිදු කිරීමට නියමිත අතර එහි ඉදිරි කටයුතු 2015 වර්ෂයේදී සිදු කිරීමට නියමිතය.

2014 වියදම් සාරාංශය

අනු අංකය	ක්‍රියාකාරකම	සත්‍යය වියදම
01	රාජ්‍ය නිලධාරීන් සඳහා පවත්වන ලද අර්ධකාලීන පුහුණු පාඨමාලා	16,168,950.00
02	රාජ්‍ය නිලධාරීන් සඳහා දින 12 නේවාසික නොවන දෙවන භාෂා පුහුණු පාඨමාලා	6,650,464.50
03	දැයට කිරුළ ජාතික වැඩසටහනට සමගාමීව පවත්වන ලද දින 12 කෙටි කාලීන පුහුණු පාඨමාලා	2,297,858.00
04	රාජ්‍ය නිලධාරීන්ට හා සාමාන්‍ය ප්‍රජාවට ඉගැන්වීම සඳහා පවත්වන ලද ගුරු උපදේශකවරුන් පුහුණු කිරීමේ වැඩසටහන්	719,981.00
05	ගුරුවරුන් සඳහා පසු විපරම් වැඩසටහන්	621,663.00
06	සාමාන්‍ය ප්‍රජාව සඳහා භාෂා පුහුණු වැඩසටහන්	12,834,614.00
07	පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා සිංහල සහ දෙමළ භාෂා පාඨමාලා	11,200.00
08	ආයතනයේ කාර්ය මණ්ඩලය සඳහා පුහුණු හා ශක්‍යතා වැඩසටහන්	111,017.00
09	වෛද්‍යවරුන් සඳහා දෙමළ භාෂා පාඨමාලා	3,606,579.00
10	ගුරු පුහුණු වැඩසටහන්	1,158,361.00
11	රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතන සඳහා කෙටි කාලීන පුහුණු වැඩසටහන්	155,467.00
12	විශේෂ ඉල්ලීම් මත පවත්වනු ලබන පාඨමාලා	424,702.60
13	භාෂා සංගම් පරීක්ෂණය	335,232.00
14	පුස්තකාල පොත්	1,035.00
15	කාර්යාල උපකරණ මිලදී ගැනීම	990,565.00
16	දැයට කිරුළ ප්‍රදර්ශන භූමියේ වියදම්	373,308.00
	එකතුව	**46,460,997.10**

2014 වර්ෂය තුළ පවත්වන ලද පුහුණු වැඩසටහන්වල සාරාංශය

අනු අංකය	වැඩසටහන	භෞතික ප්‍රගතිය		
01	රාජ්‍ය නිලධාරීන් සඳහා අර්ධ කාලීන භාෂා පුහුණු පාඨමාලා	මට්ටම	පංති ගණන	සහභාගිවූවන් ගණන
		I මට්ටම සිංහල	01	47
		II මට්ටම සිංහල	35	1449
		III මට්ටම සිංහල	64	3266
		I මට්ටම දෙමළ	01	35
		II මට්ටම දෙමළ	163	5572
		III මට්ටම දෙමළ	513	23386
		එකතුව	**777**	**33775**
02	සාමාන්‍ය ප්‍රජාව සඳහා භාෂා පුහුණු පාඨමාලා	සිංහල	38	1140
		දෙමළ	414	12420
		එකතුව	**452**	**13560**
03	රාජ්‍ය නිලධාරීන් සඳහා දින 12 නේවාසික නොවන පාඨමාලා	වැඩසටහන් ගණන 35		2563
04	දැයට කිරුළ ජාතික වැඩසටහනට සමගාමීව දින 12 දෙවන භාෂා පුහුණු වැඩසටහන	වැඩසටහන් ගණන 17		977
05	ගුරු උපදේශකවරුන් පුහුණු කිරීමේ වැඩසටහන්	වැඩසටහන් ගණන 05		190
06	ගුරුවරුන් සඳහා පසු විපරම් වැඩසටහන්	වැඩසටහන් ගණන 09		796
07	පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා භාෂා පුහුණු පාඨමාලා	පංති 02		22
08	වෛද්‍යවරුන් සඳහා භාෂා පුහුණු පාඨමාලා	වැඩසටහන් ගණන 08		469
09	ගුරු පුහුණු වැඩසටහන්	වැඩසටහන් ගණන 06		283
10	රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතන සඳහා කෙටි කාලීන පුහුණු පාඨමාලා	වැඩසටහන් ගණන 04		165
11	විශේෂ ඉල්ලීම් මත පවත්වනු ලබන පුහුණු පාඨමාලා	වැඩසටහන් ගණන 03		107

07. ජාතික භාෂා ව්‍යාපෘතිය (NLP)

ජාතික භාෂා ව්‍යාපෘතිය (NLP)

හැඳින්වීම

ජාතික භාෂා ව්‍යාපෘතිය කැනඩා රජය හා ජාතික භාෂා සහ සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය විසින් නියෝජනය කරනු ලබන ශ්‍රී ලංකා රජය අතර ද්වි පාර්ශික ගිවිසමක් මත පදනම්ව ඇත.මහජනතාවට තමන් අභිමත භාෂාවෙන් සේවාවන් ලබා ගැනීම තහවුරු කිරීම සඳහා ජාතික භාෂා සහ සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශයට සහයෝගය ලබා දෙයි.

2014 වර්ෂයේ ජාතික භාෂා සහ සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය සහ එහි ආයතන සඳහා ලබා දුන් තාක්ෂණික සහයෝගය

ජාතික භාෂා සහ සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය

ජාතික භාෂා ව්‍යාපෘතිය මගින් අනුග්‍රහය ලබා දුන් ප්‍රධාන මූලාරම්භයක් ලෙස "භාෂා මග සැලසුම" හඳුන්වා දිය හැකිය.මෙම ක්‍රියාවලිය මුහුණුවර කිහිපයකින් සිදු කිරීමට අමාත්‍යාංශය සැලසුම් කර ඇති අතර ,එහි පළමු පියවර ලෙස අමාත්‍යාංශ සහ එහි අනුබද්ධ ආයතන වන රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව ,රාජ්‍ය භාෂා කොමිෂන් සභාව සහ ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු අයතනය සඳහා වන මග සැලසුම 2014 වර්ෂයේ අග භාගයේදී කැබිනට් අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට නියමිතය.මේ වන විට "භාෂා මග සැලසුම "සහ එහි වගකීම් රාමුව ඇතුළත් කෙටුම්පතක් නිර්මාණය කර ඇත.

අමාත්‍යාංශයේ ධාරිතා ගොඩ නැගීමේ ක්‍රියා කාරකම් අතරට භාෂා අංශය ,සැලසුම් අංශය ,සමාජ ඒකාබද්ධතා අංශය ,ජාතික ඒකාබද්ධතා ප්‍රවර්ධන සහකාර සහ සම්බන්ධීකාරකවරුන් ඇතුළුව රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව ,රාජ්‍ය භාෂා කොමිෂන් සභාව සහ ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු අයතන කාර්ය මණ්ඩලයට තම සේවා ස්ථානයේ ස්ත්‍රී පුරුෂ සමාජභාව මූල ප්‍රවාහකරණය කිරිම පිළිබඳ දැනුම්වත් බව ඇති කිරීමට ජාතික භාෂා සහ සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශයට සහාය වන ලදී.

තවද අමාත්‍යාංශය සඳහා පුහුණු කරුවන්ගේ කලාපීය සංචිතයක් ඇති කිරිම සඳහා අමාත්‍යාංශ නිලධාරින් 73(සිංහල හා දෙමළ) සඳහා පුහුණුකරුවන් පුහුණු කිරිමේ වැඩ සටහනක් පවත්වන ලදී.මෙයට අමතරව තෝරා ගන්නා ලද අමාත්‍යාංශ නිලධාරින් 30 ක් සඳහා සමාජ විද්‍යා පර්යේෂණ ක්‍රමවේදයන් පිළිබඳව සහතික පත්‍ර පාඨමාලවක් සහ භාෂා අංශයේ නිලධාරින්ට තොරතුරු තාක්ෂණ සහතික පත්‍ර පාඨමාලාවක් සඳහා ජාතික භාෂා ව්‍යාපෘතිය සහයෝගය ලබා දෙයි.මෙම වර්ෂයේ අත්කර ගත් සුවිශේෂි ජයග්‍රහනයක් වනුයේ "රාජ්‍ය ආයතන විසින් භාෂා සැලසුම් පිළියෙල කිරිම සඳහා මාර්ගෝපදේශ අත් පොත" පිටපත් 2800 ක් සංයුක්ත තැටි සමග මුද්‍රණය කොට දිවයිනේ රාජ්‍ය ආයතන අතර බෙදා හරින ලදි.මහජනයාට ගුණාත්මක සේවාවක් ලබාදීම සඳහා හඳුනාගත් ආදර්ශ ද්වි භාෂා සහන කවුළු 05 ක් බල ගැන්වීමට සහයෝගය ලබා දෙන ලදි.පළාත් මධ්‍යස්ථාන පිහිටු වීමටද ජාතික භාෂා සහ සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශයට සහාය ලබා දීමට නියමිතය.

රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව

ජාතික භාෂා ව්‍යාපෘතියේ තාක්ෂණික හා මූල්‍ය සහයෝගය හේතුවෙන් ගුණාත්මක භාෂා පරිවර්තන සේවා සැපයීම සඳහා වූ සිය ධාරිතාවය රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව ඉහළ නංවාගෙන තිබේ.මේ අනුව සහකාර කොමසාරිස් යටතේ ක්‍රියාත්මක වන භාෂා පරිවර්තන මධ්‍යස්ථානයක් ස්ථාපිත කර ඇති අතර ,මෙම භාෂා පරිවර්තන මධ්‍යස්ථාන සඳහා පත් කරන ලද නිලධාරින් පරිගණක භාවිතා කරගනිමින් පරිවර්තන සිදු කිරිම ආරම්භ කර ඇත.

පරිවර්තකයන් පුහුණු කිරිම සිංහල-දෙමළ,ඉංග්‍රිසි-දෙමළ සහ ඉංග්‍රිසි -සිංහල යන ධාරා තුන ඔස්සේ සිදු කරනු ලැබේ. රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව පාරිභාෂික ශබ්ද මාලා 14 ක් නිර්මාණය කිරිම ආරම්භ කර ඇති අතර ජාතික භාෂා ව්‍යාපෘතිය පාරිභාෂික ශබ්ද මාලා 02ක් නිර්මාණය සඳහා දායකත්වය ලබා දෙයි.තවද රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේවෙබ් අඩවිය යාවත් කාලීන කිරීම සඳහා ද ජාතික භාෂා ව්‍යාපෘතිය සහාය ලබා දෙයි.

රාජ්‍ය භාෂා කොමිෂන් සභාව

රාජ්‍ය භාෂා කොමිෂන් සභාව හොඳම ප්‍රදර්ශන කුටි ත්‍රිත්වය සඳහා ත්‍යාග පිළි ගැන්වීම ඇතුළුව , රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරිම පිළිබඳව 2014 දැයට කිරුළ ප්‍රදර්ශනයේදී රාජය ආයතන 403 ක පූර්ණ භාෂා විගණනයක් පැවැත්වීමට ජාතික භාෂා ව්‍යාපෘතිය සහාය ලබා දෙන ලදි.2013 දැයට කිරුළ භාෂා විගණනය අනුව රාජ්‍ය ආයතන වල රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරිම පිළිබඳව මනා ප්‍රගතියක් දැකිය හැකි විය.තවද රාජ්‍ය භාෂා කොමිෂන් සභාවේ පස් අවුරුදු ක්‍රියාකාරි සැලැස්ම ඇතුළත් ආයතන බල ගැන්වීම සඳහා වාර්තාවක් සකස් කර රාජ්‍ය භාෂා කොමිෂන් සභාවට ,අමාත්‍යතුමාට හා ලේකම්තුමියට ලබා දෙන ලදි.

උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිෂන් වාර්තාවේ නිර්දේශයක් වන රාජ්‍ය භාෂා කොමිෂන් සභාවේ ප්‍රාදේශීය නියෝජනය ක්‍රියාත්මක කිරිමට රාජ්‍ය භාෂා කොමිෂන් සභාවේ නෛතික විමර්ශනයක් සිදු කිරීමට ජාතික භාෂා ව්‍යාපෘතිය සහාය ලබා දෙයි.මෙය ආයතන බල ගැන්වීම වාර්තාවේ ද සඳහන් වේ.

ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු අයතනය

ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු අයතනය තම ආයතනයේ ධාරිතා වර්ධනය අඛණ්ඩව සිදු කරන ලදි. 2013 මාර්තු මස පවත්වන ලද යහ පාලනය කාර්ය සාධක සමාලෝචනය වැඩ සටහනේ සාකච්ඡා වූ කරුණු අනුව ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු අයතනය පනත සංශෝධනය සිදු කිරිමට අවශ්‍ය සහායෝගය සපයන ලදි.තවද ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු අයතනයේ දෙවන භාෂාවඉගනුම සහ ඉගැන්වීම පිළිබඳ සිදුකළ පර්යේෂණ අධ්‍යනය නිර්දේශයන්ට අනුව ආයතනයේ සියළු තොරතුරු අන්තර් ගත කල හැකි පරිදි දත්ත පද්ධතියක් නිර්මාණය හා වෙබ් අඩවිය යාවත් කාලීන කිරීමට ජාතික භාෂා ව්‍යාපෘතිය සහාය ලබා දෙන අතර සිංහල දෙමළ භාෂා ඉගැන්වීමේ විෂය මාලා සඳහා සම්පත් කට්ටල නිර්මාණයට අඛන්ඩව සහය ලබා දෙයි.

මහජන සහයෝගිතා අරමුදල -භාෂා මෙහෙයුම් මධ්‍යස්ථාන

2014 වසරේදී අමාත්‍යාංශය විසින් හදුනාගත් භාෂා මෙහෙයුම් මධ්‍යස්ථාන පහේ සාමාජිකයින්ගේ ධාරිතාවය ඉහළ නැංවීමට ජාතික භාෂා ව්‍යාපෘතිය, ජාතික භාෂා සහ සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය සමග සමීපව කටයුතු කරන ලදි.ඇහැලියගොඩ හා බදුල්ල භාෂා මෙහෙයුම් මධ්‍යස්ථාන සඳහා ප්‍රදානයන් ලබාදුන් අතර කිළිනොච්චි දිස්ත්‍රික්කයේ භාෂා මෙහෙයුම් මධ්‍යස්ථාන 02ක් ස්ථාපනය කිරීමට නියමිතය. බදුල්ල භාෂා මෙහෙයුම් මධ්‍යස්ථානය මගින් සිංහල බස කතා කරන හා දෙමළ බස කතා කරන ජන කොටස් අතර සුහදතාවය වර්ධන වැඩ සටහනක් ද ළමා නිවාසවල දරුවන් සඳහා වැඩ සටහනක් ද සිදු කරන ලදි.

සේවා සැපයුම සඳහා නව්‍ය ආදර්ශ

ප්‍රාදේශී සේවා සැපයුම සඳහා නව්‍ය ආදර්ශ ප්‍රවර්ධනය කිරීම පිළිබඳව පාර්ශවකාර ආයතන 14ක් සමග කටයුතු කරන අතර ආසියා පදනමේ සහාය ඇතුව ජාතික භාෂා ව්‍යාපෘතිය ඒ සඳහා අඛන්ඩ සහාය ලබා දෙයි. නවය ආදර්ශ ගොඩ නැගීමේ ක්‍රියාවලිය 2014 ජූලි මස සිට ක්‍රියාත්මක වෙයි. නවය ආදර්ශ ගොඩ නැගීම සඳහා අමාත්‍යාංශයේ ධාරිතාවන් විශ්ලේශනය කර පුහුණු අත් පොතක් නිර්මාණය මෙහි මූලික ක්‍රියාකාරකම් වේ.මෙම පුහුණු අත් පොත අමාත්‍යාංශය මගින් අනුමත වීමෙන් පසු ආසියා පදනම අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලයේ ධාරිතා වර්ධනය සඳහා පුහුණුකරුවන් පුහුණු කිරිමේ වැඩ සටහනක් පැවැත්වීමට නියමිතය.

උපාධි අපේක්ෂක භාෂා පරිවර්තක /භාෂණ පරිවර්තක වැඩ සටහනක් එක් හෝ වැඩි විශ්ව විද්‍යාලයන්හි ස්ථාපිත කිරීම

භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරිම වැඩි දියුණු කිරිම පිණිස ජාතික භාෂා සහ සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය දිගු කාලීනව සහාය දැක්වීමේ ක්‍රියා මාර්ගයක් ලෙස ,උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ සහ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සහයෝගයෙන් පරිවර්තනය පිළිබඳ ශාස්ත්‍රපති විශේෂ උපාධියක් සඳහා ආදර්ශ විෂය මාලාවක් සම්පාදනය කිරීමට යාපනය,කැළණිය සහ සබරගමුව විශ්ව විද්‍යාලයන්හි ශාස්ත්‍රඥයින් කණ්ඩායමකට ජාතික භාෂා ව්‍යාපෘතිය 2013 වසරේදී තාක්ෂණ සහයෝගය ලබා දෙන ලදි.885 වැනි විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා රැස්වීමේදී ශාස්ත්‍රපති විශේෂ උපාධි පාඨමාලාව අනුමත කරන ලද අතර එය 2014 දී යාපනය,කැළණිය සහ සබරගමුව විශ්ව විද්‍යාලයන් හි ආරම්භ කිරීමට නියමිතය. අදාළ විශ්ව විද්‍යාලයන් හී අධ්‍යන වර්ෂ 2014/2015 සිසුන් සඳහා අභියෝගතා පරීක්ෂණ පවත් වන ලද අතර ,සිසුන් 75 ක් සඳහා වූ උපාධි පාඨමාලාව වෙනුවෙන් අයදුම් කරුවන් 3500ක් අයදුම් පත් ලබා දෙන ලදි.

08. සමාජ ඒකාබද්ධතාවය සහ පරිවර්තන උදෙසා පහසුකරණය ව්‍යාපෘතිය(FLICT)

සමාජ ඒකාබද්ධතාවය සහ පරිවර්තන උදෙසා පහසුකරණය ව්‍යාපෘතිය(FLICT)

හැඳින්වීම

ජර්මානු රජයේ ආර්ථික සහයෝගිතා හා සංවර්ධන අමාත්‍යාංශය(BMZ) වෙනුවෙන් ජර්මානු සංවර්ධන සහයෝගිතා ආයතනය (GIZ), සමාජ ඒකාබද්ධතාවය සහ පරිවර්තන උදෙසා පහසුකරණය ව්‍යාපෘතිය(FLICT) මගින් ශ්‍රී ලංකාවේ ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය(MNLSI)හා එක්ව වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි. ව්‍යාපෘතියේ හවුල්කාර අමාත්‍යාංශය වශයෙන් ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය කටයුතු කරයි. රාජ්‍ය හා සිවිල් සමාජ සංවිධාන අතර, සමාජ ඒකාබද්ධතා ප්‍රතිපත්ති රාමුව ක්‍රියාත්මක කිරීමට හා පුරවැසි සහභාගීත්වය වැඩිදියුණු කිරීමට අවශ්‍ය සහයෝගය ලබාදෙමින්, FLICT ව්‍යාපෘතිය ශ්‍රී ලංකා රජයට සහාය දක්වයි.

ජාතික මට්ටමෙන්,පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය හා ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය සමග FLICT ව්‍යාපෘතිය කටයුතු කරනු ලබයි.

ප්‍රාදේශීය මට්ටමෙන් FLICT ව්‍යාපෘතිය, පළාත් සභා, දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල සහ ප්‍රාදේශීය සභා සමග සම්බන්ධීකරණයෙන් හා තෝරා ගන්නා ලද ප්‍රජා මූලික සංවිධාන සමග එක්ව අම්පාර, බදුල්ල, ගාල්ල, මුලතිව් සහ පුත්තලම යන නියමු දිස්ත්‍රික්ක 05 තුළ ඔවුන්ගේ ක්‍රියාකාරකම් ඉටු කරනු ලබයි.

2017 මාර්තු අගභාගයේදී අවසන් කිරීමට නියමිත FLICT ව්‍යාපෘතියේ නව සහ අවසන් අදියර 2014 ජනවාරි ආරම්භ කෙරිණි. මෙම අදියරෙහි අරමුණ වන්නේ “ රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන සමග එක්ව සමාජ ඒකාබද්ධතාවය සඳහා අදාල මූලිකාංග ප්‍රායෝගිකව ක්‍රියාවට නැංවීම තුලින් සමාජ ඒකාබද්ධතාවය ප්‍රවර්ධනය කිරීම”

මේ තුලින් අපේක්ෂිත ප්‍රතිඵල

- සමාජ ඒකාබද්ධතාවය පිළිබඳ දැනුම පුළුල් කිරීම
- සමාජ ඒකාබද්ධතාවය උදෙසා කටයුතු කරන රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනවල ශක්‍යතා වර්ධනය කිරීම
- ප්‍රාදේශීය අවශ්‍යතා මත පදනම්ව සමාජ ඒකාබද්ධතාවය ප්‍රවර්ධනය කිරීම උදෙසා නව ප්‍රවනතා ගොනු කිරීම හා ඒවා දිවයින පුරා ව්‍යාප්ත කිරීම

උක්ත අපේක්ෂිත ප්‍රතිඵල ලගා කරගැනීම සඳහා FLICT ආයතනය මූලික ක්ෂේත්‍ර හතරක් යටතේ ක්‍රියාත්මක වේ.

- සමාජ ඒකාබද්ධතාවය සඳහා ජාතික ප්‍රතිපත්ති රාමුව ජාතික හා දිස්ත්‍රික් මට්ටමින් ක්‍රියාවට නැංවීම
- සමාජ ඒකාබද්ධතාවය සඳහා ජාතික ප්‍රතිපත්ති රාමුව පළාත් පාලන හා ප්‍රජා මට්ටමෙන් ක්‍රියාවට නැංවීම
- සංස්කෘතික හා කලා කටයුතු මගින් සමාජ ඒකාබද්ධතාවය ප්‍රවර්ධනය කිරීම
- අධ්‍යයනය හා නව්‍යකරණය තුලින් ශක්‍යතා ප්‍රවර්ධනය කිරීම

09. නීතිය බලාත්මක කිරීම, යුක්ති දාමයට සම ප්‍රවේශය හා සමාජ ඒකාබද්ධතාවය ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය (SELAJSI)

නීතිය බලාත්මක කිරිම, යුක්ති දාමයට සම ප්‍රවේශය හා සමාජ ඒකාබද්ධතාවය ශක්තිමත් කිරිමේ ව්‍යාපෘතිය (SELAJSI)

හැදින්වීම

නීතිය බලාත්මක කිරීමත් යුක්ති දාමයට සමප්‍රවේශයත් සමාජ ඒකාබද්ධතාවත් ශක්තිමත් කිරීමපිළිබඳ ව්‍යාපෘතියට එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන විසින් ආධාර සපයයි. මෙම ව්‍යාපෘතිය ජාතික භාෂා සහ සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය, අධිකරණ අමාත්‍යාංශය, බන්ධනාගාර ප්‍රතිසංස්කරණ හා පුනරුත්ථාපන අමාත්‍යාංශය සහ ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යාංශය යන අමාත්‍යාංශ විසින් ජාතික වශයෙන් ක්‍රියාවට නංවයි.

නීතිය බලාත්මක කිරීමත් යුක්ති දාමයට සමප්‍රවේශයත් සමාජ ඒකාබද්ධතාවත් ශක්තිමත් කිරීම පිළිබඳ ව්‍යාපෘතිය ඇති වීමට පදනම් වූයේ මෙම ව්‍යාපෘතියට පෙර පැවති යුක්තිදාමයට සම ප්‍රවේශත්ව ව්‍යාපෘතියේ පළමු හා දෙවන අදියර මගින් ක්‍රියාත්මක කළ වැඩසටහන්වල අත්දැකීම්ය. යුක්ති දාමයට සම ප්‍රවේශත්ව ව්‍යාපාතිය මගින් නීති ආධාර, බන්ධනාගාර පරිපාලන සහ නෛතික ලේඛන සැපයීම ආදි කටයුතුවලදී ප්‍රාදේශීය මට්ටමේ ක්‍රියාවලි සහ යාන්ත්‍රණ වැඩිදියුණු කිරීමට පහසුකම් සලසන ලදී. එමගින් විධිමත් යාන්ත්‍රණයන් තුළින් අධිකරණ ක්ෂේත්‍රයේ අංශ අතර මනා සම්බන්ධීකරණ ප්‍රවේශයක් ගොඩනගන ලදී.

මෙම වැඩසටහන් තුළින් ලද ධනාත්මක ප්‍රතිඵල මගින් නීතිය බලාත්මක කිරීමත් යුක්ති දාමයට සම්ප්‍රවේශයත් සමාජ ඒකාබද්ධතාවත් ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය (SELAJSI) මගින් අධිකරණ ක්ෂේත්‍රයේ විධිමත් සහ සංවිධානාත්මක ක්‍රියාකාරීත්වය ගොඩනැගීම සඳහා කටයුතු කරයි. එමෙන්ම මෙම ව්‍යාපෘතිය, උගත් පාඩම් සහ ප්‍රතිසංධාන කොමිසමේ නිර්දේශ (LLRC), මානව හිමිකම් පිළිබඳව ජාතික ක්‍රියාකාරී සැලැස්ම (NHRAP) සහ සමාජ ඒකාබද්ධතා ජාතික ප්‍රතිපත්ති රාමුව (NPFSI) ක්‍රියාවට නැංවීම සඳහා රාජ්‍ය අංශයේ ධාරිතාවය ශක්තිමත් කිරීමටද කටයුතු කරයි.

නීතිය බලාත්මක කිරීමත් යුක්ති දාමයට සමප්‍රවේශයත් සමාජ ඒකාබද්ධතාවත් ශක්තිමත් කිරීම ව්‍යාපෘතිය මගින් සිදු කරනු ලබන මූලික ක්‍රියාකාරකම් දෙකකි. එනම්,

- සමාජ ඒකාබද්ධතාවය සහ ඒ ආශ්‍රිත ප්‍රතිපත්ති සැකසීම හා ඒවා ක්‍රියාවට නැංවීම සඳහා ජාතික මට්ටමේ (රාජ්‍ය මට්ටමේ) සහ සිවිල් සංවිධානවල ශක්‍යතාවය වැඩිදියුණු කිරීම.
- සමාජ ඒකාබද්ධතාවය සහ සංහිඳියාව වෙනුවෙන් ක්‍රියාත්මක වීම සඳහා සමාජය තුළ වෙනසක් සිදු කළ හැකි ආකාරයෙන් තරුණයන් සහ කාන්තාවන් දැනුවත් කිරීම.

ඉහතමූලික ක්‍රියාකාරකම් යටතේ පහත සඳහන් වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබේ.

- අමාත්‍යාංශය විසින් නොමිලේ නෛතික ලේඛන ලබා දීමේ සායනික වැඩසටහන්, පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ ලේඛන පරිවර්තනය කිරීම සඳහා මූල්‍ය පහසුකම් ලබා දීම
- ශ්‍රී ලංකා නීති ආධාර කොමිසම් සභාව සමග එක් වී කිලිනොච්චි, මුලතිව්, වවුනියා, මඩකලපුව යන දිස්ත්‍රිකකවල නොමිලේ නීති ආධාර වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. ඉදිරියේදී නුවර එළිය, බදුල්ල, රත්නපුර දිස්ත්‍රික්කයන්හි ක්‍රියාත්මක කිරීමට නියමිතය.
- කිලිනොච්චි පළාත් මධ්‍යස්ථානයේ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම තුළින් ශක්‍යතාවය ඉහළ නැංවීමට කටයුතු කිරීම.
- කොටස් 25කින් යුතු සමාජ ඒකාබද්ධතාවය සහ ජනවාර්ගික සුහදතාවය පිළිබඳව නාට්‍යයක් නිර්මාණය කිරීම.
- කුඩා ජන වාර්ගික කොටස් පිළිබඳ මුද්‍රිත දින දර්ශන (2014 වර්ෂයට) පාසල් අතර බෙදා දීම. (පුත්තලම, බදුල්ල, මොණරාගල, වවුනියාව) ඉන් ඇති වූ බලපෑම පිළිබඳ සමීක්ෂණය සිදු කිරීමට නියමිතය.
- ජාතික සමගියේ මහා සමුළුව වෙනුවෙන් චිත්‍ර සහ රචනා තරග පැවැත්වීම. මෙහිදී තරුණ ප්‍රජාව සමාජ ඒකාබද්ධතාවය ප්‍රවර්ධනය කිරීම සඳහා ස්වේච්ඡාවෙන් කටයුතු කිරීම.
- සමාජ ඒකාබද්ධතා සතිය තුළ වූ ක්‍රියාකාරකම් පිළිබඳ මාධ්‍ය හරහා මහජනතාව දැනුවත් කිරීමට කටයුතු කිරීම

- කාන්තා නායකත්වය සමාජ ඒකාබද්ධතාවය සඳහා සවිබල ගැන්වීම වෙනුවෙන් කිලිනොච්චි හා මොණරාගල යන දිස්ත්‍රික්ක දෙකෙහි කාන්තාවන් තිස්දෙනෙකු තෝරා ගෙන පුහුණු සැසි හා සවි බල ගැන්වීමට අදාළ කටයුතු සිදු කිරීම.

ඉදිරි වර්ෂවලදී අධිකරණ, සෞඛ්‍ය හා අධ්‍යාපන යන අංශවල භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වීම පිළිබඳ ඇගයීම් කිරීම. අනුරාධපුර, මඩකලපුව සහ රත්නපුර යන දිස්ත්‍රිකකයන්හි සබඳ පාසල් වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. සමාජ ඒකාබද්ධතාවය හා සංහිඳියාව ඇති කිරීමේ අරමුණින් තරුණ නියෝජිතයින් හා තරුණ නායකයින් ජාතික හා ප්‍රජා මට්ටමින් සහභාගී කරවා ගැනීමට කටයුතු කිරීම.

10. මුදල් වෙන්කිරීම්

ව්‍යාපෘති අනුව පුනරාවර්තන වියදම්

වියදම් ශීර්ෂ අංකය ■134 අමාත්‍යාංශයේ නම -ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය

වැඩ සටහන් අංකය හා නාමය ■01 මෙහෙයුම් වැඩසටහන්

■01 අමාත්‍ය කාර්යාලය

	අයවැය ඇස්තමේන්තු වෙන් කිරීම් (රුපියල්)	**පරිපූරක ප්‍රතිපාදන හා පරිපූරක ඇස්තමේන්තු වෙන් කිරීම්(රුපියල්)**	**මු.රෙ.66 සහ 69 අනුව මාරු කිරීම් පරිපූරක ප්‍රතිපාදන හා පරිපූරක ඇස්තමේන්තු වෙන් කිරීම්(රුපියල්)**	**මුළු ශුද්ධ වෙන්කිරීම්** (රුපියල්)	**මුළු වියදම** (රුපියල්)	**ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය /ඉක්මවීම්** (රුපියල්)
පුද්ගල පඩිනඩි	10,600,000	-	1,300,000	11,900,000	10,814,166	1,085,834
අනෙකුත් වියදම්	30,670,000	-	(1,100,000)	29,570,000	26,944,800	2,625,200
එකතුව	**41,270,000**	**-**	**200,000**	**41,470,000**	**37,758,966**	**3,711,034**

ව්‍යාපෘති අනුව මූලධන වියදම්

වියදම් ශීර්ෂ අංකය ■ 134 ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය

වැඩ සටහන් අංකය හා නාමය ■ 01 මෙහෙයුම් වැඩසටහන්

ව්‍යාපෘති අංකය හා නාමය ■ 01 අමාත්‍ය කාර්යාලය

වැය විෂය අංකය .	අයිතම් අංකය .		අයිතම් විස්තරය	(1) අයවැය ඇස්තමේන්තු වෙන් කිරීම් (රුපියල්)	(2) මු.රෙ.66 සහ 69 අනුව මාරු කිරීම් අයවැය ඇස්තමේන්තු වෙන් කිරීම්(රුපියල්)	(3) මුළු ශුද්ධ වෙන්කිරීම් (රුපියල්) (1+2)	(4) මුළු වියදම (රුපියල්)	(5) ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය /ඉක්මවීම් (3-4) (රුපියල්)
2001		11	ගොඩනැගිලි හා ඉදිකිරීම්	400,000	70,000.00	470,000	418,208	51,792
2002		11	යන්ත්‍ර හා යන්ත්‍ර උපකරණ	200,000	-	200,000	20,200	179,800
2003		11	වාහන හා පුනරුත්තාපනය හා වැඩිදියුණු කිරීම්	1,700,000	-	1,700,000	1,639,987	60,013
2102		11	ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ	2,300,000	1,100,000	3,400,000	3,400,000	-
2103		11	යන්ත්‍ර හා යන්ත්‍ර උපකරණ	4,600,000	(1,100,000)	3,500,000	2,150,708	1,349,292
			එකතුව	**9,200,000**	**70,000**	**9,270,000**	**7,629,103**	**1,640,897**

වැඩසටහන් අනුව පුනරාවර්තන වියදම්

වියදම් ශීර්ෂ අංකය ■ 134 ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය

වැඩසටහන්අංකයහානාම ■ 01 මෙහෙයුම් වැඩසටහන්

ව්‍යාපෘති අංකය හා නාමය ■ 02 පරිපාලන හා ආයතනික සේවා

ශුද්ධ

	අයවැය ඇස්තමේන්තු වෙන් කිරීම් (රුපියල්)	**පරිපූරක ප්‍රතිපාදන හා පරිපූරක ඇස්තමේන්තු වෙන් කිරීම්**(රුපියල්)	**මු.රෙ.66 සහ 69 අනුව මාරු කිරීම් පරිපූරක ප්‍රතිපාදන හා පරිපූරක ඇස්තමේන්තු වෙන් කිරීම්**(රුපියල්)	**මුළු ශුද්ධ වෙන්කිරීම්** (රුපියල්)	**මුළු වියදම** (රුපියල්)	**ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය /ඉක්මවීම්** (රුපියල්)
පුද්ගල පඩිනඩි	31,200,000	-	750,000	31,950,000	31,726,854	223,146
අනෙකුත් වියදම්	103,390,000	-	880,000	104,270,000	102,194,289	2,075,711
එකතුව	**134,590,000**	**-**	**1,630,000**	**136,220,000**	**133,921,143**	**2,298,857**

ව්‍යාපෘති අනුව මූලධන වියදම්

වියදම් ශීර්ෂ අංකය ■ 134 ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය

වැඩ සටහන් අංකය හා නාමය ■ 01 මෙහෙයුම් වැඩසටහන්

ව්‍යාපෘති අංකය හා නාමය ■ 02පරිපාලන හා ආයතනික සේවා

වැය ශීර්ෂය අංකය :	අයිතම් අංකය	මූල්‍යාධාරය (සංකේත අංකය)	අයිතම් විස්තරය	(1) අයවැය ඇස්තමේන්තු වෙන් කිරීම් (රුපියල්)	(2) මු.රෙ.66 සහ 69 අනුව මාරු කිරීම් අයවැය ඇස්තමේන්තු වෙන් කිරීම්(රුපියල්)	(3) මුළු ශුද්ධ වෙන්කිරීම් (රුපියල්) (1+2)	(4) මුළු වියදම (රුපියල්)	(5) ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය /ඉක්මවීම් (3-4) (රුපියල්)
2001		11	ගොඩනැගිලි හා ඉදිකිරීම්	500,000		500,000	449,264	50,736
2002		11	යන්ත්‍ර හා යන්ත්‍ර උපකරණ	500,000		500,000	331,930	168,070
2003		11	වාහන හා පුනරුප්තාපනය හා වැඩිදියුණු කිරීම්	1,500,000		1,500,000	1,456,734	43,266
2102		11	ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ	1,000,000	500,000	1,500,000	1,012,900	487,100
2103		11	යන්ත්‍ර හා යන්ත්‍ර උපකරණ	600,000		600,000	392,000	208,000
2401		11	පුහුණු කිරීම් හා හැකියා වර්ධනය	550,000		550,000	545,495	4,505
2201-1		11	රාජ්‍ය භාෂා කොමිසම	900,000		900,000	870,000	30,000
2201-2		11	ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය	40,000,000		40,000,000	40,000,000	-
			එකතුව	**45,550,000**	**500,000.00**	**46,050,000**	**45,058,323**	**991,677**

වැඩසටහන් අනුව පුනරාවර්තන වියදම්

වියදම් ශීර්ෂ අංකය ■ 134 ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය

වැඩ සටහන් අංකය හා නාමය ■ 02 සංවර්ධන ක්‍රියාකාරකම්

ව්‍යාපෘති අංකය හා නාමය ■ 03 ජනවාර්ගික කටයුතු සහ සමාජ ඒකාබද්ධතා

	අයවැය ඇස්තමේන්තු වෙන් කිරීම් (රුපියල්)	**පරිපූරක ප්‍රතිපාදන හා පරිපූරක ඇස්තමේන්තු වෙන් කිරීම්(රුපියල්)**	**මු.රෙ.66 සහ 69 අනුව මාරු කිරීම් පරිපූරක ප්‍රතිපාදන හා පරිපූරක ඇස්තමේන්තු වෙන් කිරීම්(රුපියල්)**	**මුළු ශුද්ධ වෙන්කිරීම් (රුපියල්)**	**මුළු වියදම (රුපියල්)**	**ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය /ඉක්මවීම් (රුපියල්)**
පුද්ගල පඩිනඩි	55,500,000	-	-	55,500,000	54,653,506	846,494
අනෙකුත් වියදම්	11,480,000	-	(2,700,000)	8,780,000	5,122,534	3,657,466
එකතුව	**66,980,000**	**-**	**(2,700,000)**	**64,280,000**	**59,776,040**	**4,503,960**

ව්‍යාපෘතිඅනුව මූලධන වියදම්
වියදම් ශීර්ෂ අංකය ▪ 134 ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය
වැඩ සටහන් අංකය හා නාමය ▪ 02සංවර්ධන ක්‍රියාකාරකම්
ව්‍යාපෘති අංකය හා නාමය ▪ 03) ජනවාර්ගික කටයුතු සහ සමාජ ඒකාබද්ධතා

වැය විෂය අංකය ..	අයිතම් අංකය	මූල්‍යකරණය (සංකේත අංකය)	අයිතම් විස්තරය	(1) අයවැය ඇස්තමේන්තු වෙන් කිරීම් (රුපියල්)	(2) මු.රෙ.66 සහ 69 අනුව මාරු කිරීම් අයවැය ඇස්තමේන්තු වෙන් කිරීම්(රුපියල්)	(3) මුළු ශුද්ධ වෙන්කිරීම් (රුපියල්) (1+2)	(4) මුළු වියදම (රුපියල්)	(5) ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය /ඉක්මවීම් (3-4) (රුපියල්)
2,001		11	ගොඩනැගිලි හා ඉදිකිරීම්	150,000	-	150,000	72,384	77,616
2002		11	යන්ත්‍ර හා යන්ත්‍ර උපකරණ	300,000	-	300,000	201,500	98,500
2003		11	වාහන හා පුනරුප්තාපනය හා වැඩිදියුණු කිරීම්	750,000	-	750,000	286,943	463,057
2102		11	ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ	1,100,000	300,000	1,400,000	1,297,580	102,420
2103		11	යන්ත්‍ර හා යන්ත්‍ර උපකරණ	500,000	-	500,000	382,480	117,520
2401		11	පුහුණු කිරීම් හා හැකියා වර්ධනය	800,000	-	800,000	522,913	277,087
2502-1		11	ජාතික භාෂා	5,000,000	-	5,000,000	3,511,943	1,488,057
2502-2		11	සමාජ ඒකාබද්ධතා	12,000,000	235,000	12,235,000	11,745,103	489,897
2502-3		11	ත්‍රිභාෂා	20,000,000	-	20,000,000	13,764,361	6,235,639
2502-4		11	දැයට කිරුළ	4,000,000	-	4,000,000	3,483,907	516,093
2502-5		11	පර්යේෂණ ක්‍රියාකරකම්	800,000	300,000	1,100,000	796,447	303,553
2502-6		13	GOSL)UNDP	100,000,000	-	100,000,000	38,963,838	61,036,162
2502-6		17	GOSL)UNDP) Vat	100,000	-	100,000	100,000	-
2502-9		11	ද්වි භාෂා ජනතා ක්‍රියාකාරිත්වය	30,000,000	(535,000)	29,465,000	24,108,334	5,356,666
			එකතුව (වැඩ සටහන 03)	**175,500,000**	**300,000**	**175,800,000**	**99,237,732**	**76,562,268**

පුනරාවර්තන වියදමේ මුළු ශුද්ධ ප්‍රතිපාදන හා සත්‍ය වියදම අතර විචලතා පැහැදිලි කිරිම

(ඩී.ජී.එස්.ඒ * 4 හි 5 තීරුවටයොමුගතවේ.)

අමාත්‍යාංශය ■ ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය වියදම් ශීර්ෂ අංකය 134

වැඩසටහන් අංකය	**ව්‍යාපෘති අංකය**	**උප ව්‍යාපෘති අංකය**	**වැය විෂය අංකය**	**මූල්‍යකරණය (සංකේත අංකය)**	**පුනරාවර්තන වියදම් වල විස්තරය**	**වෙනස ඉතිරිකිරීම් හා (ඉක්මවීම්)**	**ඉතිරිවීම් ප්‍රතිශතය %**	**පැහැදිලි කිරීම්**
1	1	0	1001	11	වැටුප් හා වේතන	332,804	5%	-
1	1	0	1002	11	අතිකාල හා නිවාඩු දින වැටුප්	395,364	21%	වියදම් පාලනය කිරීම.
1	1	0	1003	11	වෙනත් දීමනා	357,666	9%	අපේක්ෂිත වියදම් සිදුනොවීම.
1	1	0	1101	11	දේශීය ගමන් වියදම්	83,188	10%	වියදම් පාලනය කිරීම.
1	1	0	1102	11	විදේශීය ගමන් වියදම්	2,643	0%	-
1	1	0	1201	11	ලිපි ද්‍රව්‍ය හා කාර්යාල උපකරණ	17,655	3%	-
1	1	0	1202	11	ඉන්ධන	1,339,480	15%	වියදම් පාලනය කිරීම.
1	1	0	1203	11	ආහාරපාන හා නිල ඇඳුම්	342,662	42%	අපේක්ෂිත වියදම් සිදුනොවීම.
1	1	0	1301	11	වාහන නඩත්තුව	23,092	1%	-
1	1	0	1302	11	යන්ත්‍රෝපකරණ නඩත්තු	14,842	7%	-
1	1	0	1303	11	ගොඩනැගිළි හා ඉදිකිරීම් නඩත්තු	123,634	49%	අපේක්ෂිත වියදම් සිදුනොවීම.
1	1	0	1401	11	ප්‍රවාහන	301,109	4%	-
1	1	0	1402	11	තැපැල් හා සන්නිවේදන	162,479	11%	වියදම් පාලනය කිරීම.
1	1	0	1403	11	විදුලිය හා ජලය	52,076	52%	වියදම් පාලනය කිරීම.
1	1	0	1405	11	වෙනත් වියදම්	62,340	3%	-
1	1	0	1508	11	වෙනත්	100,000	100%	අපේක්ෂිත වියදම් සිදුනොවීම.
					එකතුව	**3,711,033**		

අමාත්‍යාංශය ■ ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය

වියදම් ශීර්ෂ අංකය 134

වැඩ සටහන් අංකය	ව්‍යාපෘති අංකය	උප ව්‍යාපෘති අංකය	වැය විෂය අංකය	මූල්‍යකරණය (සංකේත අංකය)	පුනරාවර්තන වියදම් වල විස්තරය	වෙනස ඉතිරිකිරීම් හා (ඉක්මවීම්) රු	ඉතිරිවීම් ප්‍රතිශතය %	පැහැදිලි කිරීම්
1	2	0	1001	11	වැටුප් හා වේතන	130,285	1%	-
1	2	0	1002	11	අතිකාල හා නිවාඩු දින වැටුප්	770	0%	-
1	2	0	1003	11	වෙනත් දීමනා	92,091	1%	-
1	2	0	1101	11	දේශීය ගමන් වියදම්	19,862	12%	වියදම් පාලනය කිරීම.
1	2	0	1102	11	විදේශීය ගමන් වියදම්	175,757	98%	නිලධාරීන් සඳහා විදේශීය ගමන් ලැබී නොමැත.
1	2	0	1201	11	ලිපි ද්‍රව්‍ය හා කාර්යාල උපකරණ	343,506	10%	අනියම් ඉතිරිවීමකි
1	2	0	1202	11	ඉන්ධන	70,547	2%	-
1	2	0	1203	11	ආහාරපාන හා නිල ඇඳුම්	11,177	7%	අපේක්ෂිත වියදම් සිදුනොවීම.
1	2	0	1301	11	වාහන නඩත්තුව	38,221	1%	-
1	2	0	1302	11	යන්ත්‍රෝපකරණ නඩත්තු	11,289	2%	-
1	2	0	1303	11	ගොඩනැගිළි හා ඉදිකිරීම් නඩත්තු	35,117	35%	පේක්ෂිත වියදම් සිදුනොවීම.
1	2	0	1401	11	ප්‍රවාහන	52,465	2%	-
1	2	0	1402	11	තැපැල් හා සන්නිවේදන	512,967	24%	අපේක්ෂිත වියදම් සිදුනොවීම.
1	2	0	1403	11	විදුලිය හා ජලය	91,108	2%	-
1	2	0	1404	11	බදු කුලී හා පලාත් පාලන ආයතන බදු	104,220	0%	-
1	2	0	1405	11	වෙනත් වියදම්	357,520	7%	වියදම් පාලනය කිරීම.
1	2	0	1506	11	රාජ්‍ය සේවකයින් සඳහා දේපල ණය පොලී	51,255	9%	අනියම් ඉතිරිවීමකි
1	2	0	1508	11	වෙනත් මාරුකිරීම්	100,000	100%	අපේක්ෂිත වියදම් සිදුනොවීම.
					එකතුව	**2,198,157**		

අමාත්‍යාංශය ■ ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය

වියදම් ශීර්ෂ අංකය 134

වැඩ සටහන් අංකය	ව්‍යාපෘති අංකය	උප ව්‍යාපෘති අංකය	වැය විෂය අංකය	මූල්‍යකරණය (සංකේත අංකය)	පුනරාවර්තන වියදම් වල විස්තරය	වෙනස ඉතිරිකිරීම් හා (ඉක්මවීම්) රු	ඉතිරිවීම් ප්‍රතිශතය %	පැහැදිලි කිරීම්
2	3	0	1001	11	වැටුප් හා වේතන	660,180	2%	-
2	3	0	1002	11	අතිකාල හා නිවාඩු දින වැටුප්	124,154	21%	වියදම් පාලනය කිරීම.
2	3	0	1003	11	වෙනත් දීමනා	62,160	0%	-
2	3	0	1101	11	දේශීය ගමන් වියදම්	640,737	29%	වියදම් පාලනය කිරීම.
2	3	0	1102	11	විදේශීය ගමන් වියදම්	400,000	100%	නිලධාරීන් සඳහා විදේශීය ගමන් ලැබී නොමැත.
2	3	0	1201	11	ලිපි ද්‍රව්‍ය හා කාර්යාල උපකරණ	174,916	13%	අනියම් ඉතිරිවීමකි.
2	3	0	1202	11	ඉන්ධන	726,138	73%	වියදම් පාලනය කිරීම.
2	3	0	1203	11	ආහාරපාන හා නිල ඇඳුම්	19,423	24%	අපේක්ෂිත වියදම් සිදුනොවීම.
2	3	0	1301	11	වාහන නඩත්තුව	30,246	30%	අනියම් ඉතිරිවීමකි.
2	3	0	1302	11	යන්ත්‍රෝපකරණ නඩත්තු	2,120	1%	-
2	3	0	1303	11	ගොඩනැගිළි හා ඉදිකිරීම් නඩත්තු	107,048	43%	අපේක්ෂිත වියදම් සිදුනොවීම.
2	3	0	1401	11	ප්‍රවාහන	151,950	76%	අපේක්ෂිත වියදම් සිදුනොවීම.
2	3	0	1402	11	තැපැල් හා සන්නිවේදන	83,423	10%	වියදම් පාලනය කිරීම.
2	3	0	1403	11	විදුලිය හා ජලය	-	0%	-
2	3	0	1405	11	වෙනත් වියදම්	719,584	53%	අපේක්ෂිත වියදම් සිදුනොවීම.
2	3	0	1506	11	රාජ්‍ය සේවකයින් සඳහා දේපල ණය පොලී	16,414	5%	-
					එකතුව	**3,918,493**		

මූලධන වියදමේ මුළු ශුද්ධ ප්‍රතිපාදන හා සත්‍ය වියදම අතර විචලතා පැහැදිලි කිරීම

(ඩී.ජී.එස්.ඒ *4 හි 5 තීරුවට යොමුගත වේ.)

අමාත්‍යාංශය/වියදම් ශීර්ෂ අංකය ■134 ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය

වැඩසටහන් අංකය	ව්‍යාපෘති අංකය	උප ව්‍යාපෘති අංකය	වැය විෂය අංකය	මූල්‍යකරණය (සංකේත අංකය)	මූලධන වියදම්වල විස්තර	වෙනස ඉතිරි කිරීම් හා (ඉක්මවීම) රු.	ඉතිරිවීම් ප්‍රතිශතය %	පැහැදිලි කිරීම්
1	1	0	2001	11	ගොඩනැගිලි හා ඉදිකිරීම්	51,792	11%	අනියම් ඉතිරිවීමකි.
1	1	0	2002	11	යන්ත්‍ර හා යන්ත්‍ර උපකරණ	179,800	90%	අනියම් ඉතිරිවීමකි.
1	1	0	2003	11	වාහන හා පුනරුප්තාපනය හා වැඩිදියුණු කිරීම්	60,013	4%	-
1	1	0	2102	11	ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ	-	0%	-
1	1	0	2103	11	යන්ත්‍ර හා යන්ත්‍ර උපකරණ	1,349,292	39%	අනියම් ඉතිරිවීමකි.
					එකතුව	**1,640,897**		

අමාත්‍යාංශය/වියදම් ශීර්ෂ අංකය ■134 ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය

වැඩසටහන් අංකය	ව්‍යාපෘති අංකය	උප ව්‍යාපෘති අංකය	වැය විෂය අංකය	මූල්‍යකරණය (සංකේත අංකය)	මූලධන වියදම්වල විස්තර	වෙනස ඉතිරි කිරීම් හා (ඉක්මවීම) රු.	ඉතිරිවීම් ප්‍රතිශතය %	පැහැදිලි කිරීම්
1	2	0	2001	11	ගොඩනැගිලි හා ඉදිකිරීම්	50,736	10%	අනියම් ඉතිරිවීමකි
1	2	0	2002	11	යන්ත්‍ර හා යන්ත්‍ර උපකරණ	168,070	34%	අනියම් ඉතිරිවීමකි
1	2	0	2003	11	වාහන හා පුනරුප්තාපනය හා වැඩිදියුණු කිරීම්	43,266	3%	-
1	2	0	2102	11	ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ	487,100	32%	අපේක්ෂිත වියදම් සිදුනොවීම.
1	2	0	2103	11	යන්ත්‍ර හා යන්ත්‍ර උපකරණ	208,000	35%	අපේක්ෂිත වියදම් සිදුනොවීම.
1	2	0	2401	11	පුහුණු කිරීම් හා හැකියා වර්ධනය	4,505	1%	-
1	2	0	2502	13	රාජ්‍ය භාෂා කොමිසම			අනියම් ඉතිරිවීමකි
					එකතුව	**961,677**		

වැඩ සටහන් අංකය	ව්‍යාපෘති අංකය	උප ව්‍යාපෘති අංකය	වැය විෂය අංකය	මූල්‍යකරණය (සංකේත අංකය)	මූලධන වියදම්වල විස්තර	වෙනස ඉතිරි කිරීම් හා (ඉක්මවීම) රු.	ඉතිරිවීම් ප්‍රතිශතය %	පැහැදිලි කිරීම්
2	3	0	2001	11	ගොඩනැගිලි හා ඉදිකිරීම්	77,616	52%	අපේක්ෂිත වියදම් සිදුනොවීම.
2	3	0	2002	11	යන්ත්‍ර හා යන්ත්‍ර උපකරණ	98,500	33%	අපේක්ෂිත වියදම් සිදුනොවීම.
2	3	0	2003	11	වාහන හා පුනරුප්තාපනය හා වැඩිදියුණු කිරීම්	463,057	62%	අපේක්ෂිත වියදම් සිදුනොවීම.
2	3	0	2102	11	ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ	102,420	7%	අනියම් ඉතිරිවීමකි
2	3	0	2103	11	යන්ත්‍ර හා යන්ත්‍ර උපකරණ	117,520	24%	අපේක්ෂිත වියදම් සිදුනොවීම.
2	3	0	2401	11	පුහුණු කිරීම් හා හැකියා වර්ධනය	277,087	35%	අපේක්ෂිත වියදම් සිදුනොවීම.
					ගොඩනැගිලි හා ඉදිකිරීම්			
					එකතුව	**1,136,200**		

11. අත්තිකාරම් ගිණුම

අත්තිකාරම් ගිණුම්වල නියමිත සීමාවන්ට එදිරිව සත්‍ය අගයන්

2014.12.31 දිනට අත්තිකාරම් ගිණුමේ ක්‍රියාකාරිත්වය පහත පරිදි වේ.

01.	උපරිම වියදම් සීමාව	රුපි.	14,000,000.00
	සත්‍ය වියදම	රුපි.	5,346,585.15
02.	උපරිම ලැබීම් සීමාව	රුපි.	4,000,000.00
	සත්‍ය ලැබීම	රුපි.	9,203,283.00
03.	උපරිම හර සීමාව	රුපි.	58,000,000.00
	ඉතිරිය	රුපි.	22,962,200.68

12. සමාලෝචනය

සමස්ථයක් ලෙස ගෙන බලන විට අමාත්‍යාංශයේ අපේක්ෂාවන් ඉටු කරගැනීම සඳහා නිලධාරීන් දැඩි කැපවීමකින් යුතුව ක්‍රියා කොට ඇති බව සඳහන් කරනුයේ සතුටිනි.එමෙන්ම ගරු අමාත්‍ය වාසුදේව නානායක්කාර මැතිතුමා විසින් ලබා දෙන ලද උපදෙස් සහ මග පෙන්වීම බෙහෙවින් අගය කරමි. අමාත්‍යාංශ කාර්ය මණ්ඩලය, අමාත්‍යාංශයට අනුබද්ධ ආයතන හා ව්‍යාපෘති වල නිලධාරීන් වසර පුරාම මා වෙත ලබාදුන් සහාය ද මෙහිදී සිහිපත් කරනුයේ ස්තූති පූර්වකය.

ජේ.දඩල්ලගේ

ලේකම්

රාජ්‍ය පරිපාලන,පළාත් පාලන හා

ප්‍රජාතාන්ත්‍රීය පාලනය පිළිබඳ අමාත්‍යාංශය